


අ.පො.ස (උ.පෙළ) විභාගය - 2017

ඇගයීම් වාර්තාව

21 - ආර්ථික විද්‍යාව




පර්යේෂණ හා සංවර්ධන ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව.

සියලු ම හිමිකම් ඇවිරිණි.

අ.පො.ස.(උ.පෙළ) විභාගය - 2017

ඇගයීම් වාර්තාව

21 - ආර්ථික විද්‍යාව



පර්යේෂණ හා සංවර්ධන ශාඛාව
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව.

හැඳින්වීම

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය, ශ්‍රී ලංකාවේ ජ්‍යෙෂ්ඨ ද්විතීයික අධ්‍යාපනයේ අවසාන සහතිකකරණ විභාගයයි. ජ්‍යෙෂ්ඨ ද්විතීයික අධ්‍යාපනය අවසානයේ සිසුන්ගේ සාධන මට්ටම සහතික කිරීම මෙම විභාගයේ ප්‍රධාන අරමුණ වුව ද ජාතික විශ්ව විද්‍යාලවලට, වෙනත් උසස් අධ්‍යාපන හා වෘත්තීය පුහුණු ආයතනවලට මෙන් ම ජාතික අධ්‍යාපන විද්‍යා පීඨවලට සුදුස්සන් තෝරා ගැනීම ද මෙම විභාගයේ ප්‍රතිඵල මත සිදු කෙරෙන බැවින් සාධන පරීක්ෂණයක් වශයෙන් මෙන්ම තේරීමේ පරීක්ෂණයක් වශයෙන් ද අ.පොෂ.(උ.පෙළ) විභාගය, ඉතා වැදගත් තත්ත්වයක් උසුලයි. එමෙන්ම තෘතීයික මට්ටමේ රැකියා සඳහා ද ප්‍රවේශ සුදුසුකම් සහතික කෙරෙන විභාගයක් වශයෙන් මෙය පිළිගැනේ. 2017 වර්ෂයේ දී මෙම විභාගය සඳහා 206630 ක් පාසල් අයදුම්කරුවෝ ද 46700 ක් පෞද්ගලික අයදුම්කරුවෝ ද පෙනී සිටියහ.

මෙම විභාගයෙන් උසස් සාධන මට්ටමක් ලබා ගැනීම සඳහා සිසුහු ද ඔවුන්ගේ එම අපේක්ෂා සපුරාලීම සඳහා ගුරුවරු හා දෙමව්පියෝ ද දැඩි වෙහෙසක් දරති. මෙම ඇගයීම් වාර්තාව සකස්කර ඇත්තේ ඔවුන්ගේ එම අපේක්ෂා ඉටුකරගැනීම පිණිස ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සහාය දීමක් වශයෙනි. මෙම ඇගයීම් වාර්තාවේ ඇතුළත් තොරතුරු විභාග අපේක්ෂකයින්ට, ගුරු භවතුන්ට, විදුහල්පතිවරුන්ට, ගුරු උපදේශක මහත්ම මහත්මීන්ට, විෂයභාර අධ්‍යක්ෂවරුන්ට, දෙගුරුන්ට හා අධ්‍යාපන පර්යේෂකයින්ට එක සේ ප්‍රයෝජනවත් වනු නො අනුමාන ය. එබැවින් මෙම වාර්තාව වැඩි පිරිසකගේ පරිශීලනය සඳහා යොමු කිරීම වඩාත් සුදුසු වේ.

මෙම ඇගයීම් වාර්තාව, I, II හා III යනුවෙන් කොටස් තුනකින් සමන්විත වේ.

අ.පොෂ.(උ.පෙළ) ආර්ථික විද්‍යාව විෂයයෙහි විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු මෙම වාර්තාවේ I කොටසෙහි අඩංගු වේ. ඒ යටතේ විෂයය සඳහා පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව, ඔවුන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය, දිස්ත්‍රික් මට්ටමින් පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය, පන්ති ප්‍රාන්තර අනුව ලකුණු ව්‍යාප්තිය යන විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු ද ආර්ථික විද්‍යාව විෂයයේ I හා II පත්‍රවල ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය, එම ප්‍රශ්නවලට හා එම එක් එක් ප්‍රශ්නයෙහි කොටස්වලට ලකුණු ලබාගෙන ඇති ආකාරය සවිස්තරාත්මකව දැක්වෙන විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණයක් ද අන්තර්ගත වේ. අ.පොෂ.(උ.පෙළ) 2017 විභාගයේ ආර්ථික විද්‍යාව විෂයයෙහි I හා II ප්‍රශ්න පත්‍රවල ප්‍රශ්න හා එම ප්‍රශ්නවලට අයදුම්කරුවන් පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු මෙම වාර්තාවේ II කොටසෙහි අඩංගු වෙයි. ඒ යටතේ I හා II ප්‍රශ්න පත්‍රවල ප්‍රශ්න සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා සංවර්ධනාත්මක යෝජනා අන්තර්ගත වේ.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ පර්යේෂණ හා සංවර්ධන ශාඛාව මගින් උත්තර පත්‍ර ඇගයීමේ නිරත වූ ප්‍රධාන, අතිරේක ප්‍රධාන හා සහකාර පරීක්ෂකවරුන් විසින් ඉදිරිපත් කරනු ලබන තොරතුරු, නිරීක්ෂණ, අදහස් හා යෝජනා ද සම්භාව්‍ය පරීක්ෂණ න්‍යාය (Classical Test Theory) හා අයිතම ප්‍රතිචාර න්‍යාය (Item Response Theory) යොදාගනිමින් අයදුම්කරුවන්ගේ ප්‍රතිචාර විශ්ලේෂණය මගින් ලබාගත් තොරතුරු ද මෙම ඇගයීම් වාර්තාව සකස් කිරීම සඳහා පදනම් කරගෙන ඇත.

ප්‍රශ්න පත්‍රවල එක් එක් ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයන් සැලකිලිමත් විය යුතු කරුණු ද ඉගෙනුම් ඉගැන්වීම් කාර්යය පිළිබඳ අදහස් හා යෝජනා ද මෙම වාර්තාවෙහි III කොටසෙහි ඇතුළත් කර ඇත. විවිධ නිපුණතා හා එම නිපුණතා මට්ටම්වලට ළඟාවීම සඳහා ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කරගත යුතු ආකාරය පිළිබඳ ව මෙයින් මහත් පිටිවහලක් ලැබෙනු ඇතැයි සිතමි.

ඉදිරියේ දී සම්පාදනය කරනු ලබන ඇගයීම් වාර්තාවල ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම සඳහා ඵලදායී අදහස් හා යෝජනා අප වෙත යොමුකරන ලෙස කාරුණික ව ඉල්ලමි.

මෙම වාර්තාව සැකසීම සඳහා අවශ්‍ය තොරතුරු සැපයූ ප්‍රධාන, අතිරේක ප්‍රධාන පරීක්ෂකවරුන්ට හා සහකාර පරීක්ෂකවරුන්ටත්, උනන්දුවෙන් හා සක්‍රීයව දායක වූ සැකසුම් කමිටු සාමාජිකයින්ටත්, වගකීමෙන් කටයුතු කළ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට හා කාර්ය මණ්ඩලයටත් මාගේ හෘදයාංගම ස්තුතිය පළ කරමි.

බී. සනත් පූජිත
විභාග කොමසාරිස් ජනරාල්

2020 මැයි 14
පර්යේෂණ හා සංවර්ධන ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත,
බත්තරමුල්ල.

උපදේශකත්වය	:	බී. සනත් පූජිත විභාග කොමසාරිස් ජනරාල්
මෙහෙයවීම හා සංවිධානය	:	ගයාත්‍රි අබේගුණසේකර විභාග කොමසාරිස් (පර්යේෂණ/ සංවර්ධන හා ඇගයීම්)
සම්බන්ධීකරණය	:	එස්. ප්‍රනවදාසන් නියෝජ්‍ය විභාග කොමසාරිස්
විෂය සම්බන්ධීකරණය	:	ඩී. ආර්. එන්. කේ. ගමගේ සහකාර විභාග කොමසාරිස් පී. වී. චන්දිකා සහකාර විභාග කොමසාරිස්
සංස්කරණය	:	සම්මානිත මහාචාර්ය ඩැනී අතපත්තු ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය රුහුණ විශ්ව විද්‍යාලය ආචාර්ය වසන්ත අතුකෝරල ආර්ථික විද්‍යා හා සංඛ්‍යාන අධ්‍යයන අංශය පේරාදෙණිය විශ්ව විද්‍යාලය
සැකසුම් කමිටුව	:	ඩී. ජී. සුගත් ගුරු සේවය මාර/සාන්ත තෝමස් උසස් බාලිකා විද්‍යාලය, මාතර රම්‍යා ගුණසේකර ගුරු සේවය කො/විශාඛා විද්‍යාලය, කොළඹ එස්. එන්. බී. එම්. එස්. රංජනී ගුරු සේවය කළු/මිරිස්වත්ත ජාතික පාසල, දොඩන්ගොඩ ආර්. කේ. ඒ. ඩී. ඒ. කේ. රත්නායක ගුරු සේවය රාජකීය විද්‍යාලය, කොළඹ තමරා ටී. කාරියවසම් ගුරු සේවය ගා/රිපන් බාලිකා විද්‍යාලය, ගාල්ල
පරිගණක පිටපත සැකසුම	:	ඕ.එම්. දර්ශනී සෙව්වන්දි දත්ත සටහන් ක්‍රියාකරු
පිටකවර නිර්මාණය	:	ආර්. එම්. නිලුපුල් ෂෙහාන් යසරත්න දත්ත සටහන් සහකාර

ඇතුළත පිටු

පිටු අංකය

I කොටස

1. විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු

1.1 විෂය අභිමතාර්ථ 1

1.2 විෂය සාධනය පිළිබඳ තොරතුරු

1.2.1. විෂයය සඳහා පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව 2
1.2.2. අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය 2
1.2.3. පළමුවන වතාවට පෙනී සිටි පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව 3
1.2.4. ලකුණු ලබාගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව 4

1.3 විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණය

1.3.1. I ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය 5
1.3.2. II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය 6
1.3.3. II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය 6
1.3.4. II ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය (අ) කොටස 7
1.3.4. II ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය (ආ) කොටස 8

II කොටස

2. ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.1 **I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු**

2.1.1. I ප්‍රශ්න පත්‍රයේ ව්‍යූහය 9
2.1.2. I ප්‍රශ්න පත්‍රය 10
2.1.3. I ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය 18
2.1.4. I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ 19
2.1.5. I ප්‍රශ්න පත්‍රයේ එක් එක් ප්‍රශ්නයෙහි වරණ තෝරා ඇති ආකාරය - ප්‍රතිශත ලෙස 20
2.1.6. I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා 21

2.2 **II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු**

2.2.1. II ප්‍රශ්න පත්‍රයේ ව්‍යූහය 24
2.2.2. II ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා 25
2.2.3. II ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා 76

III කොටස

3. පිළිතුරු සැපයීමේදී සැලකිලිමත් විය යුතු කරුණු හා යෝජනා
3.1. පිළිතුරු සැපයීමේදී සැලකිලිමත් විය යුතු කරුණු 78
3.2. ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ අදහස් හා යෝජනා 81

I කොටස

1. විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු

1.1. විෂය අභිමතාර්ථ

- ★ සමාජයක මූලික ආර්ථික ප්‍රශ්න විද්‍යාත්මක ව විශ්ලේෂණය කිරීම හා එම මූලික ආර්ථික ප්‍රශ්න නිරාකරණය කිරීම පිණිස යොදා ගත හැකි විකල්ප ක්‍රම පිළිබඳ ව විචාරාත්මක අවබෝධයක් ලබාදීම.
- ★ ආර්ථික සංකල්ප හා න්‍යාය යොදා ගනිමින් ප්‍රායෝගික ආර්ථික ප්‍රශ්න හා උපනති විශ්ලේෂණය සඳහා අවශ්‍ය කුසලතා ලබාදීම.
- ★ සාර්ව ආර්ථික විචල්‍යවල හැසිරීම හා එම විචල්‍ය අතර පවතින අන්තර් සම්බන්ධතා තේරුම් ගැනීමට සැලැස්වීම.
- ★ වෙළෙඳපොළක ආයතන හා පුද්ගලයන් තාර්කික ව හැසිරෙන ආකාරය විමර්ශනය කිරීමට පෙළඹවීම.
- ★ ආර්ථික විද්‍යානුකූල ව සිතීම සඳහා අවශ්‍ය වන තාර්කික චින්තනය ඇති කිරීම.
- ★ විවිධ ආර්ථික විද්‍යා සංකල්ප පිළිබඳ ව පිළිගත් අර්ථකථන අධ්‍යයනයට අවස්ථා ලබාදීම.
- ★ වෙළෙඳපොළ ක්‍රමයක් ඔස්සේ සාර්ව ආර්ථික අරමුණු ළඟා කර ගැනීම සඳහා රජය මැදිහත් වන ආකාරය පිළිබඳ ව විමසා බැලීමට යොමු කිරීම.
- ★ පවතින ආර්ථික ප්‍රතිපත්ති විචාරශීලී ව විග්‍රහ කිරීමේ හැකියාව ලබාදීම.
- ★ ආර්ථික සංවර්ධනයේ විවිධත්ව තුලනාත්මක ව විමසීමට අවශ්‍ය කුසලතා ලබාදීම.
- ★ ආර්ථික විද්‍යා විෂයය විශ්ලේෂණාත්මක ව පැහැදිලි කිරීම සඳහා අවශ්‍ය මූලික නිපුණතා ලබාදීම.
- ★ අන්තර්ජාතික වෙළෙඳාමේ, මූල්‍යයේ වැදගත්කම හා ගෝලීයකරණය අතර ඇති සම්බන්ධතාව පෙන්වා දීම.
- ★ ශ්‍රී ලංකා ආර්ථිකයේ කාර්ය සාධනය පිළිබඳ ව විචාරාත්මක ව දැකීමට හැකි කුසලතා වර්ධනය කිරීම.
- ★ සමාජයේ යහපැවැත්මට කටයුතු කිරීම සඳහා අවශ්‍ය පදනමක් ලබාදීම.
- ★ උසස් අධ්‍යාපනයට යොමු වීම සඳහා යෝග්‍ය පදනමක් ලබාදීම.

1.2. විෂය සාධනය පිළිබඳ තොරතුරු

1.2.1 විෂයය සඳහා පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව

මාධ්‍යය	පාසල්	පෞද්ගලික	එකතුව
සිංහල	48112	4611	52723
දෙමළ	8014	1047	9061
ඉංග්‍රීසි	1921	886	2807
එකතුව	**58047**	**6544**	**64591**

වගුව 1

1.2.2 අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය

ශ්‍රේණිය	පාසල් අයදුම්කරුවන්		පෞද්ගලික අයදුම්කරුවන්		එකතුව	ප්‍රතිශතය
	සංඛ්‍යාව	ප්‍රතිශතය	සංඛ්‍යාව	ප්‍රතිශතය		
A	6385	11.00	389	5.94	6774	10.49
B	7428	12.80	580	8.86	8008	12.40
C	13926	23.99	1115	17.04	15041	23.29
S	17795	30.65	1917	29.30	19712	30.51
F	12513	21.56	2543	38.86	15056	23.31
එකතුව	**58047**	**100.00**	**6544**	**100.00**	**64591**	**100.00**

වගුව 2

1.2.3 පළමුවන වතාවට පෙනී සිටි පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව

දිස්ත්‍රික්කය	පෙනී සිටි සංඛ්‍යාව	විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබූ		අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ		සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ		සාමාන්‍ය සාමර්ථ්‍යය (S) ලැබූ		සමත් (A+B+C+S)		අසමත් (F)	
		සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%
1. කොළඹ	9125	1303	14.28	1186	13.00	2192	24.02	2619	28.70	7300	80.00	1825	20.00
2. ගම්පහ	5410	612	11.31	663	12.26	1177	21.76	1624	30.02	4076	75.34	1334	24.66
3. කළුතර	2784	342	12.28	374	13.43	648	23.28	812	29.17	2176	78.16	608	21.84
4. මහනුවර	3431	352	10.26	405	11.80	747	21.77	1139	33.20	2643	77.03	788	22.97
5. මාතලේ	849	65	7.66	95	11.19	207	24.38	271	31.92	638	75.15	211	24.85
6. නුවරඑළිය	1218	127	10.43	144	11.82	320	26.27	337	27.67	928	76.19	290	23.81
7. ගාල්ල	2518	294	11.68	270	10.72	516	20.49	734	29.15	1814	72.04	704	27.96
8. මාතර	1618	137	8.47	178	11.00	397	24.54	474	29.30	1186	73.30	432	26.70
9. හම්බන්තොට	1061	49	4.62	96	9.05	240	22.62	311	29.31	696	65.60	365	34.40
10. යාපනය	1022	135	13.21	139	13.60	242	23.68	337	32.97	853	83.46	169	16.54
11. කිලිනොච්චි	176	20	11.36	18	10.23	35	19.89	70	39.77	143	81.25	33	18.75
12. මන්නාරම	174	22	12.64	34	19.54	50	28.74	48	27.59	154	88.51	20	11.49
13. වව්නියාව	334	39	11.68	50	14.97	76	22.75	103	30.84	268	80.24	66	19.76
14. මුලතිව්	144	23	15.97	16	11.11	42	29.17	43	29.86	124	86.11	20	13.89
15. මඩකලපුව	622	79	12.70	96	15.43	150	24.12	212	34.08	537	86.33	85	13.67
16. අම්පාර	1071	90	8.40	124	11.58	263	24.56	316	29.51	793	74.04	278	25.96
17. ත්‍රිකුණාමලය	605	61	10.08	64	10.58	116	19.17	198	32.73	439	72.56	166	27.44
18. කුරුණෑගල	2799	305	10.90	341	12.18	652	23.29	857	30.62	2155	76.99	644	23.01
19. පුත්තලම	1406	178	12.66	195	13.87	338	24.04	445	31.65	1156	82.22	250	17.78
20. අනුරාධපුරය	1458	117	8.02	156	10.70	308	21.12	456	31.28	1037	71.12	421	28.88
21. පොළොන්නරුව	794	75	9.45	61	7.68	181	22.80	252	31.74	569	71.66	225	28.34
22. බදුල්ල	1724	131	7.60	182	10.56	409	23.72	562	32.60	1284	74.48	440	25.52
23. මොණරාගල	700	78	11.14	74	10.57	155	22.14	223	31.86	530	75.71	170	24.29
24. රත්නපුරය	1869	241	12.89	219	11.72	448	23.97	548	29.32	1456	77.90	413	22.10
25. කෑගල්ල	1508	136	9.02	181	12.00	375	24.87	473	31.37	1165	77.25	343	22.75
සමස්ත දිවයින	**44420**	**5011**	**11.28**	**5361**	**12.07**	**10284**	**23.15**	**13464**	**30.31**	**34120**	**76.81**	**10300**	**23.19**

වගුව **3**

1.2.4 ලකුණු ලබාගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව


පන්ති ප්‍රාන්තරය	සංඛ්‍යාතය	සංඛ්‍යාත ප්‍රතිශතය	සමුච්චිත සංඛ්‍යාතය	සමුච්චිත සංඛ්‍යාත ප්‍රතිශතය
91 - 100	98	0.15	64591	100.00
81 - 90	2171	3.36	64493	99.85
71 - 80	6253	9.68	62322	96.49
61 - 70	9013	13.95	56069	86.81
51 - 60	10847	16.79	47056	72.85
41 - 50	13013	20.15	36209	56.06
31 - 40	**11851**	**18.35**	**23196**	**35.91**
21 - 30	7859	12.17	11345	17.56
11 - 20	3275	5.07	3486	5.40
01 - 10	210	0.33	211	0.33
00 - 00	1	0.00	1	0.00

වගුව 4

ඉහත වගුව අනුව මෙම විෂයය සඳහා 31 - 40 ප්‍රාන්තරය තුළ ලකුණු ලබාගත් අපේක්ෂකයින් සංඛ්‍යාව 11851 ක් වන අතර, එය මුළු අපේක්ෂකයින් සංඛ්‍යාවෙන් 18.35% කි. ලකුණු 40 හෝ ඊට අඩුවෙන් ලබා ගත් අපේක්ෂකයින් සංඛ්‍යාව 23196 කි. එම සංඛ්‍යාව මුළු අපේක්ෂකයින්ගෙන් 35.91% කි.

1.3 විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණය


1.3.1 I ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය



ප්‍රස්තාරය 1 (RD/16/05/AL පෞර්මයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

ඉහත ප්‍රස්තාරයට අනුව අයදුම්කරුවන් වැඩි ම සංඛ්‍යාවක් නිවැරදිව පිළිතුරු සපයා ඇත්තේ 02 වන ප්‍රශ්නයට ය. එම ප්‍රශ්නයට ඔවුන් දැක්වූ පහසුතාවයෙහි ප්‍රතිශතය 97% කි. එමෙන්ම අයදුම්කරුවන් අඩු ම සංඛ්‍යාවක් නිවැරදිව පිළිතුරු සපයා ඇත්තේ 09 වන ප්‍රශ්නයට වන අතර එම ප්‍රශ්නය සඳහා පහසුතාව 10% කි.


1.3.2 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය



මෙම ප්‍රස්තාරයට අනුව 'අ' කොටසේ 02 වන ප්‍රශ්නය, අයදුම්කරුවන්ගෙන් වැඩි දෙනකු තෝරා ගෙන ඇත. එම ප්‍රතිශතය 98.37% කි. 'ආ' කොටසේ 07 වන ප්‍රශ්නය, තෝරා ගෙන ඇති ප්‍රතිශතය 64.98% කි. 04 වන ප්‍රශ්නය තෝරා ගැනීම 18% ක් වැනි අඩු මට්ටමක පවතී.

ප්‍රස්තාරය 2 (RD/16/02/AL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)


1.3.3 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය




මෙහි I වන ප්‍රශ්නය සඳහා වෙන්කර ඇති ලකුණු ප්‍රමාණය ලකුණු 20 කි. මෙම ප්‍රස්තාරයට අනුව එම ලකුණුවලින් 76% - 100% ප්‍රාන්තරයේ එනම් ලකුණු 16 සිට 20 තෙක් ලබාගත් ප්‍රතිශතය 39%කි. එමෙන්ම වෙන්කර ඇති ලකුණු 20න් 0% - 25% ප්‍රාන්තරයේ එනම් ලකුණු 0 සිට 5 තෙක් ලබා ගත් ප්‍රතිශතය 10%ක් පමණ වේ.

ප්‍රස්තාරය 3 (RD/16/02/AL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

1.3.4 II ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය



ප්‍රස්තාරය 4.1 (RD/16/04/AL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)
මෙම ප්‍රස්තාරය අනුව 5 වන ප්‍රශ්නයෙහි (i) (අ) කොටසෙහි පහසුතාව .94% ක් වන අතර, 4 වන ප්‍රශ්නයෙහි (ii) කොටසෙහි .පහසුතාව 11% කි.



ප්‍රස්තාරය 4.2 (RD/16/04/AL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

මෙම ප්‍රස්තාරය අනුව 7 වන ප්‍රශ්නයෙහි (i) කොටසෙහි පහසුතාව 72% ක් වන අතර 9 වන ප්‍රශ්නයෙහි (i) කොටසෙහි පහසුතාව 2% කි.

II කොටස

2. ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.1. I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.1.1. I ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

- ⋆ කාලය පැය 02කි.
- ⋆ වරණ 05 බැගින් වූ බහුවරණ ප්‍රශ්න 50කි. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතුයි.
- ⋆ එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 100කි.

2.1.2 I ප්‍රශ්න පත්‍රය

1. පහත සඳහන් දෑ අතුරෙන් නිෂ්පාදන සාධකයක් **නොවන්නේ** කවරක් ද?
(1) ස්වාභාවික සම්පත් (2) මානව සම්පත් (3) ප්‍රාග්ධනය
(4) මුදල් (5) ව්‍යවසායකත්වය (.....)

2. හිඟකම පිළිබඳ ප්‍රශ්නය
(1) පවතිනුයේ සංවර්ධනය වෙමින් පවත්නා ආර්ථිකයන්හි පමණි.
(2) පවතිනුයේ වෙළෙඳපොළ ආර්ථිකයන්හි පමණි.
(3) පවතිනුයේ භාණ්ඩ හා සේවාවන්හි මිල ගණන් ඉතා අධික බැවිනි.
(4) දැනට පැවතිය හැකි වුව ද ආර්ථික වෘද්ධියත් සමග එය බැහැර වී යනු ඇත.
(5) පවතිනුයේ සම්පත් සීමාසහිත බැවිනි. (.....)

3. නිෂ්පාදන හැකියා වක්‍රයක් නිර්මාණය කිරීමේ දී පහත සඳහන් දෑ අතුරෙන් කවරක් උපකල්පනය කරනු ලැබේ ද?
(1) ආර්ථිකය තම සම්පත් අකාර්යක්ෂම ලෙස උපයෝජනය කරයි.
(2) සම්පත් උපයෝජනය කරනුයේ පෞද්ගලික භාණ්ඩ නිෂ්පාදනය කිරීම සඳහා පමණි.
(3) පූර්ණ නිෂ්පාදනය නොව පූර්ණ සේවා නියුක්තිය සාක්ෂාත් කර ගනී.
(4) නිෂ්පාදන තාක්ෂණය නොවෙනස්ව පවතී.
(5) ආර්ථිකයේ උද්ධමනයක් නොපවතී. (.....)

4. කිසියම් ආර්ථිකයක් නිෂ්පාදන කාර්යක්ෂමතාව අත් කර ගත් විට
(1) වෙනත් භාණ්ඩයක නිෂ්පාදනය අඩු නොකොට, තවත් භාණ්ඩයක් වැඩිපුර නිෂ්පාදනය කළ නොහැකි වේ.
(2) එක් එක් භාණ්ඩය නිෂ්පාදනය කිරීමේ ආන්තික පිරිවැය එම භාණ්ඩයේ මිලට සමාන වේ.
(3) සියලු ම සෘණ බාහිරතා බැහැරව ගොස් ඇත.
(4) සමාජයට වඩාත් වුවමනා කරන භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම සඳහා සම්පත් බෙදා වෙන් කෙරේ.
(5) සියලු ම භාණ්ඩ සම්බන්ධයෙන් ස්වයංපෝෂිත තත්ත්වයට පත් වේ. (.....)

5. 'කුමක් නිෂ්පාදනය කරන්නේ ද' සහ 'කා සඳහා නිෂ්පාදනය කරන්නේ ද' යන මූලික ආර්ථික ප්‍රශ්න අවශ්‍යයෙන් ම අන්‍යෝන්‍ය වශයෙන් එකිනෙක බැඳී පවතී. මක් නිසාද යත්,
(1) වෙනස් වෙනස් ආදායම් ව්‍යාප්ති රටා වෙනස් වෙනස් ඉල්ලුම් රටාවන් ජනනය කෙරෙන බැවින්, ඒවාට අනුරූප වන ලෙස සම්පත් බෙදා වෙන්කිරීමේ රටාවන් ද වෙනස් වන බැවිනි.
(2) වෙනස් වෙනස් නිෂ්පාදන ක්‍රම ශිල්ප වෙනස් වෙනස් ආදායම් ව්‍යාප්ති රටා ජනනය කරන බැවිනි.
(3) සමාජයේ ආර්ථික වශයෙන් ප්‍රබල කණ්ඩායම් වෙත ආදායම් හා ධනය සංකේන්ද්‍රණය වී ඇති බැවිනි.
(4) සම්පත් කාර්යක්ෂම ලෙස බෙදා වෙන්කිරීමෙහිලා වෙළෙඳපොළ මත විශ්වාසය තැබිය නොහැකි බැවිනි.
(5) කිසියම් නිශ්චිත නිමැවුම් මට්ටමක්, යෙදවුම්වල විවිධ සංයෝජන ඔස්සේ නිෂ්පාදනය කළ හැකි බැවිනි. (.....)

6. වෙළෙඳපොළ ආර්ථිකයක මිලෙහි ප්‍රධාන කාර්යය වනුයේ
(1) ව්‍යවසායකයන් උදෙසා වඩ වඩා ලාභ ජනනය කර දීම ය.
(2) ආයෝජන ඉඩ ප්‍රස්තා තෝරා ගැනීම සඳහා කුටුම්බවලට මගපෙන්වීම ය.
(3) ඉල්ලුම් වක්‍රවල නම්‍යතාව නිර්ණය කිරීම ය.
(4) ආදායම් ව්‍යාප්තිය උසස් කරලීම ය.
(5) හිඟ සම්පත් විකල්ප භාවිත අතර බෙදා වෙන්කරලීම ය. (.....)

7. කිසියම් භාණ්ඩයක් සඳහා ඇති වෙළෙඳපොළ ඉල්ලුම් වක්‍රය නොවෙනස්ව පවතිනුයේ පහත සඳහන් කවර කරුණක් වෙනස් වූ විට දී ද?
(1) ජනගහනය (2) එම භාණ්ඩයේ මිල
(3) ආදේශක භාණ්ඩයක මිල (4) අනුපූරක භාණ්ඩයක මිල
(5) කුටුම්බවල සාමාන්‍ය ආදායම (.....)

8. පහළට බෑවුම් වන ඉල්ලුම් වක්‍රයක් සහිත සාමාන්‍ය භාණ්ඩයක් සඳහා ආදායම් හා මිල ඉල්ලුම් නම්‍යතාවන්ගේ පහත සඳහන් කවර සංයෝජනයක් අනුකූල වේ ද?

	ආදායම් ඉල්ලුම් නම්‍යතාව	මිල ඉල්ලුම් නම්‍යතාව
(1)	සෘණ	ධන
(2)	ධන	සෘණ
(3)	සෘණ	සෘණ
(4)	ධන	ධන
(5)	සෘණ	ශූන්‍ය

(.....)

9. A සහ B වශයෙන් භාණ්ඩ දෙකක් පමණක් ඇති බවත්, පාරිභෝගිකයාගේ මුදල් ආදායම ඇතුළු අනෙකුත් සියලු කරුණු නොවෙනස්ව පවතින බවත් සිතන්න. A භාණ්ඩයේ මිල පහළ බසින විට, B භාණ්ඩය සඳහා ඇති ඉල්ලුම වැඩි වේ නම්, අපට නිගමනය කළ හැක්කේ

(1) A සාමාන්‍ය භාණ්ඩයක් බව ය.
(2) A හා B යන භාණ්ඩ දෙක ම සාමාන්‍ය භාණ්ඩ බව ය.
(3) A බාල භාණ්ඩයක් බව ය.
(4) B බාල භාණ්ඩයක් බව ය.
(5) B සාමාන්‍ය භාණ්ඩයක් බව ය. (.....)

10. සහල් මිල ඉහළ යාමක් නිසා පාන් සඳහා ඉල්ලුම 30%කින් වැඩි වේ. සහල් සහ පාන් අතර හරස් ඉල්ලුම් නම්‍යතාව 3.0 කි. මෙම තත්ත්වය ඇතිවීම සඳහා සහල් මිල කොපමණ ප්‍රමාණයකින් වෙනස් විය යුතු ද?

(1) කිලෝග්‍රෑමයක් රුපියල් 80 සිට රුපියල් 90 දක්වා
(2) කිලෝග්‍රෑමයක් රුපියල් 60 සිට රුපියල් 72 දක්වා
(3) කිලෝග්‍රෑමයක් රුපියල් 80 සිට රුපියල් 85 දක්වා
(4) කිලෝග්‍රෑමයක් රුපියල් 70 සිට රුපියල් 80 දක්වා
(5) කිලෝග්‍රෑමයක් රුපියල් 80 සිට රුපියල් 88 දක්වා (.....)

11. කිසියම් භාණ්ඩයක් සඳහා ඇති වෙළෙඳපොළක පවත්නා මිලේ දී, පාරිභෝගිකයන් විසින් මිල දී ගැනීමට කැමති ප්‍රමාණයට වඩා වැඩි ප්‍රමාණයක් අලෙවි කිරීමට නිෂ්පාදකයන් නිරන්තරයෙන්ම කැමැත්තෙන් සිටී නම්, එම වෙළෙඳපොළ පිළිබඳව පහත සඳහන් කවරක් නිවැරදි වේ ද?

(1) ඉල්ලුම ඉතා අනම්‍ය වේ.
(2) සැපයුම ඉතා නම්‍ය වේ.
(3) භාණ්ඩය බාල භාණ්ඩයකි.
(4) භාණ්ඩය සඳහා උපරිම මිලක් නියම කොට තිබේ.
(5) භාණ්ඩය සඳහා අවම මිලක් නියම කොට තිබේ. (.....)


12. කිසියම් පාරිභෝගික භාණ්ඩයක් සඳහා වන වෙළෙඳපොළ ඉල්ලුම් හා සැපයුම් වක්‍ර පහත සඳහන් සමීකරණවලින් නිරූපණය කෙරේ.

ඉල්ලුම $(Q_D) = 80 - 2P$ සැපයුම $(Q_S) = -20 + 3P$

එවිට වෙළෙඳපොළේ සමතුලිත ප්‍රමාණය සහ මිල වනුයේ

(1) ඒකක 40 සහ රුපියල් 20 කි.
(2) ඒකක 56 සහ රුපියල් 12 කි.
(3) ඒකක 50 සහ රුපියල් 15 කි.
(4) ඒකක 60 සහ රුපියල් 10 කි.
(5) ඒකක 40 සහ රුපියල් 120 කි. (.....)

13. පහත දැක්වෙන රූපසටහන මගින් කිසියම් පාරිභෝගික භාණ්ඩයක් සඳහා ඇති තරගකාරී වෙළෙඳපොළක් නිරූපණය කරයි.



රජය විසින් මෙම වෙළෙඳපොළේ අලෙවි වන භාණ්ඩය මත විශේෂිත බද්දක් (ඒකක බද්දක්) පනවනු ලැබුවහොත්, බද්දට පසු නිෂ්පාදක අතිරික්තයේ ප්‍රමාණය වනුයේ,

(1) A + B + F (2) B + E + C + F + D
(3) C + F + D (4) D
(5) E + F + H (.....)

14. සැපයුමේ මිල නම්‍යතාව එකට වඩා අඩු නම්, ඉන් අදහස් වනුයේ

(1) සපයන ලද ප්‍රමාණයේ වෙනස්වීම, මිල වෙනස් වූ ප්‍රමාණයට වඩා වැඩි බව ය.
(2) සපයන ලද ප්‍රමාණයේ ප්‍රතිශතාත්මක වෙනස, මිල වෙනස් වූ ප්‍රතිශතයට වඩා වැඩි බව ය.
(3) සපයන ලද ප්‍රමාණයේ වෙනස්වීම, මිල වෙනස් වූ ප්‍රමාණයට වඩා අඩු බව ය.
(4) සපයන ලද ප්‍රමාණයේ ප්‍රතිශතාත්මක වෙනස, මිල වෙනස් වූ ප්‍රතිශතයට වඩා අඩු බව ය.
(5) සපයන ලද ප්‍රමාණයේ ප්‍රතිශතාත්මක වෙනස, මිල වෙනස් වූ ප්‍රමාණයට වඩා අඩු බව ය. (.....)

15. තරගකාරී වෙළෙඳපොළක ඉල්ලුම් හා සැපයුම් වක්‍ර පහත දැක්වෙන සමීකරණවලින් නිරූපණය කෙරේ යැයි සලකන්න.

ඉල්ලුම $(Q_D) = 60 - 2P$ සැපයුම $(Q_S) = -20 + 3P$

මෙම සමීකරණයන්ගේ Q_D හා Q_S යනු ඉල්ලුම් කරනු ලබන හා සපයනු ලබන ප්‍රමාණ බවත්, P යනු මිල බවත් සලකන්න. තව ද ආණ්ඩුව මෙම භාණ්ඩයේ ඒකකයක් සඳහා රුපියල් 20ක අවම මිලක් නියම කරනු ලැබේ යැයි සලකන්න. එවිට

(1) වෙළෙඳපොළෙහි ඒකක 20ක අධි සැපයුමක් හට ගනී.
(2) වෙළෙඳපොළෙහි ඒකක 28ක අධි සැපයුමක් හට ගනී.
(3) වෙළෙඳපොළෙහි ඒකක 28ක අධි ඉල්ලුමක් හට ගනී.
(4) වෙළෙඳපොළෙහි ඒකක 20ක අධි ඉල්ලුමක් හට ගනී.
(5) වෙළෙඳපොළ මත කිසිදු බලපෑමක් හට නොගනී. (.....)

16. 'හීනවන ඵලදා නීතිය' ප්‍රකාශ කරනුයේ,

(1) කර්මාන්ත ශාලාවේ විශාලත්වය වැඩි කරන විට, එහි ආන්තික ඵලදාව ක්‍රමයෙන් පහළ වැටෙන බව ය.
(2) කර්මාන්ත ශාලාවේ විශාලත්වය වැඩි කරන විට, එහි සාමාන්‍ය පිරිවැය ක්‍රමයෙන් පහළ වැටෙන බව ය.
(3) ආයතනය ස්ථාවර යෙදවුම් ප්‍රමාණයක් සමග විචල්‍ය යෙදවුම වැඩි වැඩියෙන් භාවිත කරන විට, එහි ආන්තික ඵලදාව ක්‍රමයෙන් පහළ වැටෙන බව ය.
(4) ආයතනය ස්ථාවර යෙදවුම් ප්‍රමාණයක් සමග විචල්‍ය යෙදවුම් වැඩි වශයෙන් භාවිත කරන විට, එහි සාමාන්‍ය පිරිවැය ක්‍රමයෙන් පහළ වැටෙන බව ය.
(5) ආයතනය විචල්‍ය යෙදවුම් ප්‍රමාණයක් සමග ස්ථාවර යෙදවුම් වැඩි වැඩියෙන් භාවිත කරන විට, එහි ආන්තික ඵලදාව ක්‍රමයෙන් පහළ වැටෙන බව ය. (.....)

17. නිෂ්පාදනයේ ආරෝපිත පිරිවැය පවතී නම්,

(1) ගණකාධිකාරී ලාභය ආර්ථික ලාභය ඉක්මවා යනු ඇත.
(2) ආර්ථික ලාභය සැමවිට ම ශූන්‍ය අගයක් ගනු ඇත.
(3) ආර්ථික ලාභය ගණකාධිකාරී ලාභය ඉක්මවා යනු ඇත.
(4) ගණකාධිකාරී ලාභය සැමවිට ම ශූන්‍ය අගයක් ගනු ඇත.
(5) ආර්ථික ලාභය හා ගණකාධිකාරී ලාභය එකිනෙකට සමාන වනු ඇත. (.....)

18. පහත සඳහන් දෑ අතුරෙන් පූර්ණ තරගකාරී වෙළෙඳපොළක සාමාන්‍ය ලක්ෂණයක් **නොවන්නේ.**

(1) කිසිදු සැලකිය යුතු ආකාරයේ වෙළෙඳපොළ බලයක් තනි ආයතනයකට නොතිබීම ය.
(2) වෙළෙඳපොළ ඉල්ලුම් වක්‍රය පූර්ණ නම්‍ය එකක් වීම ය.
(3) භාණ්ඩයේ මිල කෙරෙහි කිසිදු බලපෑමක් නොමැතිව, ඕනෑ ම ආයතනයකට තම නිමැවුම හා අලෙවිය වැඩි කළ හැකි වීම ය.
(4) දැනට සිටින ආයතනවලට නව ආයතන ප්‍රවේශ වීම වළක්වාලිය නොහැකි වීම ය.
(5) වෙළෙඳපොළෙහි ගැනුම්කරුවන් සහ විකුණුම්කරුවන් විශාල සංඛ්‍යාවක් සිටීම ය. (.....)

19. පූර්ණ තරගයට සහ ඒකාධිකාරී තරගයට අදාළ ඇතැම් උපකල්පන පහත සඳහන් වගුවේ දැක්වේ. එම උපකල්පනයන්ගේ කවර සංයෝජනයක් මෙම වෙළෙඳපොළවලට අනුකූල වේ ද?

	පූර්ණ තරගය	**ඒකාධිකාරී තරගය**
(1)	නිෂ්පාදිතය සමජාතීය වීම	ප්‍රවේශයට සහ පිටවීමට බාධක තිබීම
(2)	නිෂ්පාදිතය ප්‍රභේදනය වීම	නිෂ්පාදිතය සමජාතීය වීම
(3)	විකුණුම්කරුවන් විශාල සංඛ්‍යාවක් සිටීම	විකුණුම්කරුවන් සුළු සංඛ්‍යාවක් සිටීම
(4)	ප්‍රවේශයට සහ පිටවීමට බාධක තිබීම	පූර්ණ තොරතුරු පැවතීම
(5)	විකුණුම්කරුවන් විශාල සංඛ්‍යාවක් සිටීම	නිෂ්පාදිතය ප්‍රභේදනය වීම

(.....)

20. පූර්ණ තරගකාරී කර්මාන්තයක කටයුතු කරන ආයතනයක් කෙටි කාලයේ දී පහත සඳහන් තත්ත්වයකට මුහුණ පා සිටී.

වර්තමාන නිමැවුම් මට්ටම	= ඒකක 500කි.
වෙළෙඳපොළ මිල	= ඒකකයක් රුපියල් 6කි.
මුළු පිරිවැය	= රුපියල් 5 000කි.
මුළු ස්ථාවර පිරිවැය	= රුපියල් 1 000කි.
ආන්තික පිරිවැය	= රුපියල් 6කි.

ලාභ උපරිමනය කිරීමේ අරමුණින් කටයුතු කරන මෙම ආයතනය,

(1) නිමැවුම් ප්‍රමාණය අඩු කොට නිෂ්පාදනයේ යෙදී සිටිය යුතු ය.
(2) අලෙවි මිල ඉහළ දැමිය යුතු ය.
(3) නිමැවුම් ප්‍රමාණය නොවෙනස්ව තබා ගත යුතු ය.
(4) නිමැවුම් ප්‍රමාණය ශූන්‍ය දක්වා අඩු කළ යුතු ය.
(5) නිමැවුම් ප්‍රමාණය ඉහළ දමා, මිල නොවෙනස්ව තබා ගත යුතු ය. (.....)

21. ව්‍යාපාර චක්‍රයක විවිධ අදියරයන්ගේ අනුපිළිවෙළ වනුයේ

(1) සංකෝචනය, ප්‍රසාරණය, පතුළ හා මුදුනත වශයෙනි.
(2) සංකෝචනය, මුදුනත, ප්‍රසාරණය හා පතුළ වශයෙනි.
(3) සංකෝචනය, පතුළ, මුදුනත හා ප්‍රසාරණය වශයෙනි.
(4) සංකෝචනය, පතුළ, ප්‍රසාරණය හා මුදුනත වශයෙනි.
(5) සංකෝචනය, මුදුනත, පතුළ හා ප්‍රසාරණය වශයෙනි. (.....)

22. දළ ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය ගණනය කිරීමේ දී, පහත සඳහන් වියදම් අතුරෙන් කවරක් ඇතුළත් කෙරේ ද?

(1) අළුතින් ඉදි කරන ලද නිවසක් මිල දී ගැනීම
(2) සුඛෝපභෝගී අළුත් මෝටර් රථයක් මිල දී ගැනීම
(3) නිෂ්පාදන සමාගමක කොටස් 1 000ක් මිල දී ගැනීම
(4) කොටස් අලෙවි කිරීම වෙනුවෙන් කොටස් තැරැව්කරුවෙකුට කොමිස් ගාස්තු ගෙවීම
(5) හෙක්ටයාර පහක් වූ බිම් කොටසක බඩඉරිගු වගාවට මුදල් වියදම් කිරීම (.....)

23. කිසියම් රටක කාලපරිච්ඡේද දෙකක් අතර පවත්නා මිල යටතේ දළ දේශීය නිෂ්පාදිතය 8%කට ආසන්න ප්‍රමාණයකින් ඉහළ ගිය නමුදු, මූර්ත දළ දේශීය නිෂ්පාදිතය එම කාලපරිච්ඡේදය තුළ 2%කින් පහළ වැටුණු බව සලකන්න. පහත සඳහන් කවර පැහැදිලි කිරීමක් මේ සඳහා වඩාත් යෝග්‍ය වේ ද?

(1) 4%කින් පොදු මිල මට්ටම පහළ වැටීම (2) 8%කින් පොදු මිල මට්ටම පහළ වැටීම
(3) 4%කින් පොදු මිල මට්ටම ඉහළ නැගීම (4) 8%කින් පොදු මිල මට්ටම ඉහළ නැගීම
(5) 10%කින් පොදු මිල මට්ටම ඉහළ නැගීම (.....)

24. ආර්ථිකයක සමාහාර වියදමේ අඩු වීමක් හටගත හැක්කේ පහත සඳහන් කවරක වැඩි වීමක් නිසා ද?

(1) පරිභෝජන වියදම (2) ආණ්ඩුවේ මිල දී ගැනීම්
(3) ආනයන වියදම (4) ආයෝජන වියදම
(5) විදේශ ප්‍රේෂණ ගලා ඒම (.....)

25. ආවෘත ආර්ථිකයක සමාහාර පරිභෝජන ශ්‍රිතය $C = 200 + 0.8Y$ බවත්, සමතුලිත ජාතික ආදායම් මට්ටම රුපියල් බිලියන 4 000ක් බවත් සලකන්න. මෙම ආර්ථිකයේ ආයෝජන මට්ටම කොපමණ ද?

(1) රුපියල් බිලියන 1 600 (2) රුපියල් බිලියන 600
(3) රුපියල් බිලියන 400 (4) රුපියල් බිලියන 380
(5) රුපියල් බිලියන 300 (.....)

26. කිසියම් ආර්ථිකයක් දැනට රුපියල් බිලියන 3 000ක් වූ සමතුලිත නිමැවුම් මට්ටමක කටයුතු කරන බවත්, පූර්ණ සේවා නියුක්ති සමතුලිතය සාක්ෂාත් කර ගැනීමට රුපියල් බිලියන 4 000ක නිමැවුම් මට්ටමක් අවශ්‍ය බවත් සලකන්න. තව ද මෙම ආර්ථිකයේ ආන්තික ඉතුරුම් නැමියාව 0.2ක් වේ. මෙම ආර්ථිකයට පූර්ණ සේවා නියුක්ති සමතුලිතය අත්කර ගැනීම සඳහා වඩාත් යෝග්‍ය ප්‍රතිපත්ති නිර්දේශය කුමක් ද?

(1) ආණ්ඩුවේ වියදම් රුපියල් බිලියන 1 000කින් ඉහළ නැංවීම
(2) ආණ්ඩුවේ වියදම් රුපියල් බිලියන 500කින් ඉහළ නැංවීම
(3) ආණ්ඩුවේ වියදම් රුපියල් බිලියන 250කින් ඉහළ නැංවීම
(4) රුපියල් බිලියන 1 000කින් සෘජු බදු අඩු කිරීම
(5) රුපියල් බිලියන 250කින් සෘජු බදු අඩු කිරීම (.....)

27. ආණ්ඩුවේ කටයුතු සහිත විවෘත ආර්ථිකයක සමාහාර වියදමේ සංරචක සහ ජාතික ආදායම පිළිබඳ දත්ත පහත සඳහන් වගුවේ දැක්වේ. එහි C = පරිභෝජන වියදම, I = ආයෝජනය, G = ආණ්ඩුවේ මිල දී ගැනීම්, X = අපනයන, M = ආනයන සහ Y = ජාතික ආදායම බව සලකන්න. මෙම ආර්ථිකය අසමතුලිතව පවතිනුයේ කවර තත්ත්වයක් යටතේ දී ද?

(සියලු ම සංඛ්‍යා රුපි. බිලියන වලිනි)

	C	I	G	X	M	Y
(1)	250	50	100	75	25	400
(2)	300	50	100	75	25	500
(3)	450	50	100	75	25	650
(4)	600	50	100	75	25	800
(5)	750	50	100	75	25	950

(.....)

28. 'මුදලේ වටිනාකම' යන්නෙන් අදහස් වන්නේ කුමක් ද?
(1) යම් දෙන ලද මුදල් ප්‍රමාණයකින් මිල දී ගත හැකි භාණ්ඩ හා සේවා ප්‍රමාණය
(2) මුදල් ස්වරූපයෙන් ගබඩා කොට ඇති ධනයේ ප්‍රමාණය
(3) මහ බැංකුවෙහි පවත්වා ගනු ලබන රන් සංචිතවල ප්‍රමාණය
(4) කාසි හා නෝට්ටුවල නිෂ්පාදන පිරිවැය
(5) මුදල් ස්වරූපයෙන් ධනය ලඟ තබා ගැනීමේ ආවස්ථික පිරිවැය (.....)

29. උද්ධමනීය පරතරයක් අඩු කර ගත හැක්කේ
(1) ආණ්ඩුවේ වියදම් ඉහළ දැමීමක් මගිනි.
(2) මුදල් සැපයුම ඉහළ දැමීමක් මගිනි.
(3) ආදායම් බදු අනුපාතිකය ඉහළ දැමීමක් මගිනි.
(4) මහ බැංකුවේ වට්ටම් අනුපාතිකය පහළ හෙළීමක් මගිනි.
(5) ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය පහළ හෙළීමක් මගිනි. (.....)

30. එකතු කළ අගය මත අය කෙරෙන බද්ද (VAT බද්ද) ඉහළ දැමීම නිසා, ඉල්ලුමෙන් ඇදුණු සහ පිරිවැයෙන් තල්ලුවුණු උද්ධමන කෙරෙහි කෙබඳු බලපෑමක් ඇති විය හැකි ද?

	ඉල්ලුමෙන් ඇදුණු උද්ධමනය	පිරිවැයෙන් තල්ලුවුණු උද්ධමනය
(1)	අඩු වේ	වැඩි වේ
(2)	වැඩි වේ	අඩු වේ
(3)	වැඩි වේ	වැඩි වේ
(4)	අඩු වේ	අඩු වේ
(5)	වැඩි වේ	බලපෑමක් ඇති නොවේ

(.....)

31. පහත සඳහන් වත්කම් අතුරෙන් වඩාත් ද්‍රවශීල වත්කමක් වනුයේ කවරක් ද?
(1) ඉතුරුම් තැන්පතු (2) භාණ්ඩාගාර බිල්පත්
(3) ඉල්ලුම් තැන්පතු (4) භාණ්ඩාගාර බැඳුම්කර
(5) මූර්ත දේපොළ (Real estate) (.....)

32. වාණිජ බැංකුවක තැන්පතු ගිණුමෙහි ඔබ රුපියල් 10 000ක් තැන්පත් කරන්නේ යැයි සලකන්න. බැංකුව සියලු ම තැන්පතුවලින් 20%ක් සංචිත වශයෙන් තබා ගනී නම්, ඔබගේ තැන්පතුවේ ප්‍රතිඵල වශයෙන් නව තැන්පතු කොතරම් ප්‍රමාණයක් මැවීමට හැකි වේ ද?
(1) රුපි. 8 000 (2) රුපි. 10 000 (3) රුපි. 40 000 (4) රුපි. 50 000 (5) රුපි. 52 000 (.....)

33. මහ බැංකුව තම ප්‍රතිපත්ති පොලී අනුපාතිකය පහළ දැමූ විට පහත සඳහන් කවරක් සිදු වනු ඇත් ද?
(1) මුදලට ඇති ඉල්ලුම අඩුවීම සහ වෙළෙඳපොළ පොලී අනුපාතිකය පහළ වැටීම
(2) මුදලට ඇති ඉල්ලුම වැඩිවීම සහ වෙළෙඳපොළ පොලී අනුපාතිකය ඉහළ නැගීම
(3) මුදල් සැපයුම අඩුවීම සහ වෙළෙඳපොළ පොලී අනුපාතිකය පහළ වැටීම
(4) මුදල් සැපයුම ඉහළ යාම සහ වෙළෙඳපොළ පොලී අනුපාතිකය පහළ වැටීම
(5) මුදලට ඇති ඉල්ලුම, මුදල් සැපයුම සහ වෙළෙඳපොළ පොලී අනුපාතිකය ඉහළ නැගීම (.....)

34. වර්තමානයේ ශ්‍රී ලංකා මහ බැංකුව තම මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ දී මූලික අභිමතාර්ථය ලෙස සලකන්නේ
(1) මැදිකාලීන වශයෙන් උද්ධමනය මැදි තනි අගයක ස්ථායීව පවත්වා ගැනීම ය.
(2) රුපියලේ බාහිර වටිනාකම ස්ථායී අගයක පවත්වා ගැනීම ය.
(3) අයවැය හිඟය මූල්‍යයනය කිරීම සඳහා ආණ්ඩුවට පහසුකම් සලසා දීම ය.
(4) තිරසාර ආර්ථික වෘද්ධියක් අත්කර ගැනීම ය.
(5) රාජ්‍ය ණය බර අඩු කර ගැනීම ය. (.....)

35. මහ බැංකුව විවෘත වෙළෙඳපොළෙහි සුරැකුම්පත් අලෙවි කරන විට, මුදල් සැපයුමට සහ සමතුලිත පොළී අනුපාතිකයට කුමක් සිදු වන්නේ ද?

	මුදල් සැපයුම	සමතුලිත පොළී අනුපාතිකය
(1)	වැඩි වේ	වැඩි වේ
(2)	අඩු වේ	වැඩි වේ
(3)	වැඩි වේ	අඩු වේ
(4)	අඩු වේ	අඩු වේ
(5)	අඩු වේ	වෙනස් නොවේ


(.....)

36. ශුද්ධ පොදු භාණ්ඩයකට නිදසුනක් වනුයේ,

(1) සෞඛ්‍ය සේවාවයි.
(2) ජාතික කෞතුකාගාරයයි.
(3) ජාතික ආරක්ෂාවයි.
(4) දුම්රිය ප්‍රවාහන සේවයයි.
(5) අධ්‍යාපනයයි.

(.....)

37. කිසියම් විශේෂිත භාණ්ඩයක් සඳහා අදාළ ආන්තික පෞද්ගලික ප්‍රතිලාභ (MPB) සහ ආන්තික සමාජ ප්‍රතිලාභ (MSB) වක්‍රත්, වෙළෙඳපොළ සැපයුම් වක්‍රයත් (S) පහත රූපසටහනෙහි දැක්වේ.



මෙම වෙළෙඳපොළට ආණ්ඩුවේ මැදිහත්වීමක් නොතිබුණහොත්, සම්පත් බෙදා වෙන්කිරීමේ අකාර්යක්ෂමතාවක් හට ගැනීමට ඉඩ ඇත. මක් නිසාද යත්,

(1) නිදහස් වෙළෙඳපොළෙහි මිල ඉතා ඉහළ මට්ටමක තිබීම නිසා ය.
(2) H-J ප්‍රමාණයෙන් භාණ්ඩයේ අධි නිෂ්පාදනයක් හට ගැනීම නිසා ය.
(3) නිදහස් වෙළෙඳපොළෙහි නිමැවුම ඉතා ඉහළ මට්ටමක තිබීම නිසා ය.
(4) H-J ප්‍රමාණයෙන් එම භාණ්ඩයේ ඌන පරිභෝජනයක් හට ගැනීම නිසා ය.
(5) පරිභෝජනයේ සෘණ බාහිරතාවක් පැවතීම නිසා ය.

(.....)

38. මෑත වර්ෂවල ශ්‍රී ලංකාවේ රාජ්‍ය අයභාරය සහ දළ දේශීය නිෂ්පාදිතය අතර අනුපාතයත්, රාජ්‍ය වියදම සහ දළ දේශීය නිෂ්පාදිතය අතර අනුපාතයත් ආසන්න වශයෙන්

	අයභාරය/ද.දේ.නි. අනුපාතය (%)	වියදම/ද.දේ.නි. අනුපාතය (%)
(1)	15 - 16 කි.	25 - 26 කි.
(2)	12 - 13 කි.	24 - 25 කි.
(3)	13 - 14 කි.	20 - 21 කි.
(4)	10 - 11 කි.	15 - 16 කි.
(5)	15 - 16 කි.	18 - 19 කි.

(.....)

39. ශ්‍රී ලංකා රජයේ පුනරාවර්තන වියදමේ ප්‍රධාන සංරචක, මුළු වියදම තුළ ඒවා දරණ සාපේක්ෂ වැදගත්කම අනුව පෙළගස්වනු ලැබුවහොත් ඒවායේ අනුපිළිවෙළ වනුයේ

(1) කුටුම්බ සඳහා ලබා දුන් සංක්‍රාම, පොළී ගෙවීම්, වැටුප් හා වේතන වශයෙනි.
(2) වැටුප් හා වේතන, පොළී ගෙවීම්, කුටුම්බ සඳහා ලබා දුන් සංක්‍රාම වශයෙනි.
(3) රාජ්‍ය ආයතනවලට ලබා දුන් සංක්‍රාම, පොළී ගෙවීම්, වැටුප් හා වේතන වශයෙනි.
(4) කුටුම්බ සඳහා ලබා දුන් සංක්‍රාම, වැටුප් හා වේතන, පොළී ගෙවීම් වශයෙනි.
(5) පොළී ගෙවීම්, රාජ්‍ය ආයතනවලට ලබා දුන් සංක්‍රාම, කුටුම්බ සඳහා ලබා දුන් සංක්‍රාම වශයෙනි.

(.....)

40. මෑත වර්ෂවල දී ශ්‍රී ලංකාවේ රාජ්‍ය අයවැය හිඟය දේශීය මූලාශ්‍ර මගින් මූල්‍යයනය කිරීමේ දී, පුළුල් වශයෙන් භාවිත කළ ණය උපකරණය වූයේ

(1) භාණ්ඩාගාර බිල්පත් ය.
(2) භාණ්ඩාගාර බැඳුම්කර ය.
(3) රුපියල් සුරැකුම්පත් ය.
(4) ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර ය.
(5) මහ බැංකුවේ අත්තිකාරම් ය.

(.....)

41. ජපානයෙහි රෙදි ඒකකයක් නිෂ්පාදනය කිරීම සඳහා ශ්‍රම පැය 50ක් ද, සහල් ඒකකයක් නිෂ්පාදනය කිරීම සඳහා ශ්‍රම පැය 100ක් ද වැය වේ. තායිලන්තයෙහි රෙදි ඒකකයක් නිෂ්පාදනය කිරීම සඳහා ශ්‍රම පැය 200ක් ද, සහල් ඒකකයක් නිෂ්පාදනය කිරීමට ශ්‍රම පැය 200ක් ද වැය වේ. මෙම තත්ත්වය සඳහා පහත සඳහන් කවර ප්‍රකාශයක් නිවැරදි වේ ද?

(1) සහල් නිෂ්පාදනය සඳහා ජපානයට සාපේක්ෂ වාසි පවතී.
(2) සහල් නිෂ්පාදනය සඳහා තායිලන්තයට නිරපේක්ෂ වාසියක් පවතී.
(3) රෙදි නිෂ්පාදනය සඳහා ජපානයට සාපේක්ෂ වාසි පවතී.
(4) රෙදි නිෂ්පාදනය සඳහා තායිලන්තයට සාපේක්ෂ වාසි පවතී.
(5) රටවල් දෙක ම රෙදි නිෂ්පාදනය කළ යුතු ය. (.....)

42. අන්තර්ජාතික වෙළෙඳාම ඔස්සේ කිසියම් රටකට,

(1) තම නිෂ්පාදන හැකියා මායිමට පිටතින් නිෂ්පාදනය කිරීමටත්, පරිභෝජනය කිරීමටත් ඉඩ සැලසේ.
(2) තම නිෂ්පාදන හැකියා මායිම පිටතට විතැන් කර ගැනීමට හැකි වේ.
(3) තමන් නිපදවන සියලු ම භාණ්ඩවල ඒකක පිරිවැය පහළ දමා ගැනීමට හැකි වේ.
(4) තම පරිභෝජන හැකියාවන් නොවෙනස්ව තබාගෙන නිෂ්පාදන හැකියාව ප්‍රසාරණය කර ගැනීමට හැකි වේ.
(5) තම නිෂ්පාදන හැකියා මායිමෙන් පිටත පරිභෝජනය කිරීමට ඉඩ සැලසේ. (.....)

43. ගෙවුම් ශේෂයේ වර්තන ගිණුමේ සහ මූල්‍ය ගිණුමේ එකතුව

(1) ශූන්‍යයට සමාන වේ.
(2) එකට සමාන වේ.
(3) වෙළෙඳ ශේෂයට සමාන වේ.
(4) ප්‍රාග්ධන ගිණුමේ ශුද්ධ ශේෂයට සමාන වේ.
(5) ශුද්ධ ජාත්‍යන්තර සංචිත ප්‍රමාණයට සමාන වේ. (.....)


44. ජපන් යෙන් මුදල් ඒකකයේ ශ්‍රී ලංකා රුපියල් මිල සැලකිය යුතු ප්‍රමාණයකින් පහළ වැටුණහොත්

(1) ජපන් පාරිභෝගිකයන්ට ශ්‍රී ලංකාවේ භාණ්ඩ සාපේක්ෂව ලාභදායක වේ.
(2) ශ්‍රී ලාංකික පාරිභෝගිකයන්ට ජපානයේ භාණ්ඩ සාපේක්ෂව ලාභදායක වේ.
(3) ජපානය තුළ ශ්‍රී ලංකා රුපියල් සඳහා ඉල්ලුම වැඩි වේ.
(4) ජපන් සංචාරකයන් වැඩි වැඩියෙන් ශ්‍රී ලංකාවට පැමිණීම ධෛර්යමත් කෙරේ.
(5) ශ්‍රී ලාංකික සංචාරකයන් වැඩි වැඩියෙන් ජපානයට යාම අධෛර්යමත් කෙරේ. (.....)

45. එක්තරා ආර්ථිකයක ක්‍රය ශක්ති සාම්‍යය පදනම් කර ගත් ප්‍රතිශීර්ෂ දළ ජාතික ආදායම (GNI) කිසියම් කාලපරිච්ඡේදයකදී ඉහළ ගොස් තිබුණ ද, මානව සංවර්ධන දර්ශකය මගින් මනිනු ලබන සංවර්ධනය නොවෙනස්ව තිබිණි. මෙම දෙනස පැහැදිලි කළ හැක්කේ කෙසේ ද?

(1) ළමයින් පාසල් යතියි අපේක්ෂිත වර්ෂ ගණන ඉහළ යාම නිසා
(2) උපතේ දී ආයු අපේක්ෂාව පහළ වැටීම නිසා
(3) වැඩිහිටි සාක්ෂරතා අනුපාතිකය පහළ වැටීම නිසා
(4) උද්ධමන අනුපාතිකය ඉහළ යාම නිසා
(5) ජනගහන වර්ධන අනුපාතිකය ඉහළ යාම නිසා (.....)

46. එක්තරා ආර්ථිකයක කුටුම්බ ආදායම් ව්‍යාප්තියට අදාළ ලෝරන්ස් වක්‍රය පහත රූපසටහනෙහි දැක්වේ.



මෙම ආර්ථිකයේ ආදායම් ව්‍යාප්තියේ අසමානත්වය ජිනි සංගුණකය මගින් මනිනු ලබනුයේ,

(1) (A හි වර්ගඵලය + B හි වර්ගඵලය) ÷ C හි වර්ගඵලය මගිනි.
(2) B හි වර්ගඵලය ÷ C හි වර්ගඵලය මගිනි.
(3) A හි වර්ගඵලය ÷ (B හි වර්ගඵලය + C හි වර්ගඵලය) මගිනි.
(4) B හි වර්ගඵලය ÷ (B හි වර්ගඵලය + C හි වර්ගඵලය) මගිනි.
(5) C හි වර්ගඵලය ÷ (A හි වර්ගඵලය + B හි වර්ගඵලය) මගිනි. (.....)

47. දෙන ලද වර්ෂයක කිසියම් කල්පිත ආර්ථිකයක ශ්‍රම වෙළෙඳපොළට අදාළ දත්ත සමහරක් පහත වගුවේ දැක්වේ.

වැඩ කරන වයසේ ජනගහනය (මිලියන)	සේවා වියුක්ත ජනගහනය (මිලියන)	සේවා නියුක්ති අනුපාතිකය (%)
25	3	80

මෙම ආර්ථිකයේ ශ්‍රම හමුදා සහභාගිත්ව අනුපාතිකය

(1) 20% කි. (2) 30% කි. (3) 40% කි. (4) 50% කි. (5) 60% කි. (.....)

48. 2012/13 වර්ෂයේ ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණයට අනුව ශ්‍රී ලංකාවේ ඉහළ ම ජනගහන දරිද්‍රතා දර්ශකය සහිත දිස්ත්‍රික්ක තුන වනුයේ

(1) මුලතිව්, මොණරාගල සහ මන්නාරම ය. (2) මඩකලපුව, මන්නාරම සහ කිලිනොච්චිය ය.
(3) මන්නාරම, මුලතිව් සහ බදුල්ල ය. (4) මන්නාරම, මුලතිව් සහ කිලිනොච්චිය ය.
(5) මුලතිව්, මඩකලපුව සහ මොණරාගල ය. (.....)

49. ශ්‍රී ලංකාවේ නිරපේක්ෂ දරිද්‍රතා මට්ටමේ පහළ බැසීමක් හටගෙන තිබුණ ද සැලකිය යුතු ප්‍රමාණයේ ආදායම් විෂමතා අඛණ්ඩව පවතී. මෙය තහවුරු වන්නේ ධනවත් ම කුටුම්බ 10% මුළු කුටුම්බ ආදායමෙන් හිමි කර ගනු ලබන ප්‍රතිශතය

(1) 10.9%ක් වීමෙනි. (2) 14.9%ක් වීමෙනි. (3) 28.6%ක් වීමෙනි.
(4) 38.0%ක් වීමෙනි. (5) 57.5%ක් වීමෙනි. (.....)

50. පහත දැක්වෙන දෑ අතුරෙන් ශ්‍රී ලංකාවට විදේශීය සෘජු ආයෝජන ආකර්ෂණය කර ගැනීමෙහිලා ප්‍රබල බාධකයක් **නොවන්නේ** කවර කරුණක් ද?

(1) සාර්ව ආර්ථික අස්ථායී තත්ත්වයන්
(2) ශ්‍රම වෙළෙඳපොළේ දෘඪතාවන්
(3) ප්‍රතිපත්ති අවිනිශ්චිතතාව
(4) දූෂණය සහ නියාමනය දුර්වල වීම
(5) අපනයන ක්ෂේත්‍රයේ විවිධාංගීකරණය ප්‍රමාණවත් නොවීම (.....)

* * *


2.1.3 I ප්‍රශ්න පත්‍රය සඳහා පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

ප්‍රශ්න අංකය	පිළිතුර	ප්‍රශ්න අංකය	පිළිතුර
01.	4	26.	5
02.	5	27.	1
03.	4	28.	1
04.	1	29.	3
05.	1	30.	1
06.	5	31.	3
07.	2	32.	1
08.	2	33.	4
09.	5	34.	1
10.	5	35.	2
11.	5	36.	3
12.	1	37.	4
13.	4	38.	3
14.	4	39.	2
15.	1	40.	2
16.	3	41.	3
17.	1	42.	5
18.	2	43.	4
19.	5	44.	2
20.	4	45.	2
21.	4	46.	4
22.	1	47.	5
23.	5	48.	1
24.	3	49.	4
25.	2	50.	5

වගුව 5

නිවැරදි එක් පිළිතුරකට ලකුණු **02** බැගින් ලකුණු **100** කි.

2.1.4 I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ



සටහන 5

ඉහත සටහනට අනුව, I ප්‍රශ්න පත්‍රය සැලකිලිමේදී සමසුනාව අඩු ම ප්‍රශ්නය 09 වන ප්‍රශ්නය වේ. එහි සමසුනාව 10%කි. එසේම සමසුනාව වැඩි ම ප්‍රශ්නය වන්නේ, 02 වන ප්‍රශ්නය වන අතර, එහි සමසුනාව 97%කි. එනම්, අයදුම්කරුවන් අතුරෙන් වැඩි ම සිසුහු ඇති ප්‍රශ්නය 02 වන ප්‍රශ්නය වේ.

2.1.5 I ප්‍රශ්න පත්‍රයේ එක් එක් ප්‍රශ්නයෙහි වරණ තෝරා ඇති ආකාරය - ප්‍රතිශත ලෙස

ප්‍රශ්න අංකය	නිවැරදි වරණය	එක් එක් එක් වරණය තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය					
		1	2	3	4	5	ප්‍රතිචාර නොදැක්වූ
1	4	5.0%	1.1%	0.8%	92.1%	1.0%	0.0%
2	5	0.6%	0.8%	1.0%	0.9%	96.6%	0.0%
3	4	3.9%	1.5%	6.5%	86.3%	1.7%	0.0%
4	1	48.4%	12.2%	5.6%	22.6%	11.0%	0.2%
5	1	77.4%	8.7%	5.0%	4.2%	4.4%	0.3%
6	5	12.3%	10.4%	4.4%	7.0%	65.7%	0.2%
7	2	19.9%	57.1%	5.2%	9.6%	8.1%	0.2%
8	2	9.1%	59.2%	10.9%	15.4%	4.8%	0.5%
9	5	7.0%	36.3%	34.3%	11.8%	10.2%	0.4%
10	5	31.2%	12.1%	8.0%	14.6%	33.3%	0.8%
11	5	5.9%	17.4%	6.5%	14.1%	55.3%	0.7%
12	1	93.5%	2.2%	0.9%	1.9%	1.5%	0.1%
13	4	1.4%	11.9%	8.6%	74.6%	3.4%	0.1%
14	4	7.6%	11.6%	21.6%	52.0%	6.7%	0.5%
15	1	62.5%	12.4%	7.2%	9.3%	8.3%	0.3%
16	3	3.1%	2.4%	74.5%	12.2%	7.4%	0.5%
17	1	61.2%	4.9%	22.3%	4.2%	7.2%	0.3%
18	2	18.2%	31.1%	39.5%	6.0%	5.1%	0.1%
19	5	17.7%	6.7%	16.6%	2.8%	55.8%	0.4%
20	4	10.2%	26.1%	21.1%	12.9%	29.2%	0.5%
21	4	5.5%	12.1%	7.4%	66.9%	7.8%	0.3%
22	1	29.9%	18.4%	17.0%	10.6%	23.7%	0.5%
23	5	18.9%	5.7%	26.5%	11.6%	35.9%	1.4%
24	3	6.2%	10.3%	45.8%	9.5%	27.8%	0.4%
25	2	9.4%	69.8%	8.6%	7.4%	4.3%	0.4%
26	5	21.0%	17.4%	15.1%	15.8%	29.7%	0.9%
27	1	76.9%	8.1%	6.8%	4.8%	3.0%	0.5%
28	1	76.7%	9.6%	2.6%	4.0%	7.0%	0.1%
29	3	11.9%	15.7%	44.7%	11.3%	16.0%	0.4%
30	1	38.4%	12.4%	18.2%	11.6%	18.8%	0.6%
31	3	23.2%	12.6%	53.5%	4.7%	5.7%	0.2%
32	1	52.7%	9.0%	22.1%	13.3%	2.6%	0.3%
33	4	6.8%	16.1%	9.3%	48.3%	19.0%	0.6%
34	1	23.8%	23.5%	13.3%	16.0%	22.6%	0.8%
35	2	9.8%	48.4%	15.6%	10.6%	15.2%	0.4%
36	3	3.4%	10.9%	71.5%	4.2%	9.6%	0.4%
37	4	9.2%	15.6%	7.4%	48.6%	18.5%	0.7%
38	3	19.6%	19.6%	38.3%	10.9%	10.7%	1.0%
39	2	10.4%	55.9%	6.4%	18.6	8.3%	0.4%
40	2	13.7%	55.5%	9.4%	12.2%	8.8%	0.4%
41	3	15.5%	9.3%	61.0%	9.1%	4.8%	0.3%
42	5	20.0%	8.9%	4.3%	13.1%	53.4%	0.3%
43	4	9.2%	8.3%	30.6%	38.1%	13.2%	0.5%
44	2	21.5%	50.9%	8.8%	11.5%	7.0%	0.3%
45	2	11.4%	27.1%	11.8%	26.5%	22.5%	0.7%
46	4	9.1%	17.2%	25.0%	42.2%	5.9%	0.6%
47	5	30.3%	15.6%	15.8%	7.0%	30.4%	0.9%
48	1	34.1%	7.7%	6.9%	24.6%	26.2%	0.5%
49	4	11.0%	17.1%	25.9%	21.7%	23.1%	1.1%
50	5	7.8%	20.2%	8.4%	25.7%	37.5%	0.5%

වගුව 6

* එක් එක් ප්‍රශ්නය යටතේ නිවැරදි වරණය තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය අඳුරු පසුබිමෙහි දක්වා ඇත.
* ප්‍රතිචාර නොදැක්වූ යනුවෙන් දක්වා ඇත්තේ, ප්‍රශ්නය සඳහා වරණ තෝරා නැති හෝ එක් වරණයකට වඩා වැඩියෙන් වරණ තෝරා ඇති හෝ අපේක්ෂක ප්‍රතිශතයයි.

2.1.6 I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා


- ★ අපේක්ෂකයින් 97% ක් වූ වැඩි ම ප්‍රතිශතයක් නිවැරදි පිළිතුරු සපයා ඇත්තේ අංක 2 ප්‍රශ්නයට ය.
- ★ අපේක්ෂකයින් 10% ක් වූ අඩු ම ප්‍රතිශතයක් නිවැරදිව පිළිතුරු සපයා ඇත්තේ අංක 9 ප්‍රශ්නයට ය.
- ★ සමස්තයක් ලෙස සලකා බලන විට 60% හෝ 60% ට වඩා වැඩි ප්‍රතිශතයක් ලබා ගත් ප්‍රශ්න අංක 1, 2, 3, 5, 6, 12, 13, 15, 16, 17, 21, 25, 27, 28, 36, 41 වේ.
- ★ අපේක්ෂකයන් 40% ට අඩු ප්‍රතිශතයක් ලබා ගෙන ඇත්තේ ප්‍රශ්න අංක 9, 10, 18, 20, 22, 23, 26, 30, 34, 38, 43, 45, 47, 48, 49, 50 යන ප්‍රශ්නවලටය.
- ★ 9 වන ප්‍රශ්නයට අඩු අපේක්ෂකයන් ප්‍රමාණයක් (10.2%) නිවැරදි පිළිතුර ලබා දී ඇත. ඊට හේතු වී ඇත්තේ අපේක්ෂකයින් ඉල්ලුම් නීතිය පිළිබඳ නිසි අවබෝධයක් නොමැති වීමයි. "A භාණ්ඩයේ මිල පහළ බසින විට B භාණ්ඩයේ ඉල්ලුම ඉහළ ගොස් ඇත." යන්න අවධාරණය කොට ගෙන නැත. මෙම භාණ්ඩ දෙක අනුපූරක භාණ්ඩ යුගලයක් බව පැහැදිළිව පෙනෙන්නේ සම්බන්ධය ප්‍රතිලෝම බැවිනි. එහෙත් A භාණ්ඩයට ප්‍රතිචාර සාමාන්‍ය ආකාරයට දක්වා B භාණ්ඩයේ ඉල්ලුම ඉහළ යාමෙන් පෙන්නුම් කරන්නේ එය සාමාන්‍ය භාණ්ඩයක් බවයි. නමුත් A භාණ්ඩයේ මිල පහළ යාමක් සිදු වුවද ඒ කෙරෙහි ඉල්ලුම් ප්‍රමාණය දක්වන ප්‍රතිචාරය ගැන අවබෝධයක් නැති නිසා එය සාමාන්‍ය භාණ්ඩයක් යැයි කිව නොහැක. නමුත් මතුපිට පවතින තත්ත්වය පමණක් බලා නිවැරදි පිළිතුර තේරීමට නැඹුරුවීමේ හේතුවෙන් වැඩි පිරිසක් 2 හා 3 වරණ තෝරාගෙන ඇත.
- ★ 10 වන ප්‍රශ්නය හරස් ඉල්ලුම් නම්‍යතාව පිළිබඳ ප්‍රශ්නයකි. නිවැරදි වරණය තෝරා ඇති සිසුන්ගේ ප්‍රතිශතය 33.3% කි. නමුත් වැරදි වරණයක් වූ පළමු වරණය තෝරා ඇති සිසුන්ගේ ප්‍රතිශතය 31.2% කි. මෙයට හේතුව ගණනය කිරීමේ දී සිදු වූ දෝෂයන්ය.
  හරස් ඉ. නම්‍යතාව

$$\frac{\Delta Q_x\%}{\Delta P_y\%} = 3 = \frac{30\%}{\Delta P\%}$$

$$= \Delta P\% = \frac{30\%}{3}$$

$$= \Delta P\% = 10\%$$

  මේ අනුව මිල 10% න් වැඩි විය යුතුය. එම වැඩි වීම නිරපේක්ෂව සිතා රු. 80 සිට රු. 90 දක්වා යන්න බොහෝ සිසුන් තෝරා ගෙන ඇත. නමුත් රු. 80 කින් 10% ක් වන්නේ රු. 8/- කි. ඒ අනුව 80 සිට 88 දක්වා මිල වෙනස් විය යුතුය.
- ★ 18 වන ප්‍රශ්නය පූර්ණ තරගකාරී වෙළෙඳපොළක ලක්ෂණ පිළිබඳ ප්‍රශ්නයකි. නිවැරදි වරණය තෝරන ලද සිසුන් සංඛ්‍යාව 31.1% කි. නමුත් වැරදි වරණයක් වූ තුන්වන වරණය 39.5% ක් තෝරා ඇත. මෙයට ප්‍රධාන හේතුවක් වන්නේ වෙළෙඳපොළ හා ආයතනය යන්න නිවැරදිව අවබෝධ කොට ගෙන නොතිබීමයි. ආයතනයේ ඉල්ලුම් වක්‍රය පූර්ණ නම්‍ය වුවද වෙළෙඳපොළ ඉල්ලුම් වක්‍රය වමේ සිට දකුණට බැවුම් වේ. එසේම වැරදි වරණයක් වුව ද 3 වන වරණය සිසුන් බහුතරයක් විසින් තෝරා ගනු ලැබ ඇත්තේ දිගම පිළිතුර නිසා විය යුතුය.



★ ප්‍රශ්න අංක 20 ට නිවැරදි පිළිතුරු සපයා ඇති අපේක්ෂකයින්ගේ සංඛ්‍යාව 13% කි. මෙය නිෂ්පාදන පිරිවැය හා අයභාරය සම්බන්ධ වූ ලාභය පිළිබඳ ප්‍රශ්නයකි. දී ඇති දත්ත අනුව පහත තොරතුරු ලැබේ.

නිමැවුම	මිල	මුළු අයභාරය	මුළු පිරිවැය	මුළු විචල්‍ය පිරිවැය
500	6	3000 (500 × 6)	5000	4000 (5000 - 1000)

මෙම දත්ත අනුව පැහැදිළි වන්නේ නිමැවුම 500 දී ආන්තික අයභාරය හා ආන්තික පිරිවැය (රු.6/-) සමාන වන බවයි. එබැවින් එය ලාභ උපරිම නිමැවුමයි. එහෙත් එම අවස්ථාවේ දී මුළු අයභාරය මුළු විචල්‍ය පිරිවැයවත් පියවා ගැනීමට ප්‍රමාණවත් නැති බව ඉහත දත්තවලින් පැහැදිළි වේ. මේ නිසා ආයතනය නිෂ්පාදනය කිරීමෙන් වැළැකී සිටිය යුතුය.

★ 22 වන ප්‍රශ්නයට නිවැරදි පිළිතුරු සපයා ඇති අපේක්ෂකයින් සංඛ්‍යාව 29.9% කි. එය දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය පිළිබඳ ගැටලුවකි. දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනයට ඇතුළත් වන දෑ නිවැරදිව හඳුනාගත නොහැකි වීම මීට හේතුව වේ. නව නිවාස ඉදිකිරීම පරිභෝජනයට අයත් දෙයක් වුවද එය ජාතික ගිණුම්වල දී ඇතුළත් කරන්නේ ස්ථාවර ප්‍රාග්ධන භාණ්ඩයක් ලෙසය.

★ 23 වන ප්‍රශ්නයට නිවැරදි පිළිතුරු සපයා ඇත්තේ අපේක්ෂකයින්ගෙන් 35.9% ක ප්‍රතිශතයකි. මීට හේතුව නම් මූර්ත නිමැවුම හා මිල මට්ටම වෙනස්වීම යන්න නිවැරදිව අවබෝධ කර නොගැනීමය. පවත්නා මිල යටතේ දළ දේශීය නිෂ්පාදිතය ඉහළ ගොස් ඇත්තේ 8% කිනි. එසේම මූර්ත නිමැවුමේ 2% ක පහළ යාමක්ද ඇත. ඒ අනුව පැහැදිළි වන්නේ නිමැවුමේ අඩුවීම 2% ද ඉක්මවමින් තවත් 8% කින් මිල මට්ටම ඉහළ යාම නිසා නිමැවුමේ නාමික වටිනාකම වැඩි වී ඇති බවයි. මේ අනුව පොදු මිල මට්ටමේ ඉහළ යාම 10% ක් විය යුතුය.

★ 26 වන ප්‍රශ්නයට නිවැරදි පිළිතුරු සපයා ඇති අපේක්ෂකයින් සංඛ්‍යාව 29.7% කි. මෙය සාර්ව ආර්ථික සමතුලිතය පිළිබඳ ගැටලුවකි. වියදම් ගුණකය හා බදු ගුණකය ආශ්‍රයෙන් නිමැවුම වෙනස්වන ආකාරය පිළිබඳ අවබෝධයක් නොමැති බව පෙනේ. මෙම ප්‍රශ්නයට අනුව පූර්ණ සේවා නියුක්ති මට්ටම දක්වා ආදායම වැඩි විය යුතු ප්‍රමාණය වන්නේ රුපියල් බිලියන 1000 (ΔY) කි. MPS = 0.2 වන නිසා වියදම් ගුණකය = $\frac{1}{1 - MPC}$ වන අතර, බදු ගුණකය = $\frac{MPC}{1 - MPC}$ වේ.

ඒ අනුව වියදම් ගුණකය $\frac{1}{0.2} = 5$ කි.

බදු ගුණකය $\frac{0.8}{0.2} = 4$ කි.

$\Delta Y = K \times \Delta E$ වන නිසා

$1000 = 5 \times \Delta E = 200$ වේ.එනම් පූර්ණ සේවා නියුක්ති ආදායම් මට්ටමට ළඟා වීම සඳහා රාජ්‍ය වියදම් 200 න් ඉහළ දැමිය යුතුය.

$\Delta Y = K_T \times \Delta T$ වන නිසා,

$1000 = 4 \times \Delta T = -250$ වේ. එනම් පූර්ණ සේවා නියුක්ති මට්ටමට ළඟා වීම සඳහා බදු රු. මි 250 ක් අඩු කළ යුතුය.

ඉහත ප්‍රශ්නයේ දී ඇති පිළිතුරුවලට අනුව නිවැරදි පිළිතුර වනුයේ බදු රු.මි. 250 කි න් අඩු කළ යුතුය යන (5) වන පිළිතුරයි.

★ 30 වන ප්‍රශ්නයට නිවැරදි පිළිතුරු සපයා ඇති අපේක්ෂකයින් සංඛ්‍යාව 38.4% කි. වැටි බදු නිසා ඉල්ලුමෙන් හා පිරිවැයෙන් උද්ධමනයට වන බලපෑම, මෙම ප්‍රශ්නයෙන් විමසා තිබුණි. මෙහිදී බදු අය කිරීමෙන් භාණ්ඩ මිල ඉහළ යන නිසා ඉල්ලුම අඩු වන බවත්, මේ නිසා ඉල්ලුමෙන් ඇදුණු උද්ධමනය අඩු වන බවත් අපේක්ෂකයන් දැන ගත යුතුවේ. එසේම බදු නිසා පිරිවැය වැඩි වී සැපයුම අඩු වීම උද්ධමනයක් ඇති වීමට හේතුවන බවත් දැන ගත යුතුය.

★ 34 වන ප්‍රශ්නයට නිවැරදි පිළිතුරු සපයා ඇති අපේක්ෂකයින් සංඛ්‍යාව 23.8% කි. නව මූල්‍ය ප්‍රතිපත්ති වෙනස් වීම පිළිබඳ දැනුම යාවත්කාලීන නොවීම මීට හේතුවයි. මහ බැංකු වාර්තාව පරිශීලනය කිරීම ආදිය තුළින් දැනුම යාවත්කාලීන කර ගත හැකිය.

★ 38 වන ප්‍රශ්නයට නිවැරදි පිළිතුරු සපයා ඇති අපේක්ෂකයින් සංඛ්‍යාව 38.3% කි. මහ බැංකු වාර්තාව ආදී මූලාශ්‍ර පරිශීලනය කිරීම තුලින් දැනුම යාවත්කාලීන කර ගත යුතුය. ශ්‍රී ලංකාවේ රාජ්‍ය අයභාරය, රාජ්‍ය වියදම්, මූලික ආර්ථික දත්ත පිළිබඳ අවබෝධය අවශ්‍යයෙන්ම තිබිය යුතුය.

★ 43 වන ප්‍රශ්නයට නිවැරදි පිළිතුරු ලබා දී ඇති අපේක්ෂකයින් සංඛ්‍යාව 38.1% කි. ගෙවුම් ශේෂ ලේඛනයේ ආකෘතිය සහ ද්විත්ව සටහන් මූලධර්ම පිළිබඳ නිවැරදි අවබෝධයක් නොමැති වීම මීට හේතුවයි. ද්විත්ව සටහන් මූලධර්මය අනුව ගෙවුම් තුලන ලේඛනයේ ගනුදෙනු සටහන් කිරීමට හුරු වන පරිදි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සකස් කර ගත යුතුය.

★ 45 වන ප්‍රශ්නය මානව සංවර්ධනයට ඇතුළත් සංරචක පිළිබඳ අවබෝධය විමසා ඇත. එහෙත් එය නිසිලෙස අවබෝධ කරගෙන නො තිබූ නිසා, මෙම ප්‍රශ්නයේ පහසුතාව 27.1% ක් වී ඇත. මෙම දර්ශකයෙහි පවතින සංරචක තහවුරු වන ආකාරයට ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සකස් විය යුතුය.

★ 47 වන ප්‍රශ්නය ආර්ථිකයක ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය ගණනය කිරීම පිළිබඳ ප්‍රශ්නයකි. මෙයට නිවැරදි පිළිතුරු සපයා ඇත්තේ 30.4% ක් පමණි. මෙය ගණනය කරන ආකාරය සිසුන් නොදැන සිටීම මෙයට ප්‍රබල හේතුවක් වන අතරම සේවා නියුක්තිය දී ඇත්තේ අනුපාතිකයක් ලෙසටය.එය සේවා නියුක්ත ජන සංඛ්‍යාව බවට පරිවර්තනය කර ගත යුතුය.

සේවා වියුක්ත ජන සංඛ්‍යාව = මි. 3

සේවා නියුක්ත ජන සංඛ්‍යාව = $\frac{3}{20} \times 80$

= 12

ශ්‍රම බලකාය සහභාගිත්ව අනුපාතිකය = $\frac{\text{සේවා වියුක්ත ජන සංඛ්‍යාව} \times \text{සේවා නියුක්ත ජන සංඛ්‍යාව}}{\text{වැඩ කළ හැකි වයසේ ජන සංඛ්‍යාව}} \times 100$

= $\frac{3 + 12}{25} \times 100$

= $\frac{\cancel{15}}{\cancel{25}} \quad \frac{3}{5} = 0.6 \times 100$

= $\underline{\underline{60\%}}$

★ 48 වන ප්‍රශ්නයට නිවැරදි පිළිතුරු සපයා ඇත්තේ 34.1% ක ප්‍රතිශතයකි. දැනුම යාවත්කාලීන කර ගැනීමට හැකි වන විවිධ මූලාශ්‍ර පරිශීලනය කිරීමට පෙළඹිය යුතුය. විශේෂයෙන්ම මහ බැංකු වාර්තාව මෙන්ම ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ තොරතුරු අන්තර්ජාලයෙන් ලබා ගැනීම වැදගත් වේ.

★ 49 වන ප්‍රශ්නයට නිවැරදි පිළිතුරු ලබා දුන් අපේක්ෂකයින් සංඛ්‍යාව 21.7% කි. සාපේක්ෂ ආදායම් ව්‍යාප්තිය සහ දරිද්‍රතාව අතර පවත්නා සම්බන්ධතාව පදනම් කර ගනිමින් තර්කානුකූල තීරණ ගැනීමේ හැකියාව වැඩි දියුණු වන ආකාරයට ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සකස් විය යුතුය.

★ 50 වන ප්‍රශ්නයට නිවැරදි පිළිතුරු සපයා තිබූ ප්‍රතිශතය 37.5% කි. තර්කානුකූලව පිළිතුරු සඳහා බලමින් නිවැරදි පිළිතුර තෝරා ගැනීමේ හැකියාව වැඩි දියුණු කළ යුතුය. ශ්‍රී ලංකාවේ සමකාලීන ආර්ථික ප්‍රශ්න සහ අභියෝග පිළිබඳව නිවැරදි අවබෝධයක් අපේක්ෂා කෙරේ.

2.2. II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.2.1. II ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

කාලය පැය 03කි.

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් යුක්ත ය.

'අ' කොටස - ව්‍යුහගත රචනා වර්ගයේ ප්‍රශ්න 05කි.

'ආ' කොටස - ව්‍යුහගත රචනා වර්ගයේ ප්‍රශ්න 05කි.

අවම වශයෙන් එක් කොටසකින් ප්‍රශ්න 02 බැගින් තෝරාගෙන ප්‍රශ්න 05කට පිළිතුරු සැපයිය යුතුයි. එක් ප්‍රශ්නයකට ලකුණු 20 බැගින් මුළු ලකුණු 100කි.

අවසාන ලකුණු ගණනය කිරීම

I පත්‍රය	සඳහා ලකුණු	=	100
II පත්‍රය	සඳහා ලකුණු	=	100
අවසාන ලකුණ = 200 ÷ 2		=	100


2.2.2 II ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා

★ **II** පත්‍රය සඳහා පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ ප්‍රස්තාර අංක **2, 3, 4.1** සහ **4.2** ඇසුරින් ඉදිරිපත් කර ඇත.

"අ" කොටස

01 ප්‍රශ්නය

1. (i) සිවිල් භාණ්ඩ සහ මිලිටරි භාණ්ඩ පමණක් නිෂ්පාදනය කරනු ලබන එක්තරා ආර්ථිකයකට අදාළ නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක් පහත රූපසටහනෙහි දැක්වේ. එම ආර්ථිකය දැනට K ලක්ෂ්‍යයෙහි නිෂ්පාදනය කරමින් සිටී යයි සලකන්න.



(අ) මෙම ආර්ථිකයේ නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය, වැඩෙන ආවස්ථික පිරිවැය පිළිබිඹු කරන්නේ ද? පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

(ආ) මෙම ආර්ථිකය යුද්ධයකට එළැඹෙන්නේ නම්, නිෂ්පාදන ලක්ෂ්‍යය වෙනස් වීමට වඩාත් ඉඩක් ඇත්තේ K ලක්ෂ්‍යයේ සිට කවර ලක්ෂ්‍යයක් කරා ද? පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

(ඉ) ආර්ථිකය ප්‍රතිගමනයකට හෙවත් පසුබෑමකට මුහුණ දෙනු ලැබුවහොත්, නිෂ්පාදන ලක්ෂ්‍යය වෙනස් වනුයේ K ලක්ෂ්‍යයේ සිට කවර ලක්ෂ්‍යයක් කරා ද? පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

(ii) ශ්‍රමික විභාජනය, ආර්ථිකයක නිෂ්පාදන මට්ටම ඉහළ නැංවීමට හේතු වන්නේ ඇයි දැයි පැහැදිලි කෙරෙන හේතු **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) හිඟකම පිළිබඳ සංකල්පය, නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක් ආධාර කර ගනිමින් පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(iv) වෙළෙඳපොළ ආර්ථිකයක මිල ගණන් කවර කාර්යයන් ඉටු කරනු ලැබේ ද? (ලකුණු 03 යි)

(v) විධාන ආර්ථිකයක අවාසි කවරේ දැයි සඳහන් කරන්න. (ලකුණු 04 යි)

අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

1. (i) (අ) - ඔව් **(ලකුණු 01 යි)**

- මෙම ආර්ථිකයේ නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය මූලයට අවතලව පිහිටා ඇත. ඉන් අදහස් වන්නේ, සිවිල් භාණ්ඩ නිෂ්පාදනය වැඩි කරනු ලබන සෑම අතිරේක ඒකකයක් පාසාම, මිලිටරි භාණ්ඩවලින් මනිනු ලබන ආවස්ථික පිරිවැය (රේඛාවේ බෑවුමෙන් දැක්වෙන ආකාරයට) ඉහළ නගින බවය. ඒ අන්දමටම, මිලිටරි භාණ්ඩ නිෂ්පාදනය වැඩි කරන විට ද, සිවිල් භාණ්ඩවලින් දැක්වෙන ආවස්ථික පිරිවැය ඉහළ නගී. **(ලකුණු 01 යි)**

(ආ) - T ලක්ෂ්‍යය වේ. **(ලකුණු 01 යි)**

- යුද්ධය කිරීම සඳහා මිලිටරි භාණ්ඩ යොදාගත යුතු වන බැවින් විශාල වශයෙන් (මුළුමනින්ම නොව) මිලිටරි භාණ්ඩ ඇතුළත් කාර්යක්ෂම නිෂ්පාදන ලක්ෂ්‍යක් තෝරා ගනු ලැබේ. M ලක්ෂ්‍යය තෝරා නොගනුයේ එහි දී කිසිදු සිවිල් භාණ්ඩයක් නිෂ්පාදනය නොවන බැවිනි. අවම ජීවන මට්ටමක් පවත්වාගෙන යාම සඳහා සිවිල් භාණ්ඩ ද කිසියම් ප්‍රමාණයක් අවශ්‍ය කෙරේ. **(ලකුණු 01 යි)**

(ඉ) - U ලක්ෂ්‍යය වේ. **(ලකුණු 01 යි)**

- ආර්ථික ප්‍රතිගමනයක් හෙවත් පසුබැසීමක් ලෙස සැලැකෙනුයේ සමාහාර ඉල්ලුමෙහි ඌනතාවක් නිසා අවම වශයෙන් මාස 6 ක පමණ කාලයක් මුළුල්ලේ ආර්ථිකය විශාල පසුබෑමකට මුහුණ දීමය. එය කෙටි කාලීන ප්‍රපංචයක් වන බැවින් ආර්ථිකයේ නිෂ්පාදන ධාරිතාවට (විභව නිමැවුම) බලපෑමක් නොකරයි. එහෙත් ප්‍රතිගමනයක දී ආර්ථිකයේ පවත්නා නිෂ්පාදන ධාරිතාව ඌන උපයෝජනයකට ලක්වන බැවින්, එම තත්වය නිරූපණය කරනුයේ නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයේ ඇතුළත ලක්ෂ්‍යයක් මගිනි. **(ලකුණු 01 යි)**

(ii) - ශ්‍රමික විභාජනය නිසා නිෂ්පාදන ක්‍රියාවලියේ කුඩා කුඩා අංශ කෙරෙහි සේවකයන් අනුයුක්ත කළ හැකි වන බැවින් විශේෂ ප්‍රාගුණ්‍යතයකට අවස්ථාව සැලැසේ. විවිධ පුද්ගලයන්ගේ නිපුණතා, හැකියා හා බැඳියාවන් වෙනස් බැවින් තමන්ට වඩාත් ගැළපෙන ක්‍රියාකාරකම් තෝරාගෙන ඒවායේ නිරතවීමෙන් ශ්‍රම ඵලදායිතා ඉහළ නගී. කිසියම් සේවකයෙකුට ක්‍රියාකාරකම් සමූහයක් කිරීමට සිදු වුවහොත් ඒ සියලු ක්‍රියාකාරකම් පිළිබඳ එක හා සමාන දක්ෂතාවක් ඔහුට නොතිබෙන බැවින් ඔහුගේ ඵලදායිතාව අඩු ය.

- කිසියම් ක්‍රියාකාරකමක විශේෂ ප්‍රාගුණ්‍යතය කරනු ලබන සේවකයෝ එම කටයුත්ත වඩාත් ඉක්මනින් සහ වඩාත් ගුණාත්මකව කිරීමට ඔහු ඉගෙන ගනිති. සැබැවින්ම විශේෂ ප්‍රාගුණ්‍යය කළ සේවකයන්ට තමන්ගේ ක්‍රියාකාරකම වඩාත් ඉක්මනින් සහ හොඳින් ඉටුකිරීමට හැකි අන්දමේ නව්‍යතාවන් යෝජනා කිරීමට ද පිළිවන.


- ශ්‍රමික විභාජනය හා ඒ ආශ්‍රිත විශේෂ ප්‍රාගුණ්‍යතය ඔස්සේ පරිමාණානුකූල පිරිමැසුම් වාසි අත්කර ගැනීමට ද ව්‍යාපාරිකයන්ට හැකියාව ලැබේ. විශාල නිමැවුම් ප්‍රමාණයක් එක් එක් නිෂ්පාදන ක්‍රියාවලිය තුළ නිපදවන බැවින් ඒවායේ ඒකක පිරිවැය පහළ බසී.

- නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා යන්ත්‍ර භාවිතා කිරීමට ඇති ඉඩ කඩ විශාල වේ. නිෂ්පාදන ක්‍රියාවලිය කුඩා ක්‍රියාකාරකම්වලට වෙන් කොට ඇති බැවින් එක් එක් ක්‍රියාකාරකමට යෝග්‍ය යන්ත්‍ර සූත්‍ර උපකරණ හඳුන්වා දෙමින් ඵලදායිතාව ඉහළ නංවා ගත හැකි වේ.

- සේවකයන්ට එක් ක්‍රියාවලියක සිට තවත් ක්‍රියාවලියක් කරා නිතර නිතර මාරු වීමේ අවශ්‍යතාවක් පැන නොනගින බැවින් ශ්‍රමික විභාජනය නිසා ශ්‍රමික කාලය අපතේ යාමක් ද සිදු නොවේ.

(එක් කරුණකට ලකුණු 01 බැගින් ඕනෑම කරුණු තුනකට ලකුණු 03 යි)

(iii) - මිනිස් වුවමනා සපුරා ගැනීම සඳහා පවත්නා සම්පත් ප්‍රමාණය සීමිත වීම හිඟකම වශයෙන් අදහස් කෙරේ. මිනිස් වුවමනා අසීමිත වන අතර ඒවා තෘප්තිමත් කර ගැනීමට තිබෙන සම්පත් ප්‍රමාණය ඉතා සීමිත වේ. **(ලකුණු 02 යි)**



නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක් පෙන්නුම් කරනුයේ යම් දෙන ලද අවස්ථාවක ආර්ථිකයේ පවත්නා සම්පත් සම්භාරය පවත්නා තාක්ෂණය යටතේ කාර්යක්ෂම ලෙස උපයෝජනය කරනු ලැබුව හොත්, අත්කර ගත හැකි උපරිම භාණ්ඩ ප්‍රමාණයන් ය. මෙම රූප සටහනෙහි b, c සහ d වැනි ලක්ෂ්‍යයන් අත්කර ගත හැකි ලක්ෂ්‍යයන් වේ. නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයෙන් දකුණු පසට ඇති a ලක්ෂ්‍යය වැනි නිෂ්පාදන සංයෝගයක් මෙම අවස්ථාවේ දී අත්කර ගත හැකි නොවේ. a ලක්ෂ්‍යය මිනිස් වුවමනා පෙන්නුම් කරනු ලබන භාණ්ඩ සංයෝගයක් වශයෙන් සලකනු ලැබුවහොත්, පවත්නා සම්පත් සම්භාරය හා තාක්ෂණය යටතේ එම ලක්ෂ්‍යයෙහි නිෂ්පාදනයක් කිරීමට ආර්ථිකයට හැකියාවක් නැත. මේ අන්දමින් නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයට පිටතින් පිහිටි අත්කර ගත නොහැකි භාණ්ඩ සංයෝගය දැක්වෙන ලක්ෂ්‍යයන් හිඟකම නිරූපණය කරයි.

(නිවැරදි ප්‍රස්තාරයට ලකුණු 01 යි, පැහැදිලි කිරීමට ලකුණු 01 යි)

(iv) - සංඥා සැපයීමේ කාර්යය : වෙළෙඳපොළ තුළ කටයුතු කරන ආර්ථික ඒකකයන්ට (පාරිභෝගිකයන් සහ නිෂ්පාදකයන්ට) තීරණ ගැනීම සඳහා අදාළ තොරතුරු මිල සංඥා මගින් ලබා දීම. **(ලකුණු 01 යි)**


- සානුබල සැපයීමේ කාර්යය : සැපයුම්කරුවන් සහ විකුණුම්කරුවන් විසින් මිල සංඥා කෙරෙහි කාර්යක්ෂම ලෙස ප්‍රතිචාර දැක්වීමට අවශ්‍ය කෙරෙන සානුබල ලබාදීම. **(ලකුණු 01 යි)**

- සළාකන කාර්යය : හිඟ සම්පත් විකල්ප භාවිත අතර බෙදා වෙන්කොට දීම හෙවත් සළාක කොටදීම. **(ලකුණු 01 යි)**

(v)
- සමාජයීය අවශ්‍යතා නොසළකා හැරේ.
- පාරිභෝගික ස්වාධිපත්‍යය සහ තේරීමේ නිදහස අහිමි වේ.
- සම්පත් හා දේපොළ පිළිබඳ පෞද්ගලික හිමිකමට ඉඩක් නොමැති බැවින් වෙහෙසී වැඩකිරීමට සානුබල නොපවතී.
- සානුබල නොපවතින බැවින් නව්‍යතාවන් සංවර්ධනය සඳහා යොමුවීම වැළැක්වේ.
- තරගය නොමැති බැවින් අකාර්යක්ෂමතා ඇත.
- මිල පාලනයන් නිසා කළුකඩ පැන නැගීමේ ප්‍රවණතාවක් ඇත.
- ආර්ථිකයේ සම්බන්ධීකරණය සහ කළමනාකරණය ගැටලුකාරී වේ.
- නිලධාරීවාදය
- රාජ්‍ය ඒකාධිකාරය
- ආර්ථික වෘද්ධිය මන්දගාමී වීම.


(එක් කරුණකට ලකුණු 01 බැගින් ඕනෑම කරුණු හතරකට ලකුණු 04 යි)

01 වන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :



01 ප්‍රශ්නයට අයදුම්කරුවන්ගෙන් 96.38%ක් පමණ පිළිතුරු සපයා ඇත (ප්‍රස්තාරය 2). මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ.

ඉන් ලකුණු 0 - 5 ප්‍රාන්තරයේ 10%ක් පමණ ද
ලකුණු 6 - 10 ප්‍රාන්තරයේ 18%ක් පමණ ද
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 33%ක් පමණ ද
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 39%ක් පමණ ද
ලකුණු ලබාගෙන ඇත.



මෙම ප්‍රශ්නයට කොටස් 05ක් ඇත. පහසුතාව අඩු ම කොටස (i) (ආ) වන අතර, එහි පහසුතාව 51%කි. එමෙන්ම (iv) කොටස පහසු ම කොටස වී ඇති අතර එහි පහසුතාව 82%කි.

පළමු ප්‍රශ්නය තෝරාගත් අපේක්ෂකයින්ගේ ප්‍රතිශතය 96.38% කි. මෙහි පළමු කොටසෙහි 'අ' කොටසේ පහසුතාව 76% කි. වැඩි වන ආවස්ථික පිරිවැය සංකල්පය වැඩි දෙනෙක් අවබෝධ කරගෙන සිටි බව පැහැදිලි වේ.

එහෙත් 'ආ' කොටසෙහි පහසුතාව 51% කි. මෙම ප්‍රශ්නයෙන් අසා තිබුණේ යුද්ධයකට එළඹෙන්නේ නම්, නිෂ්පාදන ලක්ෂ්‍යය වෙනස් වීමකට ඉඩ ඇත්තේ K ලක්ෂ්‍යයේ සිට කවර ලක්ෂ්‍යයකටද යන්නය. මෙහි K ලක්ෂ්‍යය වක්‍රය මත පිහිටා ඇත. එය නිෂ්පාදන කාර්යක්ෂමතාවය යටතේ පවතින ලක්ෂ්‍යයක් වන අතර වැඩිපුර සම්පත් බෙදා වෙන්කර ඇත්තේ සිවිල් භාණ්ඩ නිෂ්පාදනයකටය. නමුත් යුද්ධයකට එළඹෙන විට වැඩි සම්පත් ප්‍රමාණයක් බෙදා වෙන් කළ යුතු වන්නේ මිලිටරි භාණ්ඩ සඳහාය. මේ නිසා K සිට T දක්වා ලක්ෂ්‍යය වෙනස් වේ.

මෙහි II, III හා IV යන අනු කොටස් සඳහා ලබා දී ඇති පිළිතුරු සම්බන්ධව ගැටලු පැවතියේ අවම ප්‍රමාණයකි. මෙහි පහසුතාව පිළිවෙළින් 71%, 74%, හා 82% වේ. අපේක්ෂකයින් බහුතරය හොඳින් පිළිතුරු ලියා ඇති බව පැහැදිලි වේ.

එහෙත් V අනු කොටසෙහි පහසුතාව 54% ක් වේ. මෙමගින් විමසා ඇත්තේ විධාන ආර්ථිකයක අවාසි වේ. නමුත් පිළිතුරු ප්‍රමාණවත්ව නැත.

- තරගය නැති නිසා අකාර්යක්ෂම නිෂ්පාදනයක් බිහිවන බව,
- සානුබල ප්‍රමාණවත් නොවන නිසා නවෝත්පාදන බිහි නොවන බව, .රාජ්‍ය ඒකාධිකාරය, නිළධාරි වාදය, ආර්ථික වෘද්ධිය මන්දගාමී වීම, මිල පාලනය නිසා කළුකඩ මිල පැන නැගීම, පාරිභෝගික ස්වාධිපත්‍ය සහ තේරීමේ නිදහස අහිමි වීම ආදිය සාර්ථක පිළිතුරක ඇතුළත් විය යුතුය.

02 ප්‍රශ්නය

2. (i) කිසියම් භාණ්ඩයක ඉල්ලුම කෙරෙහි බලපෑ හැකි එම භාණ්ඩයේ මිල හැර අන් සාධක සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(ii) ඉල්ලුම වෙනස්වීම සහ ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය වෙනස්වීම අතර වෙනස දක්වන්න. (ලකුණු 04 යි)

(iii) 'සැපයුම් නීතිය' නිර්වචනය කොට ඒ කෙරෙහි බලපාන හේතු පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(iv) කිසියම් භාණ්ඩයක් සඳහා නිෂ්පාදන සහනාධාරයක් ලබා දුන් විට, නිෂ්පාදකයන් භුක්ති විඳින අතිරික්තය කෙරෙහි එය බලපාන ආකාරය, ඉල්ලුම් සැපයුම් රූපසටහනක් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(v) අත්‍යවශ්‍ය පාරිභෝගික භාණ්ඩයක් සඳහා රජය විසින් උපරිම මිලක් පැනවීමේ ආර්ථික ප්‍රතිවිපාක කවරේ ද? (ලකුණු 05 යි)

අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

2. (i)
- සම්බන්ධිත භාණ්ඩවල මිල
- පාරිභෝගිකයන්ගේ ආදායම සහ ධනය
- පාරිභෝගිකයන්ගේ අභිරුචිය සහ වරණය
- අනාගත මිල පිළිබඳ අපේක්ෂාවන්
- ප්‍රචාරණය
- බදු අයකිරීමේ මට්ටම
- ජනගහනය/ ගැනුම්කරුවන් සංඛ්‍යාව
- මිනිසාගේ පාලනයෙන් පරිබාහිර කාලගුණය වැනි සාධක

(එක් කරුණකට ලකුණු 01 බැගින් ඕනෑම කරුණු තුනකට ලකුණු 03 යි)

(ii) - ඉල්ලුම වෙනස්වීම යන්නෙන් අදහස් කරන්නේ ඉල්ලුම් වක්‍රය මුළුමනින්ම විතැන් වීමකි. එනම් සෑම මිලකදීම මිල දී ගනු ලබන ප්‍රමාණය වෙනස් වීමකි.

(ලකුණු 02 යි)

- ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය වෙනස්වීම යන්නෙන් අදහස් කරනුයේ ඉල්ලුම් වක්‍රය මත එක් ලක්ෂයක සිට තවත් ලක්ෂ්‍යයක් කරා ගමන් කරන විට ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණයේ සිදුවන වෙනස්වීම ය. ඉල්ලුම් වක්‍රයේ එක් එක් ලක්ෂ්‍යයක් පෙන්නුම් කරනුයේ, කිසියම් නිශ්චිත මිලක දී ඉල්ලුම් කරනු ලබන නිශ්චිත ප්‍රමාණයකි. මේ අනුව විවිධ ලක්ෂ්‍යයන් පෙන්නුම් කරනුයේ ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණයේ වෙනස් වීම් ය. **(ලකුණු 02 යි)**

(iii) - අනෙකුත් කරුණු නොවෙනස් ව තිබිය දී, මිල ඉහළ යන විට වැඩි ප්‍රමාණයක් සපයනු ලබන අතර, මිල පහළ බසින විට අඩු ප්‍රමාණයක් සපයෙනු ලැබේ.


(ලකුණු 02 යි)

විකල්ප පිළිතුර :

- අනෙකුත් කරුණු නොවෙනස්ව තිබිය දී වෙළෙඳපොළ මිල සහ සපයනු ලබන ප්‍රමාණය අතර අනුලෝම සම්බන්ධයක් පවතී. **(ලකුණු 02 යි)**

- නිෂ්පාදන ධාරිතාව සහ යෙදවුම් මිල නොවෙනස් ව තිබිය දී (එනම් කෙටි කාලයේ දී), නිෂ්පාදනය කරනු ලබන ඒකක ප්‍රමාණය වැඩි කරන විට, ආන්තික පිරිවැය ඉහළ නගී. ''වැඩිවන ආවස්ථික පිරිවැය නීතිය'' නමින් හඳුන්වනුයේ ද මේ අදහස ය. එබැවින් ආන්තික පිරිවැයවත් අඩු තරමින් ආවරණය නොවන මිලක් යටතේ නිෂ්පාදනයෙහි යෙදීම අර්ථවත් නොවන අතර, වැඩිපුර ඒකකයක් සැපයීම සඳහා නිෂ්පාදකයා පෙරට වඩා වැඩි මිලක් අපේක්ෂා කරයි. **(ලකුණු 02 යි)**

(iv)



(නිවැරදි රූප සටහනට ලකුණු 02 යි)

- නිෂ්පාදක අතිරික්තය කෙරෙහි සහනාධාරයේ බලපෑම :

සහනාධාරයට පෙර නිෂ්පාදක අතිරික්තය	සහනාධාරයට පසු නිෂ්පාදක අතිරික්තය	නිෂ්පාදක අතිරික්තයේ වෙනස්වීම
C + D	B + C + D + E	B + E ප්‍රමාණයෙන් වැඩි වේ.

(ලකුණු 02 යි)

(v)

- අධි ඉල්ලුමක් හෙවත් භාණ්ඩ හිඟයක් පැනනගී. එබැවින් පාලන මිලට වඩා වැඩි මිලට භාණ්ඩ අලෙවි කෙරෙන කළු කඩ පැන නැගීමේ ප්‍රවණතාවක් හට ගනී.

- මිල නොවන මාධ්‍ය ඔස්සේ සළාකන යන්ත්‍රණයන් බිහිවේ. සීමිත භාණ්ඩ ප්‍රමාණය කවර පාරිභෝගිකයන්ට ලබා දෙනවා ද යන්න දිගු පෝලිම් ඔස්සේ හෝ කල්තබා වෙන්කර තබා ගැනීම් ඔස්සේ හෝ තීරණය විය හැකිය.

- හිඟ භණ්ඩ සොයා යාමේ පිරිවැය : කාලය සහ මුදල් වැය වේ.

- ශුභ සාධන ප්‍රතිවිපාක : නිෂ්පාදක අතිරික්තය පහළ වැටේ. පාරිභෝගික අතිරික්තය ඉහළ නගී.

- සම්පත් බෙදා වෙන් කිරීම අකාර්යක්ෂම වේ.


- ඒදිනෙදා ජීවිතයට අත්‍යවශ්‍ය භාණ්ඩයක් වේ නම් උපරිම මිල නියම කිරීම නිසා කලින් එම භාණ්ඩය මිල දී ගැනීමට හැකියාවක් නොතිබුණු පුද්ගලයන්ට එය ලබා ගැනීමට හැකියාව ලැබේ. දුප්පත් සහ ආර්ථික වශයෙන් සවිබල නැති පුද්ගලයන්ගේ ශුභ සාධනය වෙනුවෙන් ලැබෙන විශාල සහනයකි.

- නිෂ්පාදකයන්ට අඩු මිලකට භාණ්ඩ විකිණීමට සිදුවන අතර ඔවුන්ගේ අයභාරය පහළ වැටේ.

- උපරිම මිල ප්‍රතිපත්තියේ අනිසි ප්‍රතිවිපාක සමනය කිරීම සඳහා රජයට වියදම් වැඩි කර ගැනීමට සිදුවේ. නිෂ්පාදකයන්ට සහනාධාරයක් ලබාදීමට හෝ සැපයුම් වක්‍රය දකුණට විතැන් කිරීමට අදාළ ක්‍රියාමාර්ග ගැනීමට හෝ සිදුවනු ඇත. එම ක්‍රියාමාර්ග වල ආවස්ථික පිරිවැයක් පවතී. වෙනත් අත්‍යවශ්‍ය කේෂ්ත්‍රවල රජයට වැය කිරීමට ඇති මුදල් කිසියම් ප්‍රමාණයකට කපා හැරීමට සිදුවනු ඇත.


(එක් කරුණකට ලකුණු 01 බැගින් ඕනෑම කරුණු පහකට ලකුණු 05 යි)

02 වන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :



01 ප්‍රශ්නයට අයදුම්කරුවන්ගෙන් 98%ක් පමණ පිළිතුරු සපයා ඇත (ප්‍රස්තාරය 2). මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ.

ඉන් ලකුණු 0 - 5 ප්‍රාන්තරයේ 27%ක් පමණ ද
ලකුණු 6 - 10 ප්‍රාන්තරයේ 27%ක් පමණ ද
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ .27%ක් පමණ ද
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 19%ක් පමණ ද
ලකුණු ලබාගෙන ඇත.




මෙම ප්‍රශ්නය කොටස් 05 කින් සමන්විත වන අතර ඉන් පහසුතාව වැඩි ම කොටස (i) කොටස වේ. එහි පහසුතාව 89%කි. (iv) කොටස පහසුතාව අඩුම කොටසයි. එහි පහසුතාව 31%කි.

(ii) වන අනු කොටසේ පහසුතාව 53% කි. ඉල්ලුම වෙනස් වීම හා ඉල්ලුම් ප්‍රමාණය වෙනස් වීම යනු සංකල්ප දෙකක් බව නිවැරදි ලෙස අවබෝධ කර නොගැනීම නිසා පහසුතාවය මධ්‍යස්ත මට්ටමක පැවතීමට හේතු වී ඇත.

ඉල්ලුම වෙනස්වීම යනු මිල හැර අනෙකුත් ඉල්ලුම් තීරකවල වෙනස්වීම මත ඉල්ලුම් වක්‍රය මුලුමනින්ම වමට හෝ දකුණට විතැන්වීමකි. ඉල්ලුම් ප්‍රමාණය වෙනස්වීම යනු අනෙකුත් ඉල්ලුම් තීරක ස්ථාවරව පවතින විට අදාල භාණ්ඩයේ මිල වෙනස්වීම හේතුකොට ගෙන එකම ඉල්ලුම් වක්‍රයක් දිගේ එක් ලක්ෂ්‍යයක සිට තවත් ලක්ෂ්‍යයකට ගමන් කිරීමකි. එබැවින් ඉල්ලුම් වක්‍රයේ විවිධ ලක්ෂ්‍යයන්ගෙන් පෙන්නුම් කරනු ලබන්නේ ඉල්ලුම් ප්‍රමාණයන්ගේ වෙනස්වීමයි.

(iv) වන අනු කොටසෙහි පහසුතාව 31% කි. මෙමගින් විමසා ඇත්තේ නිෂ්පාදන සහනාධාරයක් දුන් විට නිෂ්පාදන අතිරික්තය කෙරෙහි බලපාන ආකාරය ඉල්ලුම් සැපයුම් රූප සටහනකින් පෙන්වීම පිළිබඳවය. නමුත් සැපයුම් වක්‍රය S_1 ලෙස දකුණට විතැන් වීමෙන් පසු නව සමතුලිතයේ සිට පැරණි සැපයුම් වක්‍රය දක්වා ලම්බක රේඛාවක් ඇඳ එය මිල අක්ෂයට සම්බන්ධවන ලක්ෂ්‍යයට අදාළ P_2 මිල නිෂ්පාදකයාට ලැබෙන බැවින්, $P_0 P_2 U$ වන අතිරික්තය නිෂ්පාදකයාට ලැබෙන බව අවධාරණය විය යුතුය.



(v) වන අනු කොටසෙහි පහසුතාව 40% ක් වීමෙන් පැහැදිලි වන්නේ ද එය සිසුන්ට එතරම් පහසු ප්‍රශ්නයක් නොවන බවයි. එය පහසු ප්‍රශ්නයක් වුව ද පිළිතුරු ලිවීමට සිසුන් අපොහොසත් වී ඇත.

භාණ්ඩ සොයමින් ඇවිදීමට සිදුවීම හා කාලය, මුදල් වැය වන බව, පෝලිම්වල සිටීමට සිදුවන බව අධි ඉල්ලුම නිසා කළු කඩ මිලක් බිහිවන බව මෙන්ම සමාජ ශුභ සාධනය අහිමි වීමක් ද සිදු වන බව අවධාරණය විය යුතුය.

03 ප්‍රශ්නය

3. (i) නිෂ්පාදන ආයතනයක කෙටි කාලීන පිරිවැය වක්‍රවල හැඩය සමඟ හීනවන ඵල නීතිය සම්බන්ධ වන්නේ කෙසේ ද? (ලකුණු 04 යි)

(ii) ආයතනයක් කෙටි කාලයේ දී නිෂ්පාදනය ප්‍රසාරණය කරනු ලබන විට, සාමාන්‍ය මුළු පිරිවැය හා සාමාන්‍ය විචල්‍ය පිරිවැය අතර වෙනසට කුමක් සිදුවේ ද? පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(iii) සාමාන්‍ය මුළු පිරිවැය සහ සාමාන්‍ය විචල්‍ය පිරිවැය කෙරෙහි පහත සඳහන් දෑ බලපානුයේ කවර ආකාරයෙන් ද?

(අ) විදුලිබල ගාස්තු පහළ වැටීමක්

(ආ) වැටුප් අනුපාතිකයේ පහළ වැටීමක්

(ඉ) ප්‍රධාන විධායක නිලධාරියාගේ චේතනයේ ඉහළ යාමක්

(ඊ) ආයතනයේ ගොඩනැගිලිවල බදු කුලී ඉහළ යාමක් (ලකුණු 04 යි)

(iv) පූර්ණ තරගකාරී වෙළෙඳපොළ ව්‍යුහයක් සහ කතිපයාධිකාරී වෙළෙඳපොළ ව්‍යුහයක් අතර දක්නට ලැබෙන වෙනස්කම් **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(v) ප්‍රාමාණික ලාභය සහ නිෂ්ප්‍රාමාණික ලාභය අතර වෙනස දක්වන්න. (ලකුණු 04 යි)

අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

3. (i)

- නිෂ්පාදන ආයතනයක් කෙටි කාලයේ දී, ස්ථාවර යෙදවුම් සමඟ මිශ්‍ර කරමින් විචල්‍ය යෙදවුම පමණක් වැඩි කරන විට, විචල්‍ය යෙදවුමේ ආන්තික සහ සාමාන්‍ය ඵලදාව එක්තරා අවස්ථාවකට පසුව පහළ බැසීම ''හීනවන ඵලනීතිය'' නම් වේ.

(ලකුණු 02 යි)

- පිරිවැය ශ්‍රිතය සහ නිෂ්පාදන ශ්‍රිතය එකිනෙකට සමානුපාතික වේ. නිෂ්පාදනය සහ පිරිවැය යනු එකම ක්‍රියාකාරකමක පැතිකඩ දෙකක් පමණි. පිරිවැය ශ්‍රිතය ව්‍යුත්පන්න කරගනුයේ නිෂ්පාදන ශ්‍රිතයෙනි.

- ආන්තික පිරිවැය (MC) වක්‍රය සහ සාමාන්‍ය විචල්‍ය පිරිවැය (AVC) වක්‍රය ඉංග්‍රීසි U - අකුරේ හැඩය ගනු ලබන අතර, ආන්තික ඵලදා (MP) වක්‍රය සහ සාමාන්‍ය ඵලදා (AP) වක්‍රය ප්‍රතිවිරුද්ධ U - අකුරේ හැඩය ගනී. සාමාන්‍ය ඵලදාව (AP), ආන්තික ඵලදාවට (MP) සමාන වනුයේ, සාමාන්‍ය ඵලදාව එහි උපරිම අගය හිමිකර ගන්නා විට දී ය. එහෙත් සාමාන්‍ය විචල්‍ය පිරිවැය (AVC) ආන්තික පිරිවැය (MC) ට සමාන වනුයේ සාමාන්‍ය විචල්‍ය පිරිවැයෙහි අවම අගයේ දී ය.

- ආන්තික ඵලදාව (MP) එහි උපරිම අගය ගන්නා විට ආන්තික පිරිවැය (MC) අවම අගය පෙන්නුම් කරයි.

- විචල්‍ය යෙදවුම වැඩි කරන්ම ආන්තික ඵලදාව (MP) පහළ වැටෙන අතර, ආන්තික පිරිවැය ඉහළ නගී. නමුත් එහි දී සාමාන්‍ය ඵලදාව තවදුරටත් ඉහළ නගිමින් පවතින අතර, සාමාන්‍ය විචල්‍ය පිරිවැය පහළ බසිමින් පවතී. සාමාන්‍ය විචල්‍ය පිරිවැය එහි අවම අගය දක්වා අඩු වී නැවතත් ඉහළ නැගීමට පටන් ගනී.

- ආන්තික ඵලදාව (MP) ඉහළ නැග පහළ බසී. ආන්තික ඵලදා වක්‍රය හා සාමාන්‍ය ඵලදා වක්‍රය එකිනෙක ඡේදනය වනුයේ සාමාන්‍ය ඵලදාව උපරිම අගය ගන්නා අවස්ථාවේ දී ය. ඉන්පසු ආන්තික ඵලදාව සාමාන්‍ය ඵලදාවට වඩා වේගයෙන් පහළ බසී. එයට අනුරූපීව, ආන්තික පිරිවැය ද පහළ වැටී ඉහළ නැගීමට පටන් ගනී. ආන්තික පිරිවැය වක්‍රය සාමාන්‍ය විචල්‍ය පිරිවැය වක්‍රය සමග ඡේදනය වනුයේ සාමාන්‍ය විචල්‍ය පිරිවැයෙහි අවම අගයේ දී ය. ඉන්පසු ආන්තික පිරිවැය සාමාන්‍ය විචල්‍ය පිරිවැයට වඩා වේගයෙන් ඉහළ නගී.

(සම්බන්ධය පැහැදිලි කෙරෙන ඕනෑම කරුණු දෙකකට ලකුණු 02 යි)

(ii) - කෙටි කාලයේ දී ආයතනයක් නිෂ්පාදනය ප්‍රසාරණය කරන විට සාමාන්‍ය මුළු පිරිවැය හා සාමාන්‍ය විචල්‍ය පිරිවැය අතර වෙනස කුඩා වේ.

(ලකුණු 01 යි)

- සාමාන්‍ය මුළු පිරිවැය සහ සාමාන්‍ය විචල්‍ය පිරිවැය අතර වෙනසට හේතුව සාමාන්‍ය ස්ථාවර පිරිවැයයි.

- නිෂ්පාදනය, ක්‍රම ක්‍රමයෙන් වැඩි කරත්ම සාමාන්‍ය ස්ථාවර පිරිවැයෙහි වැදගත්කම ක්‍රමයෙන් අඩුවන බැවින්, සාමාන්‍ය මුළු පිරිවැය වක්‍රය සාමාන්‍ය විචල්‍ය පිරිවැය වක්‍රයට ක්‍රමයෙන් ළං වේ.

- ඉහළ නිමැවුම් පරාසයක දී සාමාන්‍ය ස්ථාවර පිරිවැය අතිශයින් නොවැදගත් අගයක් පෙන්නුම් කරන අතර, සමස්ත පිරිවැය තුළ විචල්‍ය පිරිවැය ආධිපත්‍යය හිමිකර ගනී.

- කෙසේ වෙතත් සෑම නිමැවුම් මට්ටමක දී ම සාමාන්‍ය මුළු පිරිවැය හා සාමාන්‍ය විචල්‍ය පිරිවැය අතර පරතරයක් පවතින නමුදු, නිෂ්පාදනය වැඩි කරත්ම මේ පරතරය ක්‍රම ක්‍රමයෙන් අඩුවීමට නැඹුරු වේ.

(එක් කරුණකට ලකුණු 01 බැගින් ඕනෑම කරුණු තුනකට ලකුණු 03 යි)

(iii) -
(අ) සාමාන්‍ය මුළු පිරිවැය (ATC) පහළ වැටේ, සාමාන්‍ය විචල්‍ය පිරිවැය (AVC) පහළ වැටේ.

(ආ) සාමාන්‍ය මුළු පිරිවැය (ATC) පහළ වැටේ, සාමාන්‍ය විචල්‍ය පිරිවැය (AVC) පහළ වැටේ.

(ඉ) සාමාන්‍ය මුළු පිරිවැය (ATC) ඉහළ නගී, සාමාන්‍ය විචල්‍ය පිරිවැය (AVC) වෙනස් නොවේ.

(ඊ) සාමාන්‍ය මුළු පිරිවැය (ATC) ඉහළ නගී, සාමාන්‍ය විචල්‍ය පිරිවැය (AVC) වෙනස් නොවේ.

(එක් කරුණකට ලකුණු 01 බැගින් ලකුණු 04 යි)

(iv)

පූර්ණ තරගකාරී වෙළෙඳපොළ	කතිපයාධිකාරී වෙළෙඳපොළ
- විකුණුම්කරුවන් විශාල සංඛ්‍යාවක් සිටීම.	- විකුණුම්කරුවන් අතළොස්සක් පමණක් සිටීම.
- සමජාතීය භාණ්ඩයක් අලෙවි කිරීම.	- සමජාතීය වූ හෝ ප්‍රභේදනය වූ හෝ භාණ්ඩයක් වීම.
- අබාධ ප්‍රවේශය සහ පිටවීම.	- ප්‍රවේශය බාධාකාරී වීම.
- අන්‍යෝන්‍ය රැඳියාවක් දක්නට නොතිබීම.	- දැඩි ලෙස අන්‍යෝන්‍ය රැඳියාව පැවැතීම.
- ආයතනය මිල ගනුවෙකි	- ආයතනය මිල සපයන්නෙකි.
- වෙළෙඳපොළ පිළිබඳ පූර්ණ දැනුම පැවැතීම.	- වෙළෙඳපොළ තොරතුරු ලබාගැනීම අතිශය දුෂ්කර වීම හා රහසිගත වීම.
- ප්‍රචාරණය නොමැත.	- ප්‍රචාරණය පවතී.

(නිවැරදි සංයෝජනයකට ලකුණු 02 බැගින් ඕනෑම සංයෝජන දෙකකට ලකුණු 04 යි)

(v)

- කිසියම් ව්‍යවසායකයෙකු පවත්නා නිෂ්පාදන ක්‍රියාවලියෙහි රඳවා තබා ගැනීම සඳහා එම ව්‍යවසායකයා අපේක්ෂා කරන අවම ගෙවීම ප්‍රාමාණික ලාභය ලෙස හැඳින්වේ.

- ව්‍යවසායකයෙකු ප්‍රාග්ධනය ඇතුළු විවිධ ව්‍යවසායක සම්පත් සංචල කරමින් සහ අවදානමක් දරමින් නිෂ්පාදන කාර්යයෙහි නියැළීමේ දී, එම ප්‍රයත්නයට සරිලන අවම ගෙවීමක් ඔහු අපේක්ෂා කරයි. ව්‍යවසායක කාර්යභාරය ඉටු කිරීම වෙනුවෙන් ලැබිය යුතු ගෙවීමක් වන නිසා ප්‍රාමාණික ලාභය ආරෝපිත පිරිවැයකි.

- පවත්නා නිෂ්පාදන ක්‍රියාවලිය තුළ එම අවම ගෙවීමවත් ඔහුට උපයාගත නොහැකි වේ නම් ඔහු තම ව්‍යවසායකත්වය එම ව්‍යාපාරයෙන් ඉවත් කර ගනී.

(ඕනෑම කරුණු දෙකකට ලකුණු 02 යි)

- නිෂ්ප්‍රාමාණික ලාභය හෝ අති ප්‍රාමාණික ලාභය වශයෙන් හඳුන්වන්නේ ව්‍යවසායකයෙකු තම ප්‍රාමාණික ලාභය ඉක්මවා උපයාගනු ලබන ලාභ ප්‍රමාණයට ය.

- නිෂ්පාදන ආයතනයේ මුළු අයභාරයෙන් නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා උපයෝජනය කළ සියලුම ආවස්ථික පිරිවැය (ආර්ථික පිරිවැය) අඩු කළ විට, ශේෂ වන අතිරික්තයයි.

- ප්‍රාමාණික ලාභය නිෂ්පාදන පිරිවැයෙහි කොටසක් වුව ද, නිෂ්ප්‍රාමාණික ලාභය පිරිවැයෙහි කොටසක් නොව, පිරිවැය ඉක්මවා ලැබෙන අතිරික්තයකි.

- ව්‍යාපාරය ගෙනයාමේ දී ව්‍යවසායකයාට දැරීමට සිදුවන අවදානම සහ අවිනිශ්චිතතාව වෙනුවෙන් ලැබෙන ප්‍රතිලාභයක් ලෙස නිෂ්ප්‍රාමාණික ලාභ සැලකිය හැකිය. වෙළෙඳපොළ ඒකාධිකාරී බලය නිසාත් හුදු අහඹු හේතු නිසාත් මෙවැනි අතිරික්තයන් හටගත හැකිය.


(ඕනෑම එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු දෙකකට ලකුණු 02 යි)

විකල්ප පිළිතුරක් :

නිෂ්පාදන ආයතනයකට, තම මුළු අයභාරය (TR) මුළු පිරිවැයට (TC) සමාන වූ විට ප්‍රාමාණික ලාභ උපයා ගත හැකි අතර, නිෂ්ප්‍රාමාණික ලාභ උපයා ගත හැක්කේ මුළු අයභාරය මුළු පිරිවැය ඉක්මවා ගිය විට දී පමණි.


(ලකුණු 02 යි)

03 වන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :



03 ප්‍රශ්නයට අයදුම්කරුවන්ගෙන් 59.91%ක් පමණ පිළිතුරු සපයා ඇත (ප්‍රස්තාරය 2). මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ.

ඉන් ලකුණු 0 - 5 ප්‍රාන්තරයේ 22%ක් පමණ ද
ලකුණු 6 - 10 ප්‍රාන්තරයේ 32%ක් පමණ ද
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 30%ක් පමණ ද
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 16%ක් පමණ ද
ලකුණු ලබාගෙන ඇත.



මෙම ප්‍රශ්නයේ කොටස් 05 ක් ඇත. පහසුතාව අඩු ම කොටස (ii) වී ඇති අතර, එහි පහසුතාව 25%කි. පහසුතාව වැඩි ම කොටස (iv) වී ඇති අතර, එහි පහසුතාව 81%කි.

තුන්වන ප්‍රශ්නය තොරාගත් අපේක්ෂකයින් ගේ ප්‍රතිශතය 59.91% කි. මෙය අනු කොටස් පහකින් සමන්විත වේ.

(ii) අනු කොටසේ පහසුතාව 25% කි. 3වන ප්‍රශ්නයේ අඩුම පහසුතාව පෙන්වන්නේ මෙම අනු කොටසිනි. සාමාන්‍ය මුළු පිරිවැය (ATC) සෑදෙන්නේ, සාමාන්‍ය විචල්‍ය පිරිවැය (AVC) හා සාමාන්‍ය ස්ථාවර පිරිවැය (AFC) යන දෙකෙහි එකතුවෙනි. එමෙන්ම නිමැවුම ප්‍රසාරණය වීමත් සමඟ සාමාන්‍ය ස්ථාවර පිරිවැය ක්‍රමයෙන් පහළ බසින බවද, නිමැවුම වැඩි වීමේ දී AVC හා ATC වක්‍ර දෙක අතර පරතරය අඩුවන බවද නිසි ලෙස අවබෝධ කර නොගැනීම ඊට හේතු වී ඇත. සංඛ්‍යාත්මක උදාහරණ හා ප්‍රස්තාර සටහනක් භාවිත කරමින් මෙම සම්බන්ධතාවය පැහැදිළි කළ යුතුය.

(iii) අනු කොටස අ, ආ, ඉ, ඊ ලෙස තවත් අනු කොටස් 4 කට බෙදී ඇත. එහි පහසුතාව පිළිවෙළින් 54%, 60%, 40% හා 45% වශයෙනි. ස්ථාවර පිරිවැය හා විචල්‍ය පිරිවැය වෙන්කොට හඳුනා ගැනීමට අපොහොසත් වීම මධ්‍යස්ත පහසුතාවක් පෙන්වීමට හේතු වී ඇත. විචල්‍ය පිරිවැය සහ ස්ථාවර පිරිවැය වෙන් කොට හඳුනා ගත හැකි වන පරිදි විවිධ උදාහරණ යොදා ගනිමින් අභ්‍යාස කරවීමෙන් නිපුණතා වර්ධනය කළ යුතුය.

04 ප්‍රශ්නය

4. (i) ආදායම් චක්‍රීය ප්‍රවාහයේ 'විදීම්' සහ 'කාන්දුවීම්' යන්නෙන් කවරක් අදහස් වන්නේ දැයි පැහැදිලි කොට, ආණ්ඩුවේ කටයුතු සහිත විවෘත ආර්ථිකයක සමාහාර වියදමේ දක්නට ලැබෙන කාන්දුවීම් හඳුන්වන්න. (ලකුණු 04 යි)

(ii) දළ ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනයේ ප්‍රධාන සංරචක කවරේ ද? (ලකුණු 04 යි)

(iii) දළ දේශීය නිෂ්පාදිතය ගණනය කරනු ලබන ආකාරය පැහැදිලි කොට, වෙළෙඳපොළ මිල යටතේ දළ දේශීය නිෂ්පාදිතය ශුද්ධ ජාතික ආදායමෙන් වෙනස් වන්නේ කෙසේ දැයි පෙන්වන්න. (ලකුණු 04 යි)

(iv) ව්‍යාපාර චක්‍රයක ප්‍රසාරණය ආර්ථික වෘද්ධියෙන් වෙනස් වූවක් ලෙස අප සලකන්නේ ඇයි? (ලකුණු 04 යි)

(v) 2016 වර්ෂය සඳහා කිසියම් ආර්ථිකයක සාර්ව ආර්ථික දත්ත පහත වගුවේ දැක්වේ.

(සියලු ම සංඛ්‍යා රුපියල් බිලියන වලිනි)

අයිතමය	වටිනාකම
දළ ආයෝජනය (I)	200
බදු (T)	550
අපනයන (X)	375
පරිභෝජන වියදම (C)	700
සංක්‍රාම ගෙවීම් (T_R)	300
ආනයන (M)	325
ආණ්ඩුවේ මිල දී ගැනීම් (G)	300

(අ) මෙම ආර්ථිකයේ දළ දේශීය නිෂ්පාදිතය ගණනය කරන්න. (ලකුණු 02 යි)

(ආ) මෙම ආර්ථිකයේ පෞද්ගලික වැය කළ හැකි ආදායම් කොපමණ ද? (ලකුණු 02 යි)

අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

4. (i) - ආදායම් චක්‍රීය ප්‍රවාහයේ විදීම් යනු ඔවුනොවුන් අතර සිදුවන ලැබීම් ප්‍රවාහයන්ගෙන් පරිබාහිරව, ආයතන වලට සහ කුටුම්බ වලට ලැබෙන ලැබීම් ය.
(ලකුණු 01 යි)

- විදීම් හේතුකොට ස්වායත්ත සමාහාර වියදම් ඉහළ යන අතර, ඒවා ආදායමේ බහුවිධ ප්‍රසාරණයන් ජනනය කිරීමට සමත් වේ.

- ආයෝජන වියදම් (I) , ආණ්ඩුවේ මිල දී ගැනීම් (G) සහ අපනයන (X) යන ස්වායත්ත වියදම් වලින් විදීම් සමන්විත වේ.
(එක් කරුණකට ලකුණු 01 බැගින් ඕනෑම එක් කරුණකට ලකුණු 01 යි)

- ආයතන වලට හෝ කුටුම්බ වලට හෝ ලැබෙන ලැබීම් (ඉපැයීම්) වලින් වියදමක් ලෙස දේශීය නිෂ්පාදිතය මත වැය නොකෙරෙන ප්‍රමාණය චක්‍රීය ආදායම් ප්‍රවාහයේ කාන්දුවීමක් හෝ ගිලිහීයාමක් හෝ ලෙස දැක්විය හැකිය. කාන්දුවීම් නිසා ආදායම් - වියදම් ප්‍රවාහය දුබල වේ. **(ලකුණු 01 යි)**

- ආණ්ඩුවේ කටයුතු සහිත විවෘත ආර්ථිකයක සමාහාර වියදමේ කාන්දුවීම් සමන්විත වනුයේ ඉතුරුම් (S), බදු (T) සහ ආනයන (M) වලිනි. **(ලකුණු 01 යි)**

(ii)
- ගොඩනැගිලි සහ ඉදිකිරීම්
- යන්ත්‍රසූත්‍ර සහ උපකරණ
- ප්‍රවාහන උපකරණ
- ඉඩම් සංවර්ධනය සහ වැවිලි සංවර්ධනය

(එක් කරුණකට ලකුණු 01 බැගින් ලකුණු 04 යි)

විකල්ප පිළිතුර (1) :
- ඉදිකිරීම්
- යන්ත්‍රසූත්‍ර හා යුධමය ආම්පන්න
- ප්‍රවාහන උපකරණ
- තොරතුරු තාක්ෂණ උපකරණ
- වගා කළ ජෛව විද්‍යාත්මක සම්පත්
- බුද්ධිමය දේපළ

(එක් කරුණකට ලකුණු 01 බැගින් ඕනෑම කරුණු හතරකට ලකුණු 04 යි)

විකල්ප පිළිතුර (2) :
- නිවාස
- වෙනත් ගොඩනැගිලි සහ ඉදිකිරීම්
- පදිංචිය සඳහා නොවන ගොඩනැගිලි
- යන්ත්‍රසූත්‍ර සහ උපකරණ
- ප්‍රවාහන උපකරණ
- වගා කළ ජෛව විද්‍යාත්මක සම්පත්
- බුද්ධිමය දේපළ
- නිෂ්පාදනය නොකළ මූල්‍ය නොවන වත්කම් (ස්වාභාවික සම්පත්, ගිවිසුම්, බදුකර බලපත්‍ර, කීර්තිනාමය, සන්නම්)

(එක් කරුණකට ලකුණු 01 බැගින් ඕනෑම කරුණු හතරකට ලකුණු 04 යි)

(iii)
- දළ දේශීය නිෂ්පාදිතය යනු කිසියම් වර්ෂයක් තුළ ආර්ථිකය විසින් නිෂ්පාදනය කරනු ලබන සියලුම අවසාන භාණ්ඩ හා සේවාවල වෙළෙඳපොළ වටිනාකම වේ.

- මෙම වටිනාකම ගණනය කිරීමට යොදා ගැනෙන ප්‍රවේශ තුනකි. නිමැවුම් ප්‍රවේශය, ආදායම් ප්‍රවේශය සහ වියදම් ප්‍රවේශය වශයෙනි.

- නිමැවුම් ප්‍රවේශය යටතේ දළ දේශීය නිෂ්පාදිතයේ වටිනාකම ගණනය කරනුයේ ගිණුම්කරණ කාල පරිච්ඡේදය තුළ ආර්ථිකය තුළ සිදුවන සියලුම ආර්ථික ක්‍රියාකාරකම් වල දළ එකතු කළ අගය ගණනය කොට එයට නිෂ්පාදිත මත සහ නිෂ්පාදන ක්‍රියාවලිය මත පනවනු ලබන සහනාධාර අඩුකළ බදු (ශුද්ධ බදු) ගැළපීමෙනි. **(ලකුණු 01 යි)**

- ආදායම් ප්‍රවේශය ඔස්සේ දළ දේශීය නිෂ්පාදිතයේ වටිනාකම ගණනය කරනුයේ අදාළ කාලපරිච්ඡේදය තුළ ආර්ථිකයේ සියලුම ආර්ථික ක්‍රියාකාරකම් නිසා ජනනය වූ සාධක ආදායම් සියල්ල එකතු කොට, එය ශුද්ධ වක්‍ර බදු සහ ක්ෂයවීම් ගැළපීමෙනි. වැටුප්, පොලී, බදු කුලී සහ ලාභ වලින් සාධක ආදායම් සමන්විත වේ.

(ලකුණු 01 යි)

- වියදම් ප්‍රවේශය ඔස්සේ දළ දේශීය නිෂ්පාදිතයේ වටිනාකම ගණනය කරනුයේ අදාළ කාලය තුළ බිහිකළ අවසාන නිමැවුම මිලදී ගැනීම සඳහා වැය කරන ලද වියදම් සියල්ල එකට එකතු කිරීමෙනි. ඒ අනුව මුළු නිමැවුමේ වටිනාකම පරිභෝජනය (C), ආයෝජනය (I), ආණ්ඩුවේ මිල දී ගැනීම් (G) සහ ශුද්ධ අපනයන (NX) යන වියදම් සංරචක වල එකතුවට සමාන වේ.

(ලකුණු 01 යි)

- වෙළෙඳපොළ මිල යටතේ දළ දේශීය නිෂ්පාදිතයේ වටිනාකම සහ ශුද්ධ ජාතික ආදායම අතර වෙනසට හේතුව (අ) ක්ෂයවීම් හෙවත් ස්ථාවර ප්‍රාග්ධනය පරිභෝජනය සහ (ආ) විදේශීය ශුද්ධ සාධක ආදායම් තිබීම ය.

- ශුද්ධ ජාතික ආදායම = දළ දේශීය නිෂ්පාදිතය - ක්ෂය වීම් + විදේශ ශුද්ධ සාධක ආදායම්

(ලකුණු 01 යි)

(iv) - ව්‍යාපාර චක්‍රයෙහි පතුළට වැටී සිටින ආර්ථිකයක් යළි යථාතත්වය කරා නැඹුරුවීමේ ක්‍රියාවලිය ආර්ථික ප්‍රසාරණය ලෙස දැක්වේ. ව්‍යාපාර චක්‍රයේ මෙම අවධියේ දී ආර්ථික ක්‍රියාකාරකම් ඉහළ නගී. නිමැවුම වැඩි වේ. විරැකියාව පහළ වැටේ. උපයෝජනය නොකළ ධාරිතාවක් සහ සේවා වියුක්ත ශ්‍රමිකයන් සිටින බැවින්, මේ අවධියේ දී නිෂ්පාදනය වඩාත් පහසුවෙන් ප්‍රසාරණය කළ හැකි ය.

- ප්‍රසාරණ අවධියේ දී ප්‍රධාන වශයෙන් සමස්ත ඉල්ලුම ඉහළ යාම නිසා ආර්ථිකයේ පවත්නා නිෂ්පාදන ධාරිතාව උපයෝජනය කිරීමේ ශීඝ්‍රතාව ඉහළ නගී.

(ලකුණු 02 යි)

- ආර්ථික වෘද්ධිය වූ කලී දිගු කාලීන ප්‍රපංචයක් වන අතර, එය සමන්විත වන්නේ ආර්ථිකයේ නිෂ්පාදන හැකියා මායිම දකුණට විතැන් කිරීමේ ක්‍රියාවලියකිනි. මින් අදහස් වන්නේ ආර්ථික වෘද්ධි ක්‍රියාවලියක දී ආර්ථිකයේ විභව නිමැවුම කාලයත් සමග ප්‍රසාරණය වන බවය.

- ආර්ථික වෘද්ධිය බිහි කරන ප්‍රධාන මූලාශ්‍ර දෙකකි. එනම් නිෂ්පාදන සම්පත් සම්භාරය ඉහළ නැංවීම (ප්‍රධාන වශයෙන් ප්‍රාග්ධන සමුච්චනය මගින්) සහ තාක්ෂණය ඉහළ නැංවීම ය. **(ලකුණු 02 යි)**

(V) - දළ දේශීය නිෂ්පාදිතය (GDP) :

GDP = C + I + G + X - M

GDP = 700 + 200 + 300 + 375 - 325 (ලකුණු 01 යි)


GDP = රු. බිලියන 1250 (ලකුණු 01 යි)

- පෞද්ගලික වැය කළ හැකි ආදායම (Y_d) :

Y_d = GDP - බදු (T) + සංක්‍රාම (Tr) (ලකුණු 01 යි)

Y_d = 1250 - 550 + 300 = රු. බිලියන 1000 (ලකුණු 01 යි)

04 වන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :



04 ප්‍රශ්නයට අයදුම්කරුවන්ගෙන් 17.23%ක් පමණ පිළිතුරු සපයා ඇත (ප්‍රස්තාරය 2). මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ.


ඉන් ලකුණු 0 - 5 ප්‍රාන්තරයේ 38%ක් පමණ ද

ලකුණු 6 - 10 ප්‍රාන්තරයේ 35%ක් පමණ ද

ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 23%ක් පමණ ද

ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 04%ක් පමණ ද

ලකුණු ලබාගෙන ඇත.



මෙම ප්‍රශ්නයේ කොටස් 05 ක් ඇත. පහසුතාව අඩු ම කොටස (ii) වී ඇති අතර, එහි පහසුතාව 11%කි. පහසුතාව වැඩි ම කොටස (v) (අ) වී ඇති අතර, එහි පහසුතාව 72%කි.

හතරවන ප්‍රශ්නය තෝරාගත් අපේක්ෂකයින් ගේ ප්‍රතිශතය 17.23% කි. සමස්ත ප්‍රශ්න පත්‍රයම ගත් විට අඩුම තෝරා ගැනීමක් සිදුකර ඇත්තේ මෙම ප්‍රශ්නයයි. මෙය අනු කොටස් පහකින් යුක්ත වේ.

(i) වන අනු කොටසේ පහසුතාව 54% කි. මෙම ප්‍රශ්නය තුළ අනු කොටස් වශයෙන් සඳහන් කර නොතිබුණ ද, ප්‍රශ්නයෙහි කොටස් දෙකක පිළිතුරක් අපේක්ෂා කෙරේ. කොටස් දෙක සඳහා ලකුණු වෙන් කර ලැබෙන බව පිළිබඳ අවධානය යොමු නොකිරීම නිසා, මුළු ලකුණු ප්‍රමාණයම ලැබී නැත. එම නිසා ප්‍රශ්න නිසි ලෙස කියවා අසා ඇති දේ නිවැරදිව තේරුම් ගැනීමේ කුසලතාව වර්ධනය කළ යුතුය.

(ii) වන අනු කොටසේ පහසුතාව 11% කි. හතරවන ප්‍රශ්නයේ අඩුම පහසුතාව හිමි වී ඇත්තේ මෙම කොටසටය. දළ ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනයේ සංරචක නිශ්චිතව දැක්වීමට අපේක්ෂකයින් බහුතරයක් අපොහොසත් වී ඇත. එම නිසා ඊට අදාළ නිශ්චිත සංරචක පිළිබඳ අවධාරණය කරමින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය කළ යුතුය.

(iii) වන අනු කොටසේ පහසුතාව 39% කි. දළ දේශීය නිෂ්පාදිතය ගණනය කිරීමේ දී ප්‍රවේශ තුනම අනුගමනය කරමින් පිළිතුරු ලිවිය යුතු වුවත්, බොහෝ අපේක්ෂකයින් එක් ප්‍රවේශයකින් පමණක් පිළිතුරු ලියා තිබුණි. එබැවින් පිළිතුරු ලිවීමේ දී ප්‍රවේශ තුනම ඇතුළත් කොට පිළිතුරු සංවිධානය කර ගත යුතුය. එසේම ජාතික ගිණුම් සංකල්ප මැනවින් තහවුරු වන සේ අභ්‍යාසවල යෙදීම අවශ්‍ය වේ.

(iv) වන අනු කොටසේ පහසුතාව 31% කි. ව්‍යාපාර චක්‍රයක ප්‍රසාරණ අවධිය සහ ආර්ථික වෘද්ධිය එකිනෙකට වෙනස් සංකල්ප දෙකක් බව නිසිලෙස හඳුනාගෙන නැත. ව්‍යාපාර චක්‍ර සහ නිෂ්පාදන හැකියා මායිම් වක්‍ර භාවිතා කරමින් ඉහත සංකල්ප පැහැදිළි වනසේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සිදු විය යුතුය.

(v) වන අනු කොටස (අ), (ආ) වශයෙන් උප කොටස් දෙකකින් යුක්ත වේ. මේවායේ පහසුතාව පිළිවෙළින් 72% හා 37% වශයෙන් වේ. දළ දේශීය නිෂ්පාදිතය ගණනය කිරීම පිළිබඳ අපේක්ෂකයින්ගේ කුසලතා ඉහළ මටටමක පැවැති අතර වැය කළ හැකි පෞද්ගලික ආදායම ගණනය කිරීමේදී ඉහළ දුෂ්කරතාවක් පෙන්නුම් කර ඇත. දළ දේශීය නිෂ්පාදිතය පදනම් කරගනිමින් ගණනය කරනු ලබන සංකල්ප පිළිබඳව විශේෂ අවධානය යොමු කරමින් නිපුණතා වර්ධනය කළ යුතුය.

05 ප්‍රශ්නය

5. (i) සරල ආර්ථිකයක සමාහාර පරිභෝජන ශ්‍රිතය $C = 100 + 0.8Y$ ලෙසත්, ආයෝජනය $I = 200$ ලෙසත් සලකන්න.

(අ) මෙම ආර්ථිකයේ සමතුලිත ආදායම් මට්ටම කොපමණ ද? (ලකුණු 02 යි)

(ආ) සමතුලිත අවස්ථාවේ දී ආර්ථිකයේ ඉතුරුම් මට්ටම කොපමණ ද? (ලකුණු 02 යි)

(ඉ) කිසියම් හේතුවක් නිසා ආර්ථිකයේ සමාහාර නිමැවුම් මට්ටම 1 700ක් වුවහොත්, අනිච්ඡානුගත (involuntary) තොග සමුච්චනය කොපමණ ප්‍රමාණයක් වනු ඇත් ද? (ලකුණු 02 යි)

(ii) රුපියල් මිලියන 500කින් බදු (T) ඉහළ දැමීම නිසා මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ සිදුවන පහළ වැටීමට වඩා විශාල වූ පහළ වැටීමක්, රුපියල් මිලියන 500කින් ආණ්ඩුවේ මිල දී ගැනීම් (G) අඩු වූ විට හට ගන්නේ ඇයි දැයි පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(iii) දළ දේශීය නිෂ්පාදිතය (Y) රුපියල් මිලියන 6 000ක් බවත්, පෞද්ගලික වැය කළ හැකි ආදායම රුපියල් මිලියන 5 100ක් බවත්, ආණ්ඩුවේ අයවැය හිඟය රුපියල් මිලියන 200ක් බවත්, පරිභෝජන වියදම රුපියල් මිලියන 3 800ක් බවත්, වෙළෙඳ ශේෂයේ හිඟය රුපියල් මිලියන 100ක් බවත් සලකන්න.

(අ) ඉතුරුම් (S) කොපමණ ද? (ලකුණු 02 යි)

(ආ) ආයෝජන මට්ටම (I) කොපමණ ද? (ලකුණු 02 යි)

(ඉ) ආණ්ඩුවේ මිල දී ගැනීම් (G) කොපමණ ද? (ලකුණු 02 යි)

(iv) "සමතුලිත ජාතික ආදායම් මට්ටම, පූර්ණ සේවා නියුක්ති ජාතික ආදායම් මට්ටමට අවශ්‍යයෙන් ම සමාන **නොවේ**." මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

5. (i) (අ) සමතුලිත ආදායම $Y = C + I$

$$Y = 100 + 0.8Y + 200$$ (ලකුණු 01 යි)

$$Y = 300 + 0.8Y$$

$$Y - 0.8Y = 300$$

$$0.2Y = 300$$

$$Y = 1500$$ (ලකුණු 01 යි)

(ආ) සමතුලිත අවස්ථාවේ දී ඉතුරුම් මට්ටම :

$$S = Y - C$$

$$S = Y - [100 + 0.8(1500)]$$ (ලකුණු 01 යි)

$$S = 1500 - (100 + 1200)$$

$$S = 1500 - 1300 = 200$$ (ලකුණු 01 යි)

(ඉ) අසච්ඡානුගත තොග සමුච්චනය :

- සමතුලිත ජාතික ආදායම් මට්ටම නිරූපණය කරනුයේ මුළු නිමැවුමේ වටිනාකමට සමාහාර වියදම සමාන බව ය. සමාහාර වියදමේ ප්‍රමාණය ඉක්මවා මුළු නිමැවුම වැඩි කරනු ලැබුවහොත්, නිමැවුම මිල දී ගැනීමට අවශ්‍ය කරන ඉල්ලුමේ ඌනතාවක් හට ගනී. ප්‍රමාණවත් ඉල්ලුමක් නොමැති කමින්, අලෙවි නොවූ භාණ්ඩ තොග වශයෙන් සමුච්චනය වේ. මෙලෙස අනිච්ඡානුගත තොග සමුච්චනයේ ප්‍රමාණය නිමැවුමේ වටිනාකම සහ සමාහාර වියදමේ වටිනාකම අතර වෙනසට සමාන වේ. එනම්,

$$1700 - 1500 = 200$$

නිමැවුම - ඉල්ලුම = තොග සමුච්චනය (ලකුණු 02 යි)

(ii) - රුපියල් මිලියන 500 කින් ආණ්ඩුවේ මිල දී ගැනීම් (G) අඩු වූ විට, ඒ හා සමාන ප්‍රමාණයකින් බදු වැඩි වූ විට ඇතිවන බලපෑමට වඩා විශාල වූ ගුණක ප්‍රතිඵල සහිත සංකෝචනාත්මක බලපෑමක් මූර්ත දළ දේශීය නිෂ්පාදිතය මත ඇති වේ. මක්නිසා ද යත් ආණ්ඩුවේ මිල දී ගැනීම් අඩු වූ ප්‍රමාණයෙන් ම සමස්ත වියදමේ සෘජු අඩුවීමක් හටගන්නා බැවිනි. **(ලකුණු 02 යි)**

- අනික් අතට රුපියල් මිලියන 500 කින් බදු ඉහළ දැමූවිට, ඒ හා සමාන ප්‍රමාණයකින් සමස්ත වියදම සෘජුවම අඩු වන්නේ නැත. මක්නිසාද යත් බදු ඉහළ දැමූවිට එය සමස්ත ඉල්ලුම කෙරෙහි සෘජුවම බලපාන්නේ නැත.

- බදු ඉහළ නැංවූ විට එහි බලපෑම මුලින් ම පතිතවන්නේ, වැය කළ හැකි ආදායම මත ය. සමස්ත ඉල්ලුම කෙරෙහි බලපානුයේ ඉන් අනතුරුව ය. වැය කළ හැකි ආදායම අඩු වූ විට එයට ප්‍රතිචාර දක්වමින් පරිභෝජන වියදම පහළ වැටෙන අතර, ඒ ඔස්සේ ගුණක ප්‍රතිඵල ඇති කරමින් මූර්ත ආදායමේ සංකෝචනය හට ගනී. **(ලකුණු 02 යි)**

විකල්ප පිළිතුරක් :

ආණ්ඩුවේ වියදම් ගුණකය (K_G) = $1/(1-MPC)$

බදු ගුණකය (K_T) = $MPC/(1-MPC)$

$K_G > K_T$ **(ලකුණු 02 යි)**

(iii) (අ) - ඉතුරුම් (S) ගණනය කිරීම :

ඉතුරුම් (S) = පෞද්ගලික වැය කළ හැකි ආදායම (Y_d) - පරිභෝජන වියදම (S) **(ලකුණු 01 යි)**

$S = Y_d - C$

- $S = 5100 - 3800 = 1300$ **(ලකුණු 01 යි)**

(ආ) ආයෝජන මට්ටම (I) :

$S+T+M = I+G+X$

$S+T = I+G+(X-M)$

$1300+900 = I+1100+(-100)$ **(ලකුණු 01 යි)**

$I = 2200-1000$

$= 1200$ **(ලකුණු 01 යි)**

(ඉ) - ආණ්ඩුවේ මිල දී ගැනීම් (G):

බදු (T) = $Y-Y_d = 6000-5100 = 900$

$T = 900$ **(ලකුණු 01 යි)**

අයවැය හිඟය (BD) = $T-G = 200$

$G = T+200$

$G = 900+200 = 1100$ **(ලකුණු 01 යි)**

(iv) - ජාතික ආදායම් මට්ටම පවත්නා මට්ටමේ සිට ඉහළ නැගීමට හෝ පහළ බැසීමට හෝ ප්‍රමණතාවක් නොදක්වන විට, එය සමතුලිත ආදායම් මට්ටමක් ලෙස නිර්වචනය කෙරේ. මේ සමතුලිත තත්වය හටගැනීම සඳහා අවශ්‍ය කරන කොන්දේසිය විකල්ප ප්‍රවේශ දෙකක් ඔස්සේ පෙන්නුම් කළ හැකිය. එනම්,

(i) සැලසුම් කළ වියදම සැබෑ නිමැවුමේ වටිනාකමට සමාන වීම, $Y = E$ (ආදායම් - වියදම් ප්‍රවේශය)


(ii) වියදම් ප්‍රවාහයේ විදීම් හා කාන්දුවීම් එකිනෙකට සමාන වීම, $W = J$ (කාන්දුවීම් - විදීම් ප්‍රවේශය)

(ලකුණු 02 යි)

- සමතුලිත ජාතික ආදායම සහ පූර්ණ සේවා නියුක්ති ජාතික ආදායම යනු එකම දෙයක් නොවන බව, මෙහි දී විශේෂයෙන් සැලකිය යුතුය. පූර්ණ සේවා නියුක්ති ආදායම් මට්ටම යනු ආර්ථිකයේ සියලුම සම්පත් පූර්ණ වශයෙන් උපයෝජනය කළ විට, ලබා ගන්නා ආදායම් මට්ටමයි. සමතුලිත ජාතික ආදායම් මට්ටම හැම විටම පූර්ණ සේවා නියුක්ති ආදායමට අනුගතව ස්ථාපිත වේ යයි සහතිකයක් නොමැත. පූර්ණ සේවා නියුක්ති මට්ටමේ හෝ පූර්ණ සේවා නියුක්ති මට්ටමට වඩා පහළින් හෝ ඊට වඩා ඉහළින් හෝ සමතුලිත ආදායම් මට්ටම තීරණය විය හැකි ය. ඒ සඳහා අවශ්‍ය කොන්දේසිය වන්නේ හුදෙක් නිමැවුමේ වටිනාකමට සමාන වියදමක් ($Y = E$) හටගැනීම හෝ කාන්දුවීම් හා විදීම් සමාන වීම ($W = J$) හෝ පමණි.


(ලකුණු 02 යි)

05 වන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :



05 ප්‍රශ්නයට අයදුම්කරුවන්ගෙන් 28.54%ක් පමණ පිළිතුරු සපයා ඇත (ප්‍රස්තාරය 2). මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ.

ඉන් ලකුණු 0 - 5 ප්‍රාන්තරයේ 29%ක් පමණ ද
ලකුණු 6 - 10 ප්‍රාන්තරයේ 31%ක් පමණ ද
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 25%ක් පමණ ද
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 15%ක් පමණ ද
ලකුණු ලබාගෙන ඇත.



මෙම ප්‍රශ්නයේ කොටස් 4ක් ඇති අතර (i) කොටස හා (iii) කොටස අ, ආ, ඉ වශයෙන් අනු කොටස්වලට බෙදේ. (i) "අ" කොටස පහසුතාව වැඩිම කොටස වන අතර එහි පහසුතාව 94% කි. අඩුම පහසුතාව (iv) කොටස වන අතර එහි පහසුතාව 26% කි

පස්වන ප්‍රශ්නය තෝරාගත් අපේක්ෂකයින් ගේ ප්‍රතිශතය 28.54% කි. මෙය අනු කොටස් හතරකින් යුක්ත වේ.

(i) වන අනු කොටස යළි අ, ආ, ඉ වශයෙන් අනු කොටස් තුනකට බෙදේ. ඒවායේ පහසුතාව පිළිවෙලින් 94%, 76%, සහ 51% වේ. අ, ආ කොටස් ඉහළ පහසුතා මට්ටම් පෙන්නුම් කරන නමුත් 'ඉ' කොටස මධ්‍යස්ත පහසුතාවක් පෙන්නුම් කර ඇත. 'ඉ' කොටස මධ්‍යස්ත පහසුතාවක් පෙන්නුම් කිරීමට හේතු වී ඇත්තේ පාරිභාෂික යෙදුම් පිළිබඳව අනවබෝධය සහ අතිරික්ත තොග ගණනය කිරීමේ නොහැකියාවයි. එම නිසා පාරිභාෂික යෙදුම් භාවිත කරමින් අදාල ගණනය කිරීම් ප්‍රගුණ කළ යුතුය.

(ii) වන අනු කොටසේ පහසුතාව 33% කි. බදු සහ රාජ්‍ය වියදම් දෙආකාරයකින් සමාහාර ඉල්ලුම කෙරෙහි බලපාන බව අවබෝධ කරගෙන නොතිබීම පහසුතාව අඩු වීමට හේතු වී ඇත. ආණ්ඩුවේ මිලදී ගැනීම් ඍජුවම සමාහාර වියදමට බලපාන බවත්, බදු වැය කළ හැකි ආදායමට බලපා ඉන්පසු සමාහාර ඉල්ලුම කෙරෙහි බලපාන බවත් අවධාරණය කරමින් නිපුණතා සංවර්ධනය කළ යුතුය.

(iii) වන අනු කොටස අ, ආ, ඉ වශයෙන් අනු කොටස් තුනකින් යුක්ත වේ. 57%, 31% හා 36% එහි පහසුතා අනුපිළිවෙළින් වේ. දී ඇති දත්ත ඇසුරෙන් විකල්ප ක්‍රම භාවිතා කරමින් අවශ්‍ය ගණනය කිරීම් සිදු කිරීමට අපේක්ෂකයින් අපොහොසත් වී ඇත. මෙවැනි ප්‍රශ්නයකට පිළිතුරු සැපයීමේ දී සංකල්ප පැහැදිලි කිරීමට, විකල්ප ක්‍රම භාවිතයෙන් සංඛ්‍යාත්මකව ගණනය කිරීමටත් අපේක්ෂකයින් පුහුණු කළ යුතුය.

(iv) වන අනු කොටසේ පහසුතාව 26% කි. සමතුලිත ජාතික ආදායම් මට්ටම සහ පූර්ණ සේවා නියුක්ති ජාතික ආදායම් මට්ටම පිළිබඳව නිරවුල් අවබෝධයක් නොමැති වීම පහසුතාව අඩු වීමට හේතු වී ඇත. සමතුලිත ජාතික ආදායම් මට්ටම ඇතිවීම සඳහා පූර්ණ සේවා නියුක්තිය අනිවාර්ය කොන්දේසියක් නොවන බවත්, $Y = E$ සහ $W = J$ වන ඕනෑම තත්ත්වයක් යටතේ ආර්ථිකය සමතුලිත විය හැකි බවත් තහවුරු වන ආකාරයට ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සකස් විය යුතුය.

"ආ" උප කොටස

06 ප්‍රශ්නය

(මෙම කොටසෙන් ද අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්** තෝරා ගන්න.)

6. (i) මතුපිට උද්ධමනය සහ මූලික උද්ධමනය අතර වෙනස දක්වන්න. (ලකුණු 04 යි)

(ii) සමාහාර වියදමේ සංරචක හඳුනාගෙන, ආර්ථිකයක සමාහාර වියදම් ඉහළ යාමක් නිසා උද්ධමනයක් හටගත හැක්කේ කෙසේ ද යන්න ප්‍රස්තාර සටහනක් ආශ්‍රයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(iii) වාණිජ බැංකුවක ශේෂ පත්‍රයක් පහත දැක්වේ.

වගකීම්	වටිනාකම (රුපි. මිලියන)	වත්කම්	වටිනාකම (රුපි. මිලියන)
තැන්පතු	180 000	සංචිත	100 000
		භාණ්ඩාගාර බැඳුම්කර	40 000
		ණය	40 000
මුළු වගකීම්	**180 000**	**මුළු වත්කම්**	**180 000**

(අ) ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය 10%ක් වේ නම්, මෙම බැංකුවට අනාගතයේ දී ලබා දිය හැකි අළුත් ණය උපරිම වශයෙන් කොපමණ වේ ද? (ලකුණු 02 යි)

(ආ) රුපියල් මිලියන 10 000ක තැන්පතු මෙම බැංකුවෙන් ඉවත් කර ගනු ලැබුවහොත්, එම බැංකුවට අනාගතයේ දී ලබා දිය හැකි අළුත් ණය උපරිම වශයෙන් කොපමණ වේ ද? (ලකුණු 02 යි)

(iv) අධිබලැති මුදල් යන්නෙන් අදහස් වන්නේ කුමක් ද? ආර්ථිකයේ අධිබලැති මුදල් තොගය පාලනය කිරීමෙහිලා පරිපූර්ණ බලයක් මහා බැංකුවට තිබේ ද? හේතු දක්වන්න. (ලකුණු 04 යි)

(v) ශ්‍රී ලංකා මහ බැංකුව වර්තමානයේ අනුගමනය කරනු ලබන මූල්‍ය ප්‍රතිපත්ති රාමුවේ ප්‍රධාන අරමුණු සැකෙවින් පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

6. (i)

- මතුපිට උද්ධමනය යනු පාරිභෝගික මිල දර්ශකයෙන් මනිනු ලබන කිසිදු ගැළපීමකට හෝ සංශෝධනයකට යටත් නොවූ, ආර්ථිකයේ සැබෑ මිල ගණන්වල ඉහළයාමකි. එමගින් යම් දෙන ලද කාලයක් තුළ ආර්ථිකයේ සියලුම පාරිභෝගික භාණ්ඩ හා සේවාවන්ගේ මිල කොතරම් ප්‍රමාණයකින් ඉහළගොස් තිබේදැයි දැනගත හැකි වේ.

- කිසියම් ප්‍රදේශයක ජීවන වියදම කොතරම් ප්‍රමාණයකින් ඉහළ ගොස් තිබේද යන්න මතුපිට උද්ධමන අනුපාතිකයෙන් මනිනු ලැබේ. ජීවන වියදමේ වෙනස්කම් එමගින් පිළිබිඹු වන නිසා සාමාන්‍ය ජනතාවට එම මිනුම වඩාත් ප්‍රයෝජනවත් වේ.

- ආහාර සහ බලශක්ති මිල වැනි දැඩිව උච්චාවචනයන් ට පාත්‍රවන මිල ගණන්, මතුපිට උද්ධමන අනුපාතිකය තුළ ඇතුළත් වන බැවින්, යටිදැරි උද්ධමනයේ ස්වභාවය එමගින් නිවැරදිව පිළිබිඹු නොවේ. **(ලකුණු 02 යි)**

- මූල්‍ය අධිකාරියේ පාලනයකින් තොරව සිදුවන, කාලගුණ වෙනස්කම්, බාහිර ලෝකයේ සිදුවන වෙනස්කම්, බදු ප්‍රතිපත්තියේ වෙනස්කම්, මිල පාලනයන්, සැපයුම් කම්පන වැනි හේතු කරන කොට හටගන්නා ආහාර හා බලශක්ති මිල ගණන් වල වෙනස්කම් නිසා, මතුපිට උද්ධමන අනුපාතිකය තාවකාලික උච්චාවචනයන්ට පාත්‍ර වේ.

- ලෝකයේ බොහෝ රටවල මූල්‍ය ප්‍රතිපත්ති සම්පාදකයන් මූල්‍ය ප්‍රතිපත්ති පිළිබඳ තීරණය ගනු ලබන්නේ, පාරිභෝගික මිල දර්ශකයෙන් තාවකාලික මිල වෙනස්කම් ඉවත් කළ පසු ශේෂ වන උද්ධමනයේ යටිදැරි ප්‍රවණතාවන් අධ්‍යයනය කරමිනි.

  මෙලෙස උද්ධමනයේ යටිදැරි ප්‍රවණතා හඳුනාගැනීම සඳහා තාවකාලික මිල වෙනස්කම් බැහැර කරමින් සකසනු ලබන උද්ධමන අනුපාතිකය මූලික උද්ධමනය වශයෙන් හඳුන්වනු ලැබේ. **(ලකුණු 02 යි)**

(ii) - සමාහාර වියදමේ සංරචක :

  පරිභෝජන වියදම (C)


  ආයෝජන වියදම (I)

  ආණ්ඩුවේ මිල දී ගැනීම් (G)

  ශුද්ධ අපනයන (NX) **(ලකුණු 02 යි)**

- ආර්ථිකයේ සමාහාර වියදම් ඉහළ යන විට සමාහාර ඉල්ලුම් වක්‍රය දකුණට විතැන් වේ. සමාහාර සැපයුම නොවෙනස්ව තිබිය දී සමාහාර ඉල්ලුම වැඩි වන විට ඉල්ලුමෙන් ඇදුණු උද්ධමනය සක්‍රීය වේ. **(ලකුණු 01 යි)**

- මෙම තත්වය රූප සටහනෙහි මැනවින් පෙන්නුම් කෙරේ.



සමාහාර සැපයුම් වක්‍රය AS වශයෙන් දක්වා ඇත. සමාහාර ඉල්ලුම AD_1 සිට AD_2 දක්වා වැඩිවන විට ආදායම් මට්ටම Y_2 දක්වාත් මිල මට්ටම P_2 දක්වාත් ඉහළ නගී.

(නිවැරදි ප්‍රස්තාරයට ලකුණු 01 යි)

(iii) (අ) - බැංකුවට උපරිම වශයෙන් ලබාදිය හැකි අළුත් ණය ප්‍රමාණය රඳා පවතින්නේ බැංකුව සතු අධිසංචිත ප්‍රමාණය මතය. අධි සංචිතයේ ප්‍රමාණයට සමානව අළුත් ණය ලබාදිය හැකි ය.

- පවත්නා සංචිතයේ ප්‍රමාණය : = 100,000

තැන්පතු සඳහා අවශ්‍යකරන සංචිතයේ ප්‍රමාණය = 180,000 × 0.10 = 18,000

අධි සංචිතයේ ප්‍රමාණය = 100,000 - 18,000 = 82,000

(ලකුණු 02 යි)

(ආ) රුපියල් මිලියන 10,000 ක තැන්පතු බැංකුවෙන් ඉවත් කරගත් විට, ලබාදිය හැකි උපරිම ණය ප්‍රමාණය තවදුරටත් අධි සංචිතයේ ප්‍රමාණයටම සමාන වනු ඇත.

දැනට පවත්නා සංචිතයේ ප්‍රමාණය	=	100,000 - 10,000	=	90,000
දැනට පවත්නා තැන්පතු ප්‍රමාණය	=	180,000 - 10,000	=	170,000
අවශ්‍ය කරන සංචිතයේ ප්‍රමාණය	=	170,000 × 0.1	=	17,000
අධි සංචිතයේ ප්‍රමාණය	=	90,000 - 17,000	=	73,000
උපරිම වශයෙන් ලබාදිය හැකි අළුත් ණය ප්‍රමාණය			=	73,000

(ලකුණු 02 යි)

(iv) - කිසියම් රටක සමස්ත මුදල් සැපයුමේ පදනම ලෙස සැලකෙන මූල්‍ය වත්කම්, අධිබලැති මුදල් ලෙස හඳුන්වනු ලැබේ. මේවා සංචිත මුදල් හා පදනම් මුදල් යන නම් වලින් ද හැඳින්වේ. රටේ මූල්‍ය සමස්තයන් ගොඩනැගෙනුයේ අධිබල මුදල් තොගය මතය. එබැවින් එය රටක මුදල් සැපයුමේ ප්‍රධාන නිශ්චායකයක් වන්නේය.

(ලකුණු 01 යි)

- අධි බල මුදල් සමන්විත වනුයේ

(අ) මහජනයා හා වානිජ බැංකු සතු ව්‍යවහාර මුදල් ප්‍රමාණය සහ

(ආ) වාණිජ බැංකු සතුව මහ බැංකුවේ ඇති තැන්පතු ප්‍රමාණය යන ප්‍රධාන සංරචක දෙකෙනි. **(ලකුණු 01 යි)**

- අධි බලැති මුදල් මහ බැංකුවේ සිට ආර්ථිකය කරා මුදාහරින ප්‍රධාන යන්ත්‍රණයන් දෙකකි. මින් එක් යන්ත්‍රණයක් වනුයේ මහ බැංකුව විසින් රජයට සහ වාණිජ බැංකුවලට ණය සැපයීම ඔස්සේ දේශීය මූල්‍ය වත්කම් අත්කර ගැනීම ය. අනික් යන්ත්‍රණය වනුයේ මහ බැංකුව රජයෙන් සහ වාණිජ බැංකු වලින් විදේශ විනිමය මිල දී ගැනීම ය. **(ලකුණු 01 යි)**

- මෙම තත්වය යටතේ ආර්ථිකයේ අධිබලැති මුදල් තොගය පාලනය කිරීමේලා පරිපූර්ණ බලයක් මහ බැංකුවට නොමැත. රජයේ බැංකු කරුවා වශයෙන් ආණ්ඩුවේ වියදම් පියවා ගැනීම අවශ්‍ය මූල්‍ය පහසුකම් සැපයීමට මහ බැංකුවට සිදුවේ.

- එසේම විදේශ විනිමය අනුපාතිකයේ උච්චාවචන වළක්වා ගැනීම්වස් විදේශ විනිමය වෙළෙඳපොළට මැදිහත් වීමට මහ බැංකුවට සිදුවේ.

(ලකුණු 01 යි)

(v) මූල්‍ය ප්‍රතිපත්තිරාමුවේ ප්‍රධාන අරමුණු :

- මුදල් ඉලක්කකරණය සහ නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණය යන ද්විත්වයෙහිම ලක්ෂණ සහිතව, වැඩි දියුණු කළ මූල්‍ය ප්‍රතිපත්ති රාමුවක් මත පදනම් වී, ශ්‍රී ලංකා මහ බැංකුව සිය මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරයි.


- මෙම වැඩි දියුණු කළ මූල්‍ය ප්‍රතිපත්ති රාමුව යටතේ, වර්ධන අරමුණු වලට සහ විනිමය අනුපාතික කළමනාකරණයේ නම්‍යශීලීත්වයට සහාය දෙන අතරම, මැදි කාලීනව උද්ධමනය මැදි තනි අගයක පවත්වා ගැනීමට මහ බැංකුව අරමුණු කරයි.

- සංචිත මුදල් තවදුරටත් මෙහෙයුම් ඉලක්කයක් නොවුණ ද, මූල්‍ය ප්‍රතිපත්තියට මගපෙන්වීම සඳහා ඇති ප්‍රධාන අතරමැදි දර්ශකයක් ලෙස පුළුල් මුදල් සැපයුම (M_2b) යොදා ගනී.

- වර්තමානයේ ශ්‍රී ලංකා මහ බැංකුව සිය මෙහෙයුම් ඉලක්කය ලෙස සංචිත මුදල් වෙනුවට බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය (Average weighted call money rate - AWCMR) භාවිත කරනු ලබන අතර, ප්‍රතිපත්ති පොලී අනුපාතිකය සහ විවට වෙළෙඳපොළ කටයුතු වැනි වෙළෙඳපොළ මත පදනම් වූ ප්‍රතිපත්ති උපකරණ මත වැඩි වශයෙන් විශ්වාසය තබා ඇත.


(ඕනෑම එක් කරුණකට ලකුණු 02 බැගින් ලකුණු 04 යි)

06 වන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :



06 ප්‍රශ්නයට අයදුම්කරුවන්ගෙන් 53.89%ක් පමණ පිළිතුරු සපයා ඇත (ප්‍රස්තාරය 2). මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ.

ඉන් ලකුණු 0 - 5 ප්‍රාන්තරයේ 42%ක් පමණ ද
ලකුණු 6 - 10 ප්‍රාන්තරයේ 32%ක් පමණ ද
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 21%ක් පමණ ද
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 5%ක් පමණ ද
ලකුණු ලබාගෙන ඇත.



මෙම ප්‍රශ්නයේ කොටස් 5ක් ඇති අතර (iii) කොටස (අ) සහ (ආ) වශයෙන් උප කොටස් දෙකකින් යුක්ත වේ. මෙම ප්‍රශ්නයේ පහසුතාව වැඩිම කොටස (iii) (අ) කොටසයි. එහි පහසුතාව 61% කි. (v) කොටස පහසුතාව අඩුම කොටස වන අතර එහි පහසුතාව 17% කි.

හයවන ප්‍රශ්නය තෝරාගත් අපේක්ෂකයින් ගේ ප්‍රතිශතය 53.89% කි. මෙය අනු කොටස් පහකින් සමන්විත වේ.

(i) වන අනු කොටසේ පහසුතාව 38% කි. මතුපිට උද්ධමනය සහ මූලික උද්ධමනය අතර සංකල්පමය වෙනස මනා ලෙස හඳුනගෙන නොමැති බැවින් පහසුතාව අඩු මට්ටමක් පෙන්නුම් කර ඇත. මෙම සංකල්ප දෙක අතර වෙනසට හේතුවන විෂය කරුණු පිළිබඳ දැනුම හා අවබෝධය වැඩි දියුණු කළ යුතුය.

(ii) වන අනු කොටසේ පහසුතාව 48% කි. සමාහාර ඉල්ලුමේ සංරචක නිවැරදිව නම් කිරීමට සමත් වූවත්, ඉල්ලුමෙන් ඇඳුණු උද්ධමනය නිශ්චිතව අර්ථකථනය කිරීමටත්, එය නිවැරදිව ප්‍රස්තාරිකව නිරූපනය කිරීමටත් අසමත් වීම නිසා පහසුතාව මධ්‍යස්ථ මට්ටමක පවතී, ප්‍රස්තාර ඇසුරෙන් උද්ධමනය පැහැදිලි කිරීමට කුසලතා වර්ධනය කළ යුතුය.

(iii) කොටස 'අ' සහ 'ආ' වශයෙන් කොටස් දෙකකින් යුක්ත වේ. 'අ' කොටසේ පහසුතාව 61% ක් වන අතර, 'ආ' කොටසේ පහසුතාව 33% කි. බැංකු පද්ධතිය සහ පද්ධතිය තුළ තනි බැංකුවක ක්‍රියාකාරිත්වය අවබෝධ කර නොගැනීම නිසා ඇතැම් අපේක්ෂකයින්ට සාර්ථක ලෙස පිළිතුරු සැපයීමට නොහැකි වී තිබේ. 'ආ' කොටසේ තැන්පතු ඉවත් කර ගැනීමේ දී, එම ප්‍රමාණය තැන්පතුවෙන් හා සංචිතයෙන් ඉවත් කර ගැනීම පිළිබඳ අපේක්ෂකයින්ට ප්‍රමාණවත් අවබෝධයක් නොතිබුණි. අලුත් තැන්පතුවක් ආරම්භ වීමේදීත්, තැන්පතුවක් ඉවත්කර ගැනීමේදීත්, ශේෂ පත්‍රයේ වත්කම් හා වගකීම්වල සිදුවන වෙනස්කම් නිසිලෙස අවබෝධ වන ලෙස ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සකස් විය යුතුය.

(iv) අනු කොටසේ පහසුතාව 33% කි. අධි බලැති මුදල් සමන්විත වන සංරචක නිශ්චිතව හඳුනාගෙන නොතිබීමත්, අධි බලැති මුදල් ආර්ථිකයට මුදා හැරෙන යාන්ත්‍රණය පිළිබඳව අවබෝධයක් නොමැති වීමත් නිසා පහසුතාව අඩු අගයක් ගෙන ඇත. එබැවින් අධි බලැති මුදල් ආර්ථිකයට මුදාහැරෙන යාන්ත්‍රණයන් තහවුරු වන ලෙස නිපුණතා සංවර්ධනය කළ යුතුය.

(v) වන අනු කොටස මෙම ප්‍රශ්නයේ පහසුතාව අඩුම කොටස වේ. එය 17% කි. ශ්‍රී ලංකා මහ බැංකුව වර්තමානයේ අනුගමනය කරනු ලබන මූල්‍ය ප්‍රතිපත්ති රාමුවේ ප්‍රධාන අරමුණු විමසා ඇති ප්‍රශ්නයකි. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පැහැදිළිවම දක්වා ඇති මෙම අරමුණු නොදැන සිටීමෙන් පෙනී යන්නේ අපේක්ෂකයින්ගේ දැනුම යාවත්කාලීන වී නොමැති බවයි. එබැවින් මහ බැංකු වාර්තා සහ වෙනත් මූලාශ්‍ර මගින් දැනුම යාවත්කාලීන කිරීමට කටයුතු කළ යුතුය.

07 ප්‍රශ්නය

7. (i) ශුද්ධ පොදු භාණ්ඩයක් යනු කුමක් ද? අර්ධ පොදු භාණ්ඩයකින් එය වෙනස් වන්නේ කෙසේ ද? (ලකුණු 04 යි)

(ii) නිදහස් වෙළෙඳපොළක් ඍණ බාහිරතා සහිත භාණ්ඩවල අධි නිෂ්පාදනයක් බිහි කරනුයේ ඇයි? යෝග්‍ය ප්‍රස්තාර සටහනක් යොදා ගනිමින් ඔබේ පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(iii) ශ්‍රී ලංකාවේ භාණ්ඩ බදු (excise taxes) අයභාරයේ ප්‍රධාන මූලාශ්‍ර කවරේ ද? (ලකුණු 04 යි)

(iv) "ශ්‍රී ලංකාවේ රාජ්‍ය මූල්‍ය කටයුතු බෙදනීය තත්ත්වයක පවතී" (ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය). ශ්‍රී ලංකාවේ වර්තමාන රාජ්‍ය මූල්‍ය තත්ත්වයේ දක්නට ඇති ප්‍රධාන දුර්වලතා හඳුන්වන්න. (ලකුණු 04 යි)

(v) රාජ්‍ය මූල්‍ය ක්ෂේත්‍රයේ බරපතල ගැටලු විසඳීමේලා ශ්‍රී ලංකා රජය මෑත කාලයේ දී ගෙන ඇති වැදගත් ක්‍රියාමාර්ග සැකෙවින් සඳහන් කරන්න. (ලකුණු 04 යි)


අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

7. (i) - පරිභෝජනයේ තරගකාරීත්වයක් නොමැති සහ පරිභෝජනය සීමාකළ නොහැකි භාණ්ඩ ශුද්ධ පොදු භාණ්ඩ වේ. **(ලකුණු 02 යි)**

- අර්ධ පොදු භාණ්ඩවල ලක්ෂණය වනුයේ ධාරිතා මට්ටම කරා ළඟාවන තුරු පරිභෝජනයේ තරගකාරීත්වයක් දක්නට නොතිබීමත්, පරිභෝජනය සීමා කිරීමේ හැකියාවක් තිබීමත් ය. **(ලකුණු 02 යි)**

(ii) - නිෂ්පාදනයේ ඍණ බාහිරතා පවතින විට නිෂ්පාදනයේ සමාජ පිරිවැය, පෞද්ගලික පිරිවැය ඉක්මවා යයි. එවැනි තත්වයක් පවතින විට නිදහස් වෙළෙඳපොළ සමතුලිත නිමැවුම, සමාජයීය වශයෙන් ප්‍රශස්ත නිමැවුම් මට්ටම ඉක්මවා යන අතර, අධි නිෂ්පාදනයක් හට ගනී. **(ලකුණු 02 යි)**

- මෙම තත්වය ප්‍රස්තාර සටහනක් යොදා ගනිමින් පැහැදිලි කළ හැකිය.




(ඕනෑම නිවැරදි ප්‍රස්තාරයකට ලකුණු 02යි)

- නිදහස් වෙළෙඳපොළ සමතුලිත නිමැවුම = Q
  සමාජයීය වශයෙන් ප්‍රශස්ත නිමැවුම = Q_1
  අධි නිෂ්පාදන ප්‍රමාණය = $Q - Q_1$
  (නිවැරදි ප්‍රස්තාරයට ලකුණු 02 යි)

විකල්ප පිළිතුර :

- පරිභෝජන ක්‍රියාවලියක සෘණ බාහිරතා දක්නට ලැබෙන විට පෞද්ගලික ප්‍රතිලාභ (MPB) සමාජයීය ප්‍රතිලාභ (MSB) ඉක්මවා යයි. එවැනි තත්වයක දී නිදහස් වෙළෙඳපොළ සමතුලිත ඉල්ලුම (නිමැවුම), සමාජයීය වශයෙන් ප්‍රශස්ත ඉල්ලුම් (නිමැවුම්) මට්ටම ඉක්මවා යනු ඇත. එමනිසා එවැනි භාණ්ඩයක අධි පරිභෝජනයක් නැතහොත් අධි නිෂ්පාදනයක් සිදුවේ. **(ලකුණු 02 යි)**

- මෙම තත්වය සරල ප්‍රස්තාර සටහනක් මගින් පැහැදිලි කළ හැකිය.



- නිදහස් වෙළෙඳපොළ සමතුලිත ඉල්ලුම (නිමැවුම) = Qm
- සමාජයීය වශයෙන් ප්‍රශස්ත පරිභෝජනය = Qs
- අධි නිෂ්පාදනය = Qm - Qs

(නිවැරදි රූප සටහනට ලකුණු 02 යි)

(iii)
- ප්‍රධාන භාණ්ඩ බදු මූලාශ්‍ර :
  - සිගරට්
  - මත්පැන්
  - පෙට්‍රෝල්
  - මෝටෝ රථ

(එක් කරුණකට ලකුණු 01 බැගින් ලකුණු 04 යි)

(iv)
- පුළුල් වන අයවැය පරතරයත්, පමණ ඉක්ම වූ රාජ්‍ය ණය සමුච්චනයත් නිසා ණය සේවාකරණ බර ඉහළ නගිමින් පවතී.

- 2016 වර්ෂයේ දී පවත්නා ණය තොගයට පොලී ගෙවීම් සඳහා මුළු රාජ්‍ය අයභාරයෙන් 36.2% ක් අවශෝෂණය වූ අතර, ණය වාරික ගෙවීම සඳහා රාජ්‍ය අය භාරයෙන් තවත් 44% ක් වැය විය. මේ අනුව මුළු රාජ්‍ය අයභාරයෙන් 80.2% ක් ණය සේවාකරණය සඳහා අවශෝෂණය විය.

- ශ්‍රී ලංකාවේ බදු අයභාරයේ විශාලතම මූලාශ්‍රය වී ඇත්තේ වකු බදු ය. වසර ගණනාවක් තිස්සේම සෘජු බදුවල දායකත්වය නොවෙනස්ව පහත් මට්ටමක පවතී.

- දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස රාජ්‍ය අයභාරය 2000 වර්ෂයේ දී 17% ක් ව පැවැතිය ද 2014 වර්ෂය වන විට 11.5% ක් දක්වා පහළ වැටී තිබිණි.

- වර්තමානයේ විවිධ නෛතික ව්‍යුහයක් යටතේ ස්ථාපිත කරන ලද රාජ්‍ය ව්‍යවසායන් 245 ක් දක්නට ලැබේ. මේවා අතරින් අක්‍රීයව පවත්නා සහ පාඩු ලබමින් පවත්නා ආයතන, තම පුනරාවර්තන වියදම් පියවා ගැනීමට අයවැය ලේඛනය මත යැපෙමින් සිටී. මේවා අතුරෙන් ආයතන 55 ක් උපාය මාර්ගික වැදගත් කමක් උසුලන රාජ්‍ය ව්‍යවසායන් ලෙස රජය හඳුනාගෙන ඇත. ඒවා අතුරින් ආයතන 11 ක් අති විශාල පාඩු ලබමින් සිටී. මේවා බලශක්ති, ගුවන්, මගී ප්‍රවාහන සහ ව්‍යාපාරික වතු වැනි වාණිජ පදනමින් පවත්වාගෙන යන ව්‍යාපාරයන් ය.

- ආණ්ඩුවේ වියදම් වල දැඩි දෘඪතාවක් දක්නට ලැබේ. ආණ්ඩුවේ පුනරාවර්තන වියදමින් 86% ක් ම සමන්විත වී ඇත්තේ, පොලී ගෙවීම්, වැටුප් ගෙවීම් සහ කුටුම්බ පැවැරුම් වැනි පහසුවෙන් අඩුකළ නොහැකි අනම්‍යශීලී වියදම් වලිනි.

(එක් කරුණකට ලකුණු 01 බැගින් ඕනෑම කරුණු හතරකට ලකුණු 04 යි)

(v)

- 2016 වසර සඳහා වූ අයවැය ලේඛනය මගින් රජයේ ආදායම ඉහළ නැංවීමේ අරමුණින් ක්‍රියාමාර්ග ගණනාවක් හඳුන්වා දෙනු ලැබීය. ඒ අනුව බදු පදනම පුළුල් කරන අතරම, බදු ක්‍රමය සරල කිරීම හා බදු පරිපාලනය කාර්යක්ෂම කිරීම සඳහා ක්‍රියාමාර්ග ගන්නා ලදී.

- අයවැය හිඟය අඩු කිරීමට පියවර ගනු ලැබ ඇත. 2015 වසරේ දී දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස 7.6% ක් වූ සමස්ත අයවැය හිඟය 2016 වර්ෂයේ දී 5.4% දක්වා අඩු කරගනු ලැබීය. 2020 වන විට සමස්ත අයවැය හිඟය 3.5% ක් දක්වා අඩුකර ගැනීමට අපේක්ෂා කරයි.

- මැදි කාලීනව බදු ආදායම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස 15 - 16% ක් පමණ වට්ටමක් දක්වා වැඩි කිරීම සඳහා බදු පදනම පුළුල් කිරීමටත්, බදු නිදහස් කිරීම, බදු විරාම සහ සාධාරණය සහ ඵලදායී බදු පරිපාලනයට අහිතකර වූ විශේෂිත බදු අනුපාතික අවම කිරීම මගින් බදු පද්ධතිය තාර්කීකරණය කිරීමටත්, පියවර ගෙන ඇත.

- ආදායම ඉහළ නැංවීම සහ බදු පදනම පුළුල් කිරීමේ අරමුණ ඇතිව එකතු කළ අගය මත බදු සහ ජාතිය ගොඩනැංවීමේ බදු සඳහා සංශෝධන කීපයක් හඳුන්වාදෙන ලදී.

- කාණ්ඩ තුනකින් යුත් තීරුබදු ව්‍යුහයක් හඳුන්වා දීම මගින් ආනයන බදු ව්‍යුහය තාර්කීකරණය කරන ලද අතර, තෝරාගත් අයිතම සඳහා තීරුබදු අනුපාතික ඉහළ නංවන ලදී.


- බදු පරිපාලනය වැඩි දියුණු කිරීම සහ ආදායම ඉහළ නැංවීම සඳහා ආදායම් එක්රැස් කරනු ලබන ආයතන වල කටයුතු පරිගණක ගත කිරීමේ ක්‍රියාවලිය වේගවත් කිරීමට පියවර ගෙන ඇත. ආදායම් බදු, එකතු කළ අගය මත බදු, ජාතිය ගොඩනැගීම් බදු, රඳවා ගැනීම් බදු සහ PAYE බදු සඳහා අන්තර් ජාලය (RAMIS) ඔස්සේ බදු වාර්තා පියවීමට ඉඩ සළසනු ලැබ ඇත.

- යටිතල පහසුකම් සංවර්ධනයේදී රාජ්‍ය අයවැය මත පීඩනය අඩු කර ගැනීම සඳහා රාජ්‍ය - පෞද්ගලික හවුල් කාරිත්ව (PPP)දිරිමත් කිරීමට රජය යොමු වී සිටී.

- පාඩු ලබන රාජ්‍ය ව්‍යවසායන් ප්‍රතිසංවිධානය කිරීමට යොමු වී සිටී.


(ඕනෑම එක් කරුණකට ලකුණු 01 බැගින් ලකුණු 04 යි)

07 වන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :



07 ප්‍රශ්නයට අයදුම්කරුවන්ගෙන් 64.98%ක් පමණ පිළිතුරු සපයා ඇත (ප්‍රස්තාරය 2). මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ.

ඉන් ලකුණු 0 - 5 ප්‍රාන්තරයේ 38%ක් පමණ ද
ලකුණු 6 - 10 ප්‍රාන්තරයේ 42%ක් පමණ ද
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 18%ක් පමණ ද
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 2%ක් පමණ ද
ලකුණු ලබාගෙන ඇත.



මෙම ප්‍රශ්නයේ කොටස් 05 ක් ඇති අතර (i) කොටස පහසු ම කොටස වී ඇත. එහි පහසුතාව 72%කි. පහසුතාව අඩු ම කොටස (iii) වී ඇති අතර, එහි පහසුතාව 8%කි. (ii), (iv) සහ (v) කොටස්වල පහසුතා පිළිවෙළින් 46%, 28% සහ 20% වේ.

හත්වන ප්‍රශ්නය තෝරාගත් අපේක්ෂකයින්ගේ ප්‍රතිශතය 64.98% කි. මෙය අනු කොටස් පහකින් සමන්විත වේ.

(i) වන අනු කොටසේ පහසුතාව 72% කි. හත්වන ප්‍රශ්නයේ වැඩිම පහසුතාව පෙන්නුම් කර ඇත්තේ මෙම කොටසේය.

(ii) වන අනු කොටසේ පහසුතාව 46% කි. ඍණ බාහිරතා නිසා වෙළෙඳපොළ සමතුලිත නිමැවුම් මට්ටම සාමාජීය වශයෙන් ප්‍රශස්ත නිමැවුම් මට්ටම ඉක්මවා යන බවත්, එම නිසා අධි නිෂ්පාදනයක් සිදු වන බවත් හඳුනා ගැනීමට අපේක්ෂකයින් දුෂ්කරතාවක් පෙන්නුම් කර ඇත. මෙම අකාර්යක්ෂමතාව ඇති වන ආකාරය රූප සටහන් යොදා ගනිමින් අවබෝධ කර දීමට ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සකස් විය යුතුය.


හත්වන ප්‍රශ්නයේ පහසුතාව අඩුම අගයක් ගෙන ඇත්තේ (iii) වන අනු කොටසය. එය 8% කි. අපේක්ෂකයින් මෙම ප්‍රශ්නය වටහාගත් ආකාරයේ පවත්නා ව්‍යාකූලතාවය නිසා පහසුතාවය අඩු වී ඇත.

(iv) වන අනු කොටසේ පහසුතාව 28% කි. මෙය කාලීන දැනුම පිරික්සන ප්‍රශ්නයකි. අපේක්ෂකයින් ගේ දැනුම යාවත්කාලීන නොවීම නිසා පහසුතාවය අඩු වී ඇත. මහ බැංකු වාර්තාව සහ අදාල අනෙකුත් මූලාශ්‍ර භාවිතා කිරීමට පෙළඹවිය යුතුය.

(v) වන අනු කොටසේ පහසුතාව 20% කි. මෙය කාලීන දැනුම පිරික්සා බැලීමේ ගැටලුවකි. දැනුම යාවත්කාලීන කර ගැනීමට පෙළඹවිය යුතුය.

08 ප්‍රශ්නය

8. (i) ජංගම දුරකථන සහ පා පැදි නිෂ්පාදනය කරනු ලබන A සහ B යන රටවල් දෙකෙහි නිෂ්පාදන හැකියා වක්‍ර පහත රූපසටහනෙහි දැක්වේ.



(අ) එක් එක් රටෙහි පා පැදියක් නිෂ්පාදනය කිරීමේ ආවස්ථික පිරිවැය කොපමණ ද? (ලකුණු 02 යි)

(ආ) ජංගම දුරකථන නිෂ්පාදනයේ සාපේක්ෂ වාසි ඇත්තේ කවර රටකට ද? (ලකුණු 02 යි)

(ඉ) දෙරටට ම වාසිදායක වෙළෙඳාමක් හට ගැනීම සඳහා ජංගම දුරකථන හා පා පැදි අතර හුවමාරු අනුපාතය කුමක් විය යුතු ද? (ලකුණු 02 යි)

(ii) "පසුගිය දශක දෙක තුළ කලාපයේ අනෙකුත් සාමාජික රටවල් හා සැසඳීමේ දී ශ්‍රී ලංකාවේ අපනයන අංශයේ කාර්ය සාධනය පහළ මට්ටමක පවතී." ශ්‍රී ලංකාවේ අපනයන ක්ෂේත්‍රයේ කාර්ය සාධනය දුර්වල තත්ත්වයක පැවතීමට බලපා ඇති හේතු දක්වන්න. (ලකුණු 04 යි)

(iii) කිසියම් ආර්ථිකයක පොදු මිල මට්ටමේ සැලකිය යුතු ඉහළ යාමක් එරට ගෙවුම් ශේෂයේ ජංගම ගිණුම කෙරෙහි කෙසේ බලපානු ලැබේ දැයි පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(iv) 'බාහිර ස්ථායිතාව' යන්නෙන් කවරක් අදහස් වන්නේ දැයි පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

(v) යුරෝපා සංගමය කරා යොමු වන ශ්‍රී ලංකා අපනයන සඳහා ජී එස් පී ප්ලස් (GSP+) තීරු බදු සහනය නැවත ලබාදීම නිසා ලැබිය හැකි ප්‍රතිලාභ කවරේ දැයි සැකෙවින් සඳහන් කරන්න. (ලකුණු 04 යි)

අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

8. (i) (අ) A රටෙහි : පාපැදියක ආවස්ථික පිරිවැය
ජංගම දුකරථන 3 කි.
පාපැදි 400 : දුරකථන 1200
1 : 3 (ලකුණු 01 යි)

B රටෙහි : පාපැදියක ආවස්ථික පිරිවැය :
ජංගම දුරකථන 1 කි.
පාපැදි 600 : දුරකථන 600
1 : 1 (ලකුණු 01 යි)

(ආ) ජංගම දුරකථන නිෂ්පාදනයේ සාපේක්ෂ වාසි :

A රට : ජංගම දුරකථන 1200 : පාපැදි 400
ජංගම දුරකථන 1 : පාපැදි 1/3

B රට : ජංගම දුරකථන 400 : පාපැදි 400
ජංගම දුරකථන 1 : පාපැදි 1

(ආවස්ථික පිරිවැය ගණනයට ලකුණු 01 යි)

- මේ අනුව ජංගම දුරකථන සඳහා සාපේක්ෂ වාසිය ඇත්තේ අඩුම ආවස්ථික පිරිවැය සහිත A රටට ය. **(ලකුණු 01 යි)**

(ඉ) වාසිදායක හුවමාරු අනුපාතය :

A රට : පාපැදි 1 : දුරකථන 3 (අභ්‍යන්තර හුවමාරු අනුපාතය)
B රට : පාපැදි 1 : දුරකථන 1 (අභ්‍යන්තර හුවමාරු අනුපාතය)
මේ අනුව අන්‍යෝන්‍ය වශයෙන් වාසිදායක හුවමාරු අනුපාතය වනුයේ :

පාපැදි 1 = දුරකථන 1 - 3 (1 ට වඩා වැඩි සහ 3 ට වඩා අඩු)
ජංගම දුරකථන 1 = පාපැදි 1/3 - 1 (1/3 ට වඩා වැඩි සහ 1 ට වඩා අඩු)

(ඕනෑම එක් විනිමය අනුපාතයක් සඳහා ලකුණු 02 යි)

(ii)

- අපනයන නිෂ්පාදිත විවිධාංගකරණය වී ඇත්තේ අනිශය සීමිත ආකාරයකටය. තේ සහ ඇඟලුම් යන සාම්ප්‍රදායික නිෂ්පාදිත දෙකක් මත අපනයන ව්‍යුහය සංකේන්ද්‍රණය වී පවතී. මුළු අපනයන ප්‍රමාණයෙන් අඩකට වැඩි ප්‍රමාණයක් සඳහා මෙම නිෂ්පාදිත දෙක වගකියයි.

- අපනයන වෙළෙඳපොළවල් ද ප්‍රමාණවත් ලෙස විවිධාංගකරණය නොමැත. යුරෝපය සහ ඇමෙරිකා එක්සත් ජනපදය මුළු ප්‍රමාණයෙන් 2/3 කට වගකියයි. එසේම තේ අපනයන ප්‍රමාණයෙන් 70% කට වැඩි ප්‍රමාණයක් යොමු වී ඇත්තේ මැද පෙරදිගට සහ රුසියාවට ය.

- අපනයනාභිමුඛ කර්මාන්තයන්හි ප්‍රමාණවත් ආයෝජනයක් සිදු නොවීම : නැගෙනහිර ආසියාවේ නව කාර්මික රටවල අපනයන ප්‍රවර්ධනයේ දී සෘජු විදේශ ආයෝජන ඉතා ප්‍රබල කාර්ය භාරයක් ඉටු කරන ලදී. එහෙත් මේ ක්ෂේත්‍රය නිසි පරිදි කළමනාකරණය කර ගැනීමට ශ්‍රී ලංකාව අසමත්ව සිටී. ශ්‍රී ලංකාවට සෘජු විදේශ ආයෝජන ගලා එනුයේ අතිශය සීමාසහිත ප්‍රමාණයකිනි. එම ආයෝජන ද වැඩි වශයෙන් යොමුව ඇත්තේ යටිතල පහසුකම් සහ සේවා සැපයීම් අංශයන් වෙත ය.

- තේ අපනයන අංශයේ ඉහළ පිරිවැය සහ අඩු ඵලදායිතාව කැපී පෙනේ. තේ නිෂ්පාදනය කරන සෙසු රටවල් සමඟ බලන විට ශ්‍රී ලංකාවේ නිෂ්පාදන පිරිවැය ඉතා ඉහළ ය.

- ශ්‍රම හමුදාව අඩු වීම හා ශ්‍රම පිරිවැය ඉහළ යාම : තේ කර්මාන්ත අංශයේ ශ්‍රමය රඳවා ගැනීම විශාල අභියෝගයක් වී ඇත. තේ කර්මාන්තයේ නියැළී

කම්කරුවන්ගේ සමාජ තත්වය පහත මට්ටමක තිබීමත්, තරුණ පරපුර අධ්‍යාපන මට්ටමින් ඉහළට යාමත්, තේ වතුවලින් පිටත වඩාත් ආකර්ශනීය රැකියා අවස්ථා තිබීමත් මේ තත්වයට ප්‍රධාන වශයෙන් බලපා ඇත.

- අපනයන ප්‍රවර්ධනය සඳහා ස්ථාපිත කොට ඇති ප්‍රධාන රාජ්‍ය ආයතනය වන්නේ අපනයන සංවර්ධන මණ්ඩලයයි. මෙම ආයතනයේ දුබලතා රැසකි. අපනයන ප්‍රවර්ධනය සඳහා උපාය මාර්ගික දැක්මක් නොතිබීම, අපනයන ප්‍රවර්ධනය සඳහා සම්පත් ප්‍රමාණවත්ව නොතිබීම, අපනයන ප්‍රවර්ධන ක්‍රියාකාරකම් අධීක්ෂණය දුර්වල වීම, අපනයන ප්‍රවර්ධනය සඳහා ප්‍රතිලාභීන් ඉලක්ක ගත නොවීම ඒ අතර ප්‍රධාන වේ.

(ඕනෑම කරුණකට ලකුණු 01 බැගින් ලකුණු 04 යි)

(iii) - පොදු මිල මට්ටමේ සැලකිය යුතු ඉහළයාමක් නිසා අපනයන නිෂ්පාදිතයන්ගේ දේශීය මිල ගණන් ඉහළ යනු ඇත. පවත්නා විනිමය අනුපාතිකය යටතේ විදේශීය වෙළෙඳපොළවල අපනයන මිල ඉහළ නගින අතර, අපනයන සඳහා නම්‍ය ඉල්ලුමක් පවතිනැයි උපකල්පනය කරනු ලැබුවහොත්, අපනයන පරිමාව (ඉල්ලුම් ප්‍රමාණය) පහළ වැටෙනු ඇත. එහිදී අපනයන මිල වැඩි වූ ප්‍රතිශතය ඉක්මවා අපනයන පරිමාව අඩු වන බැවින්, ගෙවුම් ශේෂයේ වර්තන ගිණුමේ අපනයන ඉපයීම් පහළ වැටෙනු ඇත.

- පොදු මිල මට්ටම ඉහළ යාමක දී අපනයන භාණ්ඩ පමණක් නොව වෙළෙඳාමට පාත්‍ර නොවන භාණ්ඩ වලද දේශීය මිල ගණන් ඉහළ යන අතර, ආනයනික භාණ්ඩ වල දේශීය මිලෙහි කිසිදු වෙනසක් නොසිදු වුව ද, සාපේක්ෂ වශයෙන් ආනයනික භාණ්ඩ දේශීය භාණ්ඩ වලට වඩා ලාභ දායක වනු ඇත. එබැවින් ආනයන පරිමාව සහ ආනයන වියදම් ඉහළ යාම නිසා, ගෙවුම් ශේෂයේ ජංගම ගිණුම මත අයහපත් පීඩනයක් හටගනී.

- දේශීය ආර්ථිකයේ සැලකිය ප්‍රමාණයක උද්ධමන පීඩනයක් හටගෙන ඇති විට පවත්නා විනිමය අනුපාතිකය යටතේ අපනයන පරිමාව පහළ වැටීමට හා ආනයන පරිමාව ඉහළ නැගීමට නැඹුරුතාවක් ඇති වේ. මින් අදහස් වන්නේ පවත්නා විනිමය අනුපාතිකය යටතේ විදේශ විනිමය වෙළෙඳපොළෙහි දේශීය මුදල් සැපයුම වැඩිවන (ආනයන ඉල්ලුම වැඩි වීම නිසා) බවත් දේශීය මුදලට ඇති ඉල්ලුම අඩුවන (අපනයන ඉල්ලුම අඩුවීම නිසා) බවත් ය. මෙහි ප්‍රතිඵලය වනුයේ දේශීය මුදල් ඒකකයේ බාහිර වටිනාකම ක්ෂයවීමය. මෙහි ප්‍රතිඵල වශයෙන් දිගු කාලයේ දී ගෙවුම් ශේෂයේ ජංගම ගිණුම මත වාසිදායක බලපෑමක් හටගත හැකිය. එහෙත් අවසාන වශයෙන් එය රඳාපවතිනුයේ මාර්ෂල් - ලර්නර් කොන්දේසිය කොතෙක් දුරට ඉටුවේද යන්න මතය.

(එක් කරුණකට ලකුණු 02 බැගින් ඕනෑම කරුණු දෙකකට ලකුණු 04 යි)

(iv) - ඕනෑම රටක ආර්ථික ප්‍රතිපත්තියේ මූලික අභිලාශයක් වනුයේ ගෙවුම් ශේෂය සහ විදේශ මූල්‍ය කටයුතු වල තිරසාර භාවය ප්‍රවර්ධනය කිරීම සඳහා බාහිර ස්ථායිතාව සාක්ශාත් කර ගැනීම ය.

- ආනයන වියදම් පියවා ගැනීමට ප්‍රමාණවත් අපනයන ඉපයීම් ප්‍රමාණයක් අත්කර ගත හැකි නම්, බාහිර ස්ථායිතාව ආරක්ෂා කර ගත හැකියි. එවැනි තත්වයක් ඇතිවිටක විනිමය අනුපාතිකයේ උච්චාවචන වළක්වා ගනිමින්, මැදි කාලීනව හා දිගුකාලීන විදේශ වගකීම් පහසුවෙන් මුදාහැරිය හැකිය.

- නිල විදේශ විනිමය සංචිත භාවිතයකින් තොරව සමස්ත ගෙවුම් ශේෂය තුලනය කරගත් විට බාහිර ස්ථායිතාව තහවුරු වේ.

- බාහිර ස්ථායිතාව මිනුම් කෙරෙන සෘජු මිනුමක් දක්නට නොමැත. රටක විදේශ ආර්ථික ක්‍රියාකාරකම් වල ස්වභාවය නිරූපණය කෙරෙන පහත සඳහන් දර්ශක ඒ ඒ සඳහා යොදා ගත හැකි ය.
  - (i) දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් ජංගම ගිණුම් හිඟය.
  - (ii) දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් ශුද්ධ විදේශ වගකීම් සහ
  - (iii) විදේශ විනිමය අනුපාතිකය යනාදිය යි.

(එක් කරුණකට ලකුණු 01 බැගින් ලකුණු 04 යි)

(v) - මෑත කාලයේ විශාල පසුබෑමකට ලක්ව තිබූ ශ්‍රී ලංකාවේ අපනයන ක්ෂේත්‍රයට යුරෝපා සංගමය මගින් ලබාදෙන විශේෂ ප්‍රතිලාභ සහිත වෙළෙඳවරණයක් පිළිබඳ පොදුක්‍රමය (ජී.එස්.පී. ප්ලස් සහනය) නැවත ලබාදීම අතිශය සහනදායක කරුණක් විය. මෙම සහනය නිසා රෙදිපිළි, කුඩා යන්ත්‍රෝපකරණ, ධීවර නිෂ්පාදන ඇතුළු විශාල පරාසයකට වැටෙන ශ්‍රී ලාංකික නිෂ්පාදිත 1200 කට ආසන්න ප්‍රමාණයක් කිසිදු තීරු බද්දකින් තොරව යුරෝපා සංගමයට අපනයනය කිරීමට අවස්ථාව උදා වී ඇත.


- 2010 - 15 යුරෝපා සංගමයට යොමු වූ ශ්‍රී ලංකා අපනයන වර්ධනය වූයේ 1.02% තරම් වූ නොවැදගත් ප්‍රමාණයකිනි. ජී.එස්.පී. ප්ලස් සහනය අහිමිවීමත් සමග ශ්‍රී ලංකාවේ අපනයන මත තීරු බදු පැනවීම නිසා, අප රට හා සමාන අපනයන සපයමින් සිටි බංග්ලාදේශය, වියට්නාමය සහ ඉන්දියාව වැනි රටවල් සමඟ තරගකිරීමට අපහසු තත්වයක් ශ්‍රී ලංකාවට ඇතිවිය. මෙම තත්වය ඉතා අහිතකර අන්දමින් බලපානු ලැබුවේ තම නිෂ්පාදිත විවිධාංගීකරණය කිරීමට අවශ්‍යකරන මූල්‍යමය හා තාක්ෂණික සම්පත් සොයාගත නොහැකි වූ මධ්‍යම පරිමාණයේ ඇගලුම් නිෂ්පාදන ආයතන වලට ය. එම කර්මාන්ත ශාලා බොහෝමයක් වසා දැමීමට සිදුවිය. එසේම GSP+ තීරුබදු සහනය හිමි කරගෙන සිටි බංග්ලාදේශය සහ වියට්නාමය වැනි රටවලට ශ්‍රී ලාංකික ආයෝජකයන් මෙන්ම විදේශීය ආයෝජකයෝ ද යොමු වූහ. මෙම තත්වය තුළ ජී.එස්.පී. ප්ලස් සහනය යළි ලබාගත හැකි වීම ශ්‍රී ලංකාවේ තරගකාරීත්වය උසස් කර ගැනීමට දායක වනු ඇත.

- තීරුබදු සහනය විශේෂයෙන් ම ශ්‍රී ලංකාවේ ඇගලුම් සහ ධීවර නිෂ්පාදන ක්ෂේත්‍රයට විශාල ජවයක් සපයනු ලැබේ. එසේම ශ්‍රී ලංකාවේ පශ්චාද් යුධ සාමකාමී පරිසරය තුළ යළි ඉස්මතුවෙමින් පවතින කුඩා පරිමාණ නිෂ්පාදන ක්ෂේත්‍රයන්ට අපනයන වෙළෙඳපොළවල් සඳහා ප්‍රවේශ වීමට ද මෙම තීරුබදු සහනය විශාල ඉඩ ප්‍රස්තාවක් සපයා තිබේ.

- එසේම ශ්‍රී ලංකාවට විදේශීය ආයෝජකයන් ආකර්ශණීය කර ගැනීම සඳහා ද තීරුබදු සහනය යළි ස්ථාපිත කිරීමෙන් උදා වූ හිතකර පරිසරය දායක වනු ඇත. තීරුබදු සහනයේ වාසි ලබා ගනිමින් අපනයන කර්මාන්ත මෙම රට තුළ ආරම්භ කිරීමට විදේශීය ආයෝජකයන් පෙළබෙනු ඇතැයි අපේක්ෂා කළ හැකිය.


(ඕනෑම කරුණකට ලකුණු 02 බැගින් ලකුණු 04 යි)

08 වන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :



08 ප්‍රශ්නයට අයදුම්කරුවන්ගෙන් 53.65%ක් පමණ පිළිතුරු සපයා ඇත (ප්‍රස්තාරය 2). මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ.

ඉන් ලකුණු 0 - 5 ප්‍රාන්තරයේ 44%ක් පමණ ද
ලකුණු 6 - 10 ප්‍රාන්තරයේ 36%ක් පමණ ද
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 16%ක් පමණ ද
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 4%ක් පමණ ද
ලකුණු ලබාගෙන ඇත.



මෙම ප්‍රශ්නයේ කොටස් 05 ක් ඇති අතර (i) (අ) කොටස වඩාත් ම පහසු වී ඇත. එහි පහසුතාව 71%කි. පහසුතාව අඩු ම කොටස් දෙකක් ඇත. එනම් (iii) හා (iv) කොටස්ය. ඒවායේ පහසුතාව 17% බැගින් වේ.

අටවන ප්‍රශ්නය තෝරාගත් අපේක්ෂකයින් සංඛ්‍යාව 53.65% වේ. මෙය අනු කොටස් පහකින් සමන්විත වේ.

(i) අනු කොටස 'අ', 'ආ', 'ඉ' වශයෙන් කොටස් 3 කි. ඒවායේ පහසුතාව පිළිවෙලින් 71%, 62% හා 42% වේ.

(අ) ප්‍රස්තාර කියවීමේ හැකියාව ප්‍රගුණ කරවීමෙන් 'අ'කොටසේ පහසුතාව තව දුරටත් වැඩි කර ගත හැකි වනු ඇත.

(ආ) ආවස්ථික පිරිවැය ඇසුරින් සාපේක්ෂ වාසිය හඳුනා ගැනීමේ නොහැකියාව නිසා (ආ) කොටසේ පහසුතාව මධ්‍යස්ත මට්ටමක පැවතුනි. ඒ සඳහා තර්කානුකූලව, පිරිවැය වාසි විශ්ලේෂණ හැකියාව වැඩි දියුණු කිරීමේ අභ්‍යාසවල නිරත කළ යුතුය.

(ඉ) පළමුවන කොටසේ අඩුම පහසුතාව සහිත අනු කොටස (ඉ) කොටසයි. සාපේක්ෂ වාසි පදනම් කරගනිමින් හුවමාරු අනුපාතිකයන් තීරණය කිරීමේ නොහැකියාව පහසුතාව අඩු වීමට හේතු වී ඇත. අභ්‍යන්තර හා බාහිර හුවමාරු අනුපාතයන් පැහැදිලිව ගණනය කළ හැකි ආකාරයට සුදුසු ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක් සංවිධානය කර ගත යුතුය.

(ii) වන අනු කොටසේ පහසුතාව 25% කි. මෙහි පහසුතාව අඩු වීමට හේතු වී ඇත්තේ ශ්‍රී ලංකාවේ විදේශ වෙළෙඳාම සම්බන්ධ කාලීන තොරතුරු පිළිබඳ දැනුවත් බව ප්‍රමාණවත් නොවීමය. එබැවින් අදාළ විෂය ක්ෂේත්‍රය පිළිබඳ දැනුම වර්ධනය කෙරෙන පරිදි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගත යුතුය.

(iii) වන අනු කොටසේ පහසුතාව 17% කි. මෙය ගෙවුම් ශේෂය, ජංගම ගිණුම හා මිල මට්ටම යන සංකල්ප සම්බන්ධ කරමින් අසන ලද ප්‍රශ්නයකි. මෙම සංකල්ප සහ සංකල්ප අතර සම්බන්ධතාවය පිළිබඳ අවබෝධය නොමැති වීම නිසා පහසුතාව ඉතා අඩු වී ඇත. පොදු මිල මට්ටමේ වෙනස්වීම් අපනයන හා ආනයන මගින් වෙළෙඳ ශේෂයටත්, එමගින් ජංගම ගිණුමටත් ඇති කරන බලපෑම පැහැදිලි වන සේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගත යුතුය.

(iv) වන අනු කොටසේ පහසුතාව 17% කි. බාහිර ස්ථායීතාව යන සංකල්පය සහ එය ආරක්ෂා කර ගැනීමේ ක්‍රියාමාර්ග පිළිබඳව සිසුන්ගේ දැනුවත්භාවය අඩුවීම පහසුතාව අඩුවීමට හේතු වී ඇත. මෙම සබඳතා තහවුරු වන ආකාරයට නිපුණතා සංවර්ධනය කළ යුතුය.

(v) වන අනු කොටසේ පහසුතාව 38% කි. GSP+ වැනි කාලීන තොරතුරු පිළිබඳව සිසුන්ගේ අවධානය යොමු නොවීම පහසුතාව අඩු වීමට හේතු වී ඇත. ආර්ථිකයේ සිදුවන මෑත කාලීන වෙනස්කම් පිළිබඳව තොරතුරු යාවත්කාලීන කර ගැනීමට කටයුතු කළ යුතුය.

09 ප්‍රශ්නය

9. (i) රටක ජීවන තත්ත්වය මැනීමේලා දළ දේශීය නිෂ්පාදිතය යොදා ගැනීමේ දුර්වලතා සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(ii) 'නිෂ්පාදන ධාරිතාව' යන සංකල්පය පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

(iii) කිසියම් රටක නිෂ්පාදන ධාරිතාව තීරණය කරන මූලික සාධක කවරේ ද? (ලකුණු 04 යි)

(iv) ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව මනිනු ලබනුයේ කෙසේ ද? (ලකුණු 05 යි)

(v) ජනගහනය වියපත් වීම නිසා ශ්‍රී ලංකාව මුහුණ පා සිටින ප්‍රධාන ආර්ථික අභියෝග කවරේ ද? (ලකුණු 05 යි)

අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

9. (I)

- දළ දේශීය නිෂ්පාදිතය රටක නිෂ්පාදනය කරනු ලබන භෞතික භාණ්ඩ හා සේවා ප්‍රමාණය කැටිකොට දක්වන මිනුමක් වන අතර, පුද්ගලයන්ගේ ජීවන තත්වය කෙරෙහි බලපෑම් කරන ගුණාත්මක කරුණු (උදා : සාමකාමී පරිසරයක්, අදහස් ප්‍රකාශනයේ නිදහස, යහපාලනය, තේරීමේ නිදහස යනාදිය) එම මිනුම තුළ සලකා නොබැලේ.

- නොවිධිමත් අංශයේ නිෂ්පාදනයේ වටිනාකම් නිවැරදිව පිළිබිඹු නොවන බැවින්, රටතුළ නිපදවනු ලබන සැබෑ භෞතික භාණ්ඩ හා සේවා ප්‍රමාණය වුව ද එමගින් නිවැරදි ව නොමැනේ. නොවිධිමත් අංශයේ ආර්ථික ක්‍රියාකාරකම් පිළිබඳ ඇස්තමේන්තු කළ අගයන්, සැබෑ අගයට වඩා උෆන තක්සේරු වූ හෝ අධි තක්සේරු වූ හෝ අගයන් විය හැකි ය.

- දළ දේශීය නිෂ්පාදිතයට අදාළ සංඛ්‍යා, රටක ආදායම් ව්‍යාප්තියේ ස්වභාවය මුළුමනින් ම අමතක කොට ඇත. ජීවන තත්වය කෙරෙහි සෘජු බලපෑමක් ඇති ආදායම් විෂමතාවන් ජාතික ගිණුම් දත්තවල පිළිබිඹු නොවේ.

- දළ දේශීය නිෂ්පාදිතය සහ ඒ හා අදාළ අනෙකුත් සංකල්ප (ප්‍රතිශීර්ෂ ආදායම, මූර්ත ආදායම) ජීවන තත්වය පිළිබඳ අසම්පූර්ණ මිනුම් වේ. බොහෝ ඵලදායි නිෂ්පාදන ක්‍රියාකාරකම් එමගින් පිළිබිඹු නොවේ. උදාහරණ වශයෙන් තමන් විසින් ම නිවස තුළ ඉටු කරන ඵලදායි කටයුතු, ගෘහණියන්ගේ සේවාවන් යනාදිය දැක්විය හැකි ය.

- නිවැරදි තොරතුරු සපයාගත නොහැකි නිසා නිරීක්ෂණය නොකරනු ලබන ආර්ථිකයේ සිදුවන නීතිවිරෝධී ආර්ථික ක්‍රියාකාරකම් (උදා: නීති විරෝධී මත්ද්‍රව්‍ය සහ මත්පැන්) වල වටිනාකම දළ දේශීය නිෂ්පාදිතය තුළ ඇතුළත් නොවේ.

- දළ දේශීය නිෂ්පාදිතය තුළ ඇතුළත් භාණ්ඩ හා සේවා මිනිසුන්ගේ ජීවිතයේ ගුණාත්මක තත්වය කෙරෙහි කෙසේ බලපානු ලැබේදැයි එය සලකා නොබලයි. උදාහරණයක් වශයෙන් නාගරික ප්‍රදේශවල ජීවත් වන මිනිසුන්ට තම ආදායමින් සැලකිය යුතු කොටසක් නාගරීකරණය ආශ්‍රිත ගැටලු විසඳාගැනීම සඳහා යොමු කිරීමට සිදු වේ. නිදසුනක් වශයෙන් නාගරික ප්‍රදේශ වල මිනිසුන්ට තම නිවාස හා

දේපළ සොරසතුරන්ගෙන් ආරක්ෂා කර ගැනීමට විශේෂ ආරක්ෂක විධිවිධාන සහ උපකරණ මිල දී ගැනීමට සිදුවේ. ආත්මාරක්ෂක ක්‍රම පුහුණුවීමේ පංතිවලට යාමට සිදුවේ. ආතතිය සමනය කර ගැනීම සඳහා ඖෂධ මිල දී ගැනීමට සිදුවේ.

- මිනිසුන් ජීවත්වන පරිසරයේ ගුණාත්මක තත්වය දළ දේශීය නිෂ්පාදිත සංඛ්‍යා වලින් සොයා නොබැලේ. පරිසර දූෂණය වළක්වා ගැනීමට යොදා ගැනෙන නීති රීති ඉවත් කරනු ලැබුවහොත් කිසියම් රටකට නිමැවුම් මට්ටම (දළ දේශීය නිෂ්පාදනය) ඉහළ නංවාගත හැකිය. එහෙත් මෙහි දී ඉහළ ආදායම් මට්ටමක් හෝ ඉහළ ප්‍රතිශීර්ෂ ආදායමක් හෝ තිබූ පමණින්, ජීවන තත්වය උසස් වී ඇතැයි නිගමනය කළ නොහැකි ය. ආදායම ඉහළ ගොස් තිබිය දී වාතය, ජලය සහ වෙනත් සම්පත් දූෂණයට ලක්ව තිබිය හැකි ය.

- මිනිසුන්ගේ ජීවිතයේ ගුණාත්මක තත්වයට සෘජුවම බලපාන විවේක කාලය සඳහා දළ දේශීය නිෂ්පාදිත සංඛ්‍යා මගින් වටිනාකමක් ලබා නොදේ. මිනිසුන් දිනකට පැය 12 ක් සහ සතියකට දින 7 ක් වැඩෙහි යෙදුණොත් රටකට දළ දේශීය නිෂ්පාදිතය ඉහළ නංවා ගත හැකි ය. මිනිසුන්ට විවේක කාලයක් භුක්ති විඳීමට නිදහසක් නොමැති නම් භාණ්ඩ හා සේවා ප්‍රමාණය ඉහළ නංවාගැනීමෙන් උසස් ජීවන මට්ටමක් තහවුරු කරගත නොහැකි වේ.

- දළ දේශීය නිෂ්පාදිතය ගණනය කිරීමේ දී යහපත් භාණ්ඩ සහ අයහපත් භාණ්ඩ වශයෙන් ප්‍රභේදයක් නොදකී. කිසියම් රටක භූමි කම්පාවක් හටගෙන නිවාස, ගොඩනැගිලි සියල්ල පුනරුත්ථාපනය කරනු ලැබුවහොත්, දළ දේශීය නිෂ්පාදිතය ඉහළ නගී. පුද්ගලයෝ රෝගී තත්වයට පත් වී එයින් ඵලදායීම සඳහා රෝහල් ගත වුවහොත් සහ ඖෂධ මිල දී ගත් විට, දළ දේශීය නිෂ්පාදිතය ඉහළ නගී. එහෙත් භූමි කම්පා හට ගැනීම හෝ මිනිසුන් රෝගී තත්වයට පත්වීම හෝ ජීවන තත්වය උසස් වීමට දායක වෙතියි කිසිවකු නොපවසයි.

- තාක්ෂණයේ ප්‍රතිලාභ සැලකිල්ලට ගැනීමට ද දළ දේශීය නිෂ්පාදිත සංඛ්‍යා අසමත්ව සිටී. විවිධ නොමිල මෘදුකාංග (free Apps.) ඔස්සේ ඔබගේ ජංගම දුරකථනයට ලැබෙන විවිධ පහසුකම් (උදා : මාර්ග සිතියම්, කාලගුණ තොරතුරු, මාර්ග තදබදය පිළිබඳ තොරතුරු හා වෙනත් සංනිවේදන පහසුකම්) ගුණාත්මක ජීවත තත්වය උසස් කිරීමට විශාල දායකත්වයක් සපයයි. එහෙත් ඒවා සඳහා මිලක් අය නොකෙරෙන බැවින් එම ප්‍රතිලාභ ජාතික ගිණුම් වටිනාකම් තුළ පිළිබිඹු නොවේ.

(ඕනෑම එක් කරුණකට ලකුණු 01 බැගින් ලකුණු 04 යි)

(ii) - ආර්ථිකයකය තිරසාර ලෙස, උද්ධමන පීඩනයකින් තොරව, නිෂ්පාදනය කිරීමට හැකියාව ඇති මුළු භාණ්ඩ හා සේවා ප්‍රමාණය රටක නිෂ්පාදන ධාරිතාව යන්නෙන් අදහස් වේ. ආර්ථිකයේ ප්‍රාග්ධන තොගය සහ ශ්‍රමය පූර්ණ ලෙස සහ කාර්යක්ෂම ලෙස උපයෝජනය කරනු ලැබුවහොත්, නිෂ්පාදනය කළ හැකි භාණ්ඩ හා සේවා ප්‍රමාණයයි. නිෂ්පාදන ධාරිතාව හැඳින්වීමට යොදා ගැනෙන තවත් පදයක් නම් විභව නිමැවුමයි. **(ලකුණු 02 යි)**

විකල්ප පිළිතුර :

- යන්ත්‍ර සූත්‍ර හා උපකරණ වැනි සියලු ස්ථාවර ප්‍රාග්ධන වත්කම් කාර්යක්ෂම ලෙස උපයෝජනය කරන්නේ නම් සහ වැටුප් අනුපාතික වෙනස් වීම් වල ස්ථායිතාව රැකෙන ආකාරයට විරැකියා අනුපාතිකය, එහි ස්වාභාවික මට්ටමෙහි පවත්වා ගන්නේ නම්, ලබාගත හැකි නිමැවුම් මට්ටම ආර්ථිකයේ නිෂ්පාදන ධාරිතාව ලෙස සැලැකේ. **(ලකුණු 02 යි)**

(iii)

- භෞතික ප්‍රාග්ධනය
- මානව ප්‍රාග්ධනය
- ස්වාභාවික ප්‍රාග්ධනය
- සමාජ ප්‍රාග්ධනය
- තාක්ෂණය
- ඵලදායිතාව

(එක් කරුණකට ලකුණු 01 බැගින් ඕනෑම කරුණු හතරක් සඳහා ලකුණු 04 යි)

(iv)

- කුටුම්බ ප්‍රතිශීර්ෂ පරිභෝජනය නිල දරිද්‍රතා රේඛාවට වඩා පහළ අගයක් ගනු ලබන පුද්ගල සංඛ්‍යාවගේ ප්‍රතිශතය ලෙස ශ්‍රී ලංකාවේ දරිද්‍රතා මට්ටම මැනේ.

(ලකුණු 02 යි)

- ජනගහන දරිද්‍රතා දර්ශකය හෙවත් දිළිඳු කුටුම්බ ප්‍රතිශතය ගණනය කරනු ලබන්නේ කුටුම්බ ආදායමේ - වියදම් සමීක්ෂණයක් ඔස්සේ කුටුම්බවල සියලුම ආහාර සහ ආහාර නොවන පරිභෝජන වියදම් සැලකිල්ලට ගනිමිනි. විවිධ දිස්ත්‍රික්ක අතර තිබිය හැකි ජීවන වියදම් වෙනස්කම් සහ කුටුම්බ තුළ සිටින පුද්ගල සංඛ්‍යාව ද මෙහි දී සැලකිල්ලට ගනී. **(ලකුණු 01 යි)**

- එලෙස ඇස්තමේන්තු කරනු ලබන කුටුම්බ ප්‍රතිශීර්ෂ පරිභෝජන වියදම ජාතික දරිද්‍රතා රේඛාව සමග සංසන්දනය කෙරේ. ජාතික දරිද්‍රතා රේඛාව නිර්වචනය කරනු ලැබ ඇත්තේ පුද්ගලයෙකුට දිනකට කිලෝකැලරි 2030 ක කැලරි අවශ්‍යතාවක් සපුරා ගැනීමට, කොතරම් මුදලක් වියදම් කිරීමට සිදුවේ ද යන්න පදනම් කර ගනිමිනි. 2012/13 ආදායම් වියදම් සමීක්ෂණයේ තොරතුරු මත ඇස්තමේන්තු කරන ලද දරිද්‍රතා රේඛාවේ වටිනාකම රුපියල් 3624 ක් විය.

(ලකුණු 01 යි)

- කුටුම්බයක මාසික මූර්ත ප්‍රතිශීර්ෂ පරිභෝජන වියදම නිල දරිද්‍රතා රේඛාවට වඩා අඩුද යන්න මත දරිද්‍රතාවට මුහුණ දී සිටින පුද්ගලයන් හඳුනාගනු ලැබේ.

(ලකුණු 01 යි)

(v)

- සිය ප්‍රධාන ආදායම් මාර්ගය ලෙස විශ්‍රාම වැටුප් හිමිවනුයේ, ශ්‍රී ලංකාවේ වැඩිහිටි ජනගහනයෙන් දහයෙන් කොටසකට පමණක් බව ඇස්තමේන්තු කොට ඇත. එබැවින් වැඩිහිටියන් සඳහා පවුලෙන් ලැබෙන උපකාර සහ අනුග්‍රහයන් ඉදිරි දශක කීපය තුළ දී ද තවදුරටත් වැදගත් වේ. එසේ වුවද, ශීඝ්‍ර නාගරීකරණයත් සමග කුඩා පවුල් ඇතිවන බැවින් වැඩිහිටියන් සඳහා පවුලෙන් ලැබෙන උපකාර අඩුවීමේ ප්‍රවණතාවයක් දැක්නට ලැබේ. ග්‍රාමීය - නාගරික සංක්‍රමණය සහ ශ්‍රම බලකායේ

ස්ත්‍රී සහභාගීත්වය ඉහළයාම නිසා, ග්‍රාමීය ප්‍රදේශවල පවා වැඩිහිටියන්ට උපකාර කිරීම හා රැකබලා ගැනීම තවදුරටත් ගැටලුකාරී වේ.

- විශ්‍රාම වැටුප් සහ සෞඛ්‍ය වියදම් ඉහළයාම නිසා රජයේ අයවැය මත අනිවාර්යයෙන් පීඩනයක් ඇතිවන අතර, මෙම තත්වයන් හේතුවෙන් වෙනත් අංශ මත ඇතිවන අහිතකර බලපෑම් (උදා : සංවර්ධන වියදම් කප්පාදු කිරීම) බරපතල ගැටලු බවට පත්විය හැකිය.

- වැඩකරන වයසේ පුද්ගලයෙකුට සාපේක්ෂව, වියපත් පුද්ගලයෙකු විසින් කරනු ලබන ඉතුරුම් ප්‍රවාහය අඩුබැවින්, එය ආර්ථිකයේ ප්‍රාග්ධන සම්පාදනය මත සැලකිය යුතු නිශේධනාත්මක බලපෑමක් ඇති කරනු ඇත.

- වියපත් වීම හේතුවෙන් වැඩ කරන වයසේ පසුවන ජනගහනයේ ප්‍රතිශතය අඩුවීම, ආර්ථික වර්ධනය අඩාල කරමින් ශ්‍රම බලකාය හීන කිරීමට හේතු විය හැකිය. එමගින් ආදායම් බදු පදනම මෙන්ම කුටුම්බ ආදායම ද අඩුවිය හැකි අතර ඒ හේතුවෙන් රජයේ බදු ආදායම තවදුරටත් පහළ යා හැකි ය.


- ඉදිකිරීම්, කෘෂි කර්මාන්තය, සෞඛ්‍යය හා හෝටල්/ සංචාරක ක්ෂේත්‍රය ඇතුළු අංශ කිහිපයක ශ්‍රම හිඟයකට ශ්‍රී ලංකාව දැනටමත් මුහුණ පාමින් සිටී. ශ්‍රමය සංක්‍රමණය වීමට අමතරව ජනගහනය වියපත් වීම ද ශ්‍රම හිඟය සඳහා යම් දායකත්වයක් සපයනු ලබන අතර, මෙම ප්‍රවණතාව ඉදිරි දශක කීපය තුළ දී වඩාත් හොඳින් දැකගත හැකි වනු ඇත.

- අධ්‍යාපනය හා ආදායම මට්ටම් ඉහළයාමත් සමග සාපේක්ෂව ඉහළ වැටුප් හා පිළිගැනීමක් පැවැතීම හේතුවෙන් මෙරට තරුණ පිරිස් සුදු කරපටි රැකියා කරා යොමුවීමේ ප්‍රවණතාවක් ඇත. එහි ප්‍රතිඵලය වශයෙන් විදේශීය සංක්‍රමණික ශ්‍රමිකයන් කෘෂි කාර්මික කටයුතු සමහරක සහ ඉදිකිරීම් ක්ෂේත්‍රයේ කටයුතු වල යෙදී සිටී. එබැවින් ජනගහනයේ සිදුවන වෙනස්කම්, නව පරම්පරාවේ අභිලාශයන්, ශ්‍රම සංක්‍රමණ, රාජ්‍ය මූල්‍ය ගැටලු හා දේශීය ආර්ථිකය හා යනාදිය සැලකිල්ලට ගෙන සවිස්තරාත්ම ශ්‍රම වෙළෙඳපොළ ප්‍රතිපත්තියක් සකසා ගැනීමේ අවශ්‍යතාව පවතී.

- ශ්‍රී ලංකාවේ වියපත් වන ජනගහනයෙන් කාන්තා ප්‍රතිශතය ක්‍රමයෙන් ඉහළ යාමක් පවතී. වියපත් ස්ත්‍රී ජනගහනයෙන් වැඩි කොටසක් එම කාණ්ඩයේ පුරුෂයන්ට සාපේක්ෂව ආර්ථිකමය වශයෙන් සක්‍රීය නොවේ. මෙම අවදානම් වයසේ පසුවන ස්ත්‍රී යැපෙන්නන් ඉලක්ක කරගත් ඉදිරිගාමී ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය වේ.


(එක් කරුණකට ලකුණු 01 බැගින් ඕනෑම අභියෝග පහකට ලකුණු 05 යි)

09 වන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :



09 ප්‍රශ්නයට අයදුම්කරුවන්ගෙන් 25.17%ක් පමණ පිළිතුරු සපයා ඇත (ප්‍රස්තාරය 2). මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ.

ඉන් ලකුණු 0 - 5 ප්‍රාන්තරයේ 69%ක් පමණ ද
ලකුණු 6 - 10 ප්‍රාන්තරයේ 23%ක් පමණ ද
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 6%ක් පමණ ද
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 2%ක් පමණ ද
ලකුණු ලබාගෙන ඇත.



මෙම ප්‍රශ්නයේ කොටස් 5 ක් ඇති අතර (v) කොටස වඩාත් ම පහසු වී ඇත. එහි පහසුතාව 31%කි. පහසුතාව අඩු ම කොටස (i) වී ඇත. එහි පහසුතාව 2% කි. (iv) කොටස ද පහසුතාව අඩු කොටසක් වන අතර එහි පහසුතාව 6% කි.

නවවන ප්‍රශ්නය තෝරාගත් අපේක්ෂකයින් සංඛ්‍යාව 25.17% කි. මෙම ප්‍රශ්නය අනු කොටස් පහකින් යුක්ත වේ.

(i) වන අනු කොටස මෙහි අඩුම පහසුතාව පෙන්වන කොටස වන අතර, එය 2% කි. ජාතික ගිණුම්කරණය සහ ආර්ථික වර්ධනය හා සංවර්ධනය යන ඒකක දෙකෙහිම විෂය කොටස් ග්‍රහණය කර නොගැනීම නිසා මෙහි පහසුතාව අඩු වීඇත. මෙම විෂය කොටස් තහවුරු වන සේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සිදු කළ යුතුය.

(ii) වන අනු කොටසෙහි පහසුතාව 10% කි. නිෂ්පාදන ධාරිතාව සහ විභව නිමැවුම යන සංකල්ප එකිනෙකට සමාන බව නොදැන සිටීම නිසා පහසුතාව බොහෝ සෙයින් අඩු වී ඇත. එකම සංකල්පය හැඳින්විය හැකි විවිධ නාමයන් පිළිබඳ අවධානය යොමු කරමින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය කළ යුතුය.

(iii) වන අනු කොටසේ පහසුතාවය 18% කි. නිෂ්පාදන ධාරිතාව තීරණය කෙරෙන මූලික සාධක පිළිබඳව නිශ්චිත දැනුමක් නොමැති වීම පහසුතාවය අඩු වීමට හේතු වී ඇත. අදාළ නිශ්චිත කරණු අවධාරණය වන සේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සිදු කළ යුතුය.

(iv) වන අනු කොටසේ පහසුතාව 6% කි. ශ්‍රී ලංකාවේ නිල දරිද්‍රතා රේඛාව සහ එය ගණනය කරන ආකාරය පිළිබඳව ප්‍රමාණවත් දැනුමක් නොමැති නිසා අඩු පහසුතා අගයක් පෙන්වයි. නිල දරිද්‍රතාව ගණනය කිරීමේ දී යොදා ගන්නා ආදායම් වියදම් සමීක්ෂණ වාර්තා පිළිබඳවත්, නිල දරිද්‍රතා රේඛාව පිළිබඳවත් අවබෝධයක් ලැබෙන ආකාරයට ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සිදු කළ යුතුය.

(iv) වන අනු කොටසේ පහසුතාව 31% කි. ශ්‍රී ලංකාව මුහුණ පා සිටින ප්‍රධාන අභියෝගයක් වන ජනගහණය වියපත් වීම පිළිබඳව අපේක්ෂකයින් නොදැනුවත්ව සිටීම පහසුතාව අඩු වීමට හේතු වී ඇත. ආර්ථිකය පිළිබඳ දැනුම යාවත්කාලීන කර ගැනීම මගින්, මෙවැනි ප්‍රශ්නවල පහසුතාව වැඩි කිරීම, කර ගත හැකිය.

10 ප්‍රශ්නය

10. (i) ශ්‍රී ලංකාවේ යටිතල පහසුකම් සංවර්ධනයෙහිලා යොදා ගත හැකි උපායමාර්ගයක් වශයෙන් රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයේ (PPP) වාසි කවරේ ද? (ලකුණු 05 යි)

(ii) "ව්‍යාපාර පවත්වාගෙන යාමේ පහසුව සහ ආයෝජන වාතාවරණය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව දිගින් දිගට අසමත්භාවයක් පෙන්නුම් කොට තිබේ." ශ්‍රී ලංකාවේ ව්‍යාපාර පවත්වාගෙන යාමේ දී බලපා ඇති වඩාත් ගැටලුකාරී සාධක කවරේ ද? (ලකුණු 05 යි)

(iii) "සංචාරක කර්මාන්තය ශ්‍රී ලංකා ආර්ථිකයේ වේගයෙන් වර්ධනය වන ක්ෂේත්‍රයක් බවට පත්ව තිබේ." විදේශ විනිමය ඉපයීම් සහ සේවා නියුක්තියට සංචාරක කර්මාන්තයේ මෑත කාලීන දායකත්වය පෙන්වා දී, එම කර්මාන්තය වර්තමානයේ මුහුණ දෙන අභියෝග සාකච්ඡා කරන්න. (ලකුණු 05 යි)

(iv) "ශ්‍රී ලංකාවේ ග්‍රාමීය දිළිඳු ජනගහනයෙන් අඩක් ම සුළු පරිමාණ ගොවියෝ වෙති." අඩු ඵලදායිතාව හා අඩු ආදායම් සඳහා හේතු වන දේශීය කෘෂිකර්මාන්තයේ ප්‍රධාන ගැටලු හඳුන්වන්න. (ලකුණු 05 යි)

අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

10. (I)

- යටිතල පහසුකමේ සංවර්ධනයෙහිලා වඩාත් සාර්ථක ක්‍රමවේදයකි. තනිකරම පෞද්ගලික අංශය හෝ රාජ්‍ය අංශය හෝ එම කාර්යයේ ඉටු කරනවා වෙනුවට, ඒ දෙපාර්ශ්වයම සහභාගී වෙමින් තම තමන්ට වඩාත් හොඳින් කළ හැකි කාර්යයන් ඒ ඒ පාර්ශ්වය විසින් තෝරාගෙන ව්‍යාපෘති ක්‍රියාවට නැගිය හැකි වේ.

- ව්‍යාපෘති නිම කිරීමට ගත වන කාලය කඩිනම් කරමින් ප්‍රමාද වීම වළක්වා ගත හැකි වේ. කාර්ය සාධනය මනින දර්ශකයක් ලෙස ව්‍යාපෘති නිම කිරීමට ගත වන කාලය යොදාගත හැකිය.

- තනිකරම රජය හෝ පෞද්ගලික අංශය හෝ ඉටුකරන ව්‍යාපෘතියකට වඩා ඉහළ ආයෝජන ලබන අනුපාතිකය රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරීත්ව ව්‍යාපෘති මගින් අත්කර ගත හැකිය. දෙපාර්ශ්වයම එක්ම ක්‍රියාත්මක කරන විට සලසුම් කිරීම හා මූල්‍ය ණය යන කරුණු සලකා නව්‍ය ක්‍රමවේද යොදා ගැනීමට අවස්ථාව සැලසේ.

- ව්‍යාපෘතියක අවදානම් සියල්ල ඇගයීමකට ලක්කොට එහි ශක්‍යතාව තීරණය කරනු ලැබේ. හුදෙක් රජයේ දේශපාලන අවශ්‍යතා සහ වෙනත් අභිලාශයක් මත ශක්‍යතාවකින් තොර ව්‍යාපෘතියක් ක්‍රියාවට නැගීමට සැලසුම් කරනු ලැබුව හොත් පෞද්ගලික අංශය එවැන්නක් ක්‍රියාත්මක කිරීමට එකඟ නොවනු ඇත.

- පිරිවැය පාලනය කිරීමේලා වඩා පළපුරුද්ද සහ අත්දැකීම් ඇති පෞද්ගලික අංශය වෙත ව්‍යාපෘති මෙහෙයවීම් සහ ක්‍රියාවට නැගීමේ අවදානම් පැවැරීමට රජයට අවස්ථාව සැලසේ.

- බොහෝ රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරිත්ව ව්‍යාපෘතිය තුළ කල්තබා ව්‍යාපෘති නිම කිරීම වෙනුවෙන් ලබාදෙන ප්‍රසාද දීමනා (bonus) ඇතුළත් වන බැවින්, සියලු ව්‍යාපෘති වඩාත් කාර්යක්ෂමව නිම කිරීමට හැකියාව ලැබේ.

- රජයේ අරමුදල් වඩාත් කාර්යක්ෂම ලෙස වැය කිරීම මේ යටතේ ඉඩ සැලසෙන බැවින් සමාජ ආර්ථික වැදගත් කමක් ඇති වෙනත් ක්ෂේත්‍ර කෙරෙහි සීමිත රාජ්‍ය අරමුදල් යොමු කිරීමට අවස්ථාව උදා වේ.

- රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරිත්ව සහිත ව්‍යාපෘතිවල කාර්යක්ෂමතාව වැඩි බැවින් එය රාජ්‍ය මූල්‍යයට වාසිදායක වේ. අයවැය පරතරය අඩු කර ගැනීමට දායක වනු ඇත.

- ව්‍යාපෘති ජීවන චක්‍රයේ සෑම අදියරකදීම ඉහළ ප්‍රමිති මට්ටමක් පවත්වා ගෙන යාමට හැකියාව ලැබේ.

- රාජ්‍ය වියදම් අඩුකර ගැනීමට ඉඩ සැලැසෙන බැවින් ජනතාව මත බදු බර ද අඩු විය හැකිය.

- පෞද්ගලීකරණ ක්‍රමවේදයන්ට සමාජයේ දැඩි විරෝධතාවක් පවතින විට එයට සාර්ථකව මුහුණ දිය හැකි විකල්ප ප්‍රවේශයක් ලෙස රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරිත්ව ව්‍යාපෘති දැක්විය හැකි ය.

(ඕනෑම කරුණකට ලකුණු 01 බැගින් කරුණු පහකට ලකුණු 05 යි)

(ii)
- ප්‍රතිපත්ති අස්ථායිතාව / අවිනිශ්චිතතාව
- මූල්‍ය ණය සඳහා ඉඩ ප්‍රස්ථා සීමා වීම.
- අකාර්යක්ෂම රාජ්‍ය නිලධාරී තන්ත්‍රය
- ඉහළ බදු අනුපාතික
- සංකීර්ණ බදු රෙගුලාසි
- යටිතළ පහසුකම් ප්‍රමාණවත් නොවීම.
- උද්ධමනය
- ජාතික ශ්‍රම හමුදාවේ වැඩපොළ විනය දුර්වල වීම.
- දූෂණය
- නව්‍යතා බිහි කිරීමට ඇති ධාරිතාව සීමා සහිත වීම
- දේශපාලන අස්ථායිතාව
- විදේශ විනිමය පිළිබඳ පවතින රෙගුලාසි
- උගත් ශ්‍රම හමුදාව ප්‍රමාණවත් නොවීම.
- ශ්‍රම වෙළෙඳපොළ රෙගුලාසි දැඩිවීම.
- අපරාධ සහ සොරකම්

(එක් කරුණකට ලකුණු 01 බැගින් එකිනෙක කරුණු පහකට ලකුණු 05 යි)

(iii) - විදේශ විනිමය ඉපයීම් :

මුදල් ඒකකය	2015	2016
ශ්‍රී ලංකා රුපියල් මිලියන	405,492	512,294
ඇමෙරිකානු ඩොලර් මිලියන	2,981	3,518

(ලකුණු 01 යි)

විකල්ප පිළිතුර :

- ශ්‍රී ලංකාවේ මුළු විදේශීය විනිමය ඉපයීම් සඳහා සංචාරක කර්මාන්තයේ දායකත්වය 2015 දී 12.4% ක් වූ අතර 2016 වර්ෂයේ දී එය 14.2% ක් විය. විදේශ ප්‍රේෂණ සහ රෙදිපිළි හා ඇඟලුම් වලට පසුව තුන් වැනි තැනට පත්ව ඇත්තේ සංචාරක කර්මාන්තය යි. **(ලකුණු 01 යි)**

- සේවානියුක්තියට දායකත්වය :

	2014	2015	2016
සෘජු සේවා නියුක්තිය	129,790	135,930	146,115

(ලකුණු 01 යි)

විකල්ප පිළිතුර :

- සංචාරක කර්මාන්තය බිහිකළ සෘජු සහ වක්‍ර සේවා නියුක්තිය 2015 දී 319,436 ක් වූ අතර, 2016 දී 335,659 ක් විය. **(ලකුණු 01 යි)**

සංචාරක කර්මාන්තය මුහුණ දෙන අභියෝග :

- සංචාරකයින්ගේ අපේක්ෂිත වර්ධනයට සමගාමීව හෝටල් කාමර ප්‍රමාණවත් නොවීම. අපේක්ෂිත විශාල සංචාරක ප්‍රමාණයකට පහසුකම් සැලසීම සඳහා හෝටල් කාමර 40,000 ත් 50,000 ත් අතර ප්‍රමාණයක් අවශ්‍ය වෙතියි ඇස්තමේන්තු කොට ඇතත්, 2016 අවසානයේ දී සංචාරක හෝටල් හා අතිරේක ආයතන යන දෙඅංශයම සතුව පැවැතියේ හෝටල් කාමර 34,000 ක් පමණි.

- පුහුණු සේවකයන්ගේ අවශ්‍යතාව සහ ශ්‍රම සංක්‍රමණය :
සංචාරක කර්මාන්තයේ නියැලුණු ශ්‍රී ලාංකික පුහුණු ශ්‍රමිකයින් විශාල පිරිසක් ඉහළ වැටුප් වෙනුවෙන් විදේශීය රටවල සේවයේ යෙදී සිටී. සංචාරක කර්මාන්තයේ ඉහළ යන පුහුණු ශ්‍රමික අවශ්‍යතා සපුරා ගැනීම සඳහා අවශ්‍ය සේවක පුහුණු කිරීම රජයට කිරීම සිදුකළ නොහැකි බැබින් ඒ සඳහා රාජ්‍ය හා පෞද්ගලික අංශ හවුල් කටයුතු කිරීම අත්‍යවශ්‍ය වේ.

- ලෝක ප්‍රසිද්ධ හෝටල් දාම ශ්‍රී ලංකාව වෙත දක්වා ඇති අවධානය ප්‍රමාණයක් නොවීම : බොහෝ ප්‍රමුඛ පෙළේ හෝටල් දාම ඔවුන්ගේ හෝටල් ව්‍යාපාර ශ්‍රී ලංකාවෙන් තවමත් ප්‍රමාණවත් පරිදි ව්‍යාප්ත කොට නොමැත. ෆෝබ්ස් සඟරාව නම්කර ඇති ලොව හොඳම අන්තර් ජාතික සුඛෝපභෝගී හෝටල් දාම සන්නාම 10 අතුරින් ශ්‍රී ලංකාවේ දක්නට ඇත්තේ හෝටල් දාම තුනක් පමණි.

- නොවිධිමත් අංශය අන්තර්ග්‍රහණය කිරීම :
  සංචාරක කර්මාන්තයේ විධිමත් අංශය හොඳින් නියාමනය වී තිබුණ ද, කර්මාන්තය තුළ සැලකිය යුතු අවිධිමත් අංශයක් ක්‍රියාත්මක වෙමින් පවතී. එබැවින් විධිමත් අංශය වෙත එම කොටස ද අන්තර් ග්‍රහණය කර ගැනීම සඳහා අවධානය යොමු කිරීම අත්‍යවශ්‍ය වේ. නොවිධිමත් අංශය තුළ සංචාරක කර්මාන්තයේ ආරක්ෂාව සහ ආචාර ධර්ම වැඩි දියුණු කිරීම අත්‍යවශ්‍ය වන අතර, එසේ කිරීමට අපොහොසත් වීම රටේ යහපත් ප්‍රතිරූපය බිඳ වැටීමට හේතුවනු ඇත.

- විශාල විභවතාවක් පවතින චීනයෙන් පැමිණෙන සංචාරකයින්ගේ වර්ධනයට සරිලන සේ පහසුකම් සැපයීමට ඇති හැකියාව : සංචාරක කර්මාන්තයේ දැනට පවතින වර්ධනය වෙමින් පවතින චීන සංචාරකයන් සඳහා අවශ්‍ය පහසුකම් සපුරාලීමේ දී නව අභියෝග නිර්මාණය වී ඇත. එහි දී චීන භාෂාවෙන් විකාශණය වන රූපවාහිනිය හා ගුවන් විදුලි නාලිකා, චීන භාෂාව කථාකරන සංචාරක මග පෙන්වන්නන් යනාදිය අවශ්‍ය වේ.

- නැවතී සිටින රාත්‍රී සංඛ්‍යාව ලෙස ගණනය කෙරෙන සංචාරකයෙකු නැවතී සිටින සාමාන්‍ය කාල සීමාව වසර ගණනාවක් පුරා එකලෙසම පැවැතීම : දෛනික සංචාරක වියදම පසුගිය වසර කීපය පුරා වර්ධනය වී තිබුණ ද, ප්‍රධාන වශයෙන් ම සංචාරකයන් සඳහා ශ්‍රී ලංකාවේ පවතින ක්‍රියාකාරකම් අඩුවීම නිසා සංචාරකයෙකු නැවතී සිටින සාමාන්‍ය කාල සීමාව සංචාරක රාත්‍රී 10 ක් පමණ නොවෙනස් ව පවතී. එම නිසා ශ්‍රී ලංකාවේ පවතින සංචාරක ආකර්ශණයන් විවිධාංග කරණය කිරීම සඳහා ප්‍රතිපත්තිමය තීරණ ගත යුතු වන අතර, එහි දී සංචාරක රාත්‍රී සංඛ්‍යාව අවම වශයෙන් සති දෙකක් ලෙස ඉලක්ක කිරීම සඳහා මගී, නෞකා සහ සාමුද්‍රික සංචාර, විවේකය අරමුණු කරගත් සංචාර, විනෝදාස්වාදය අරමුණු කරගත් සංචාර, වැනි සංචාරක කර්මාන්තයේ පසුගාමී අංශ කෙරෙහි වඩාත් අවධානය යොමු කළ යුතු වේ.

- නව නිර්මාණාත්මක ප්‍රවේශයක අවශ්‍යතාව :
  තොරතුරු ලබා ගැනීම සඳහා පමණක් නොව, බස්රථ, දුම්රිය, කුලී රථ සහ හෝටල් වෙන් කිරීම්, ජංගම දුරකථන සම්බන්ධතා, වයි-ෆයි සම්බන්ධතා, සංචාරක සැලසුම් ආදී වූ පුළුල් පරාසයක පැතිරෙන පරිදි සංචාරකයනට සේවා සපයන්නා වූ බහුකාර්ය සංචාරක තොරතුරු මධ්‍යස්ථාන සංඛ්‍යාව ප්‍රධාන සංචාරක ආකර්ශණයන් හි සහ ප්‍රධාන ප්‍රවාහන කේන්ද්‍රස්ථානයන්හි තවදුරටත් වැඩි කිරීම් අවශ්‍යතාවක් පවතී.

- සංචාරක ක්ෂේත්‍රය සම්බන්ධ රාජ්‍ය ආයතන ද පෞද්ගලික අංශය ද ඇතුළුව සංචාරක කර්මාන්තයේ නියුතු සියලුම පාර්ශ්වකරුවන් අධීක්ෂණය කිරීම සඳහා ඉහළ මට්ටමේ රාජ්‍ය ව්‍යුහයක් අවශ්‍යවන අතර එමගින් වඩා සහසම්බන්ධතාවයකින් යුතුව ඉහළ මට්ටම් ක්‍රමෝපාය ක්‍රියාවට නැගීමට ඉඩ සැලසෙනු ඇත.

(ඕනෑම එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු තුනකට ලකුණු 03 යි)

(iv) - ජල සැපයුම ප්‍රමාණවත් නොවීම, ජල කළමනාකරණය දුර්වල වීම, ඇළ මාර්ග, වැව් සහ ඇනිකට් වැනි වාරිමාර්ග පහසුකම් වල පවත්නා දුර්වලතා.

- දැඩි නියං කාලයන් පැවැතීම, ජල ගැලීම් සහ ලවණ ජලය ගලා ඒම වැනි කරුණු නිසා කාර්මික භෝගවල ඵලදාව පහළ වැටීම.

- පාංශු බාදනය වැනි හේතු නිසා පසේ සශ්‍රීකත්වය අඩුවීම.

- වරින් වර හඳුන්වා දෙනු ලැබූ විවිධ කෘෂි සංවර්ධන ව්‍යාපෘති අකාර්යක්ෂම ලෙස ක්‍රියාවට නැංවීම: (උදා : 2007 වර්ෂයේ හඳුන්වා දෙන ලද ජාතික කෘෂි කාර්මික ප්‍රතිපත්තිය, 'අමා', වගා සංක්‍රාමය, ගොවි සෙවන, අපි වවමු රට නගමු, යනාදිය)

- තාක්ෂණය භාවිතය පසුගාමී වීම.
විද්‍යාත්මක ගොවිතැන් ක්‍රම අනුගමනය නොකිරීම, ඉහළ ඵලදාව ලබාදෙන බීජ හිඟකම, සාම්ප්‍රදායක ක්‍රම මත දැඩිව රඳා පැවැත්ම

- අලෙවිකරණය ආශ්‍රිත ගැටලු : වී අලෙවි මණ්ඩලය වැනි ආයතන ඔස්සේ ක්‍රියාත්මක වන රාජ්‍ය යන්ත්‍රණයන් අකාර්යක්ෂම වීම.

- පොහොර සහනාධාර වෙනුවට මූල්‍ය ආධාර ලබාදීම.

- පශ්චාද් අස්වනු හානි

- ව්‍යාප්ති සේවා දුබල වීම.


- ග්‍රාමීය මට්ටමින් කෘෂි කර්මය පදනම් කරගත් කර්මාන්ත ප්‍රමාණවත්ව බිහි නොවීම.

- වන සතුන් නිසා සිදුවන වගා හානි

- අනාර්ථික බිම් කැබලි වල වගා කටයුතු කිරීම.


(එක් කරුණකට ලකුණු 01 බැගින් ඕනෑම කරුණු පහකට ලකුණු 05 යි)

10 වන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :



අයදුම්කරුවන්ගෙන් 27.68%ක් මෙම ප්‍රශ්නය සඳහා පිළිතුරු සපයා ඇත (ප්‍රස්තාරය 2). මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වෙයි.

ඉන් ලකුණු 0 - 5 ප්‍රාන්තරයේ 50%ක් පමණ ද
ලකුණු 6 - 10 ප්‍රාන්තරයේ 35%ක් පමණ ද
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 13%ක් පමණ ද
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 2%ක් පමණ ද
ලකුණු ලබාගෙන ඇත.



මෙම ප්‍රශ්නයේ කොටස් 04 ක් ඇති අතර (iv) කොටස වඩා පහසු වී ඇත. එහි පහසුතාව 46%කි. පහසුතාව අඩු ම කොටස (iii) වී ඇත. එහි පහසුතාව 19% කි.

දහවන ප්‍රශ්නය තෝරාගත් අපේක්ෂකයින් සංඛ්‍යාවේ ප්‍රතිශතය 27.68% කි. මෙය අනු කොටස් හතරකින් යුක්ත වේ.

(i) වන අනු කොටසේ පහසුතාව 28% කි. වර්තමානයේ ශ්‍රී ලංකාවේ යටිතල පහසුකම් සැපයීමේ දී අනුගමනය කෙරෙන උපාය මාර්ග සහ ක්‍රමවේද පිළිබඳව සිසුන් නොදැනුවත් වීම පහසුතාවය අඩු වීමට හේතුවයි. කාලීන තොරතුරු පිළිබඳව විමසිල්ලෙන් සිටීමට සිසුන් පෙළඹවිය යුතුය.


(ii) වන අනු කොටසේ පහසුතාව 33% කි. වර්තමානයේ ශ්‍රී ලංකාවේ ආරථිකය පිළිබඳ කාලීන තොරතුරු යාවත්කාලීන නොවීම නිසා පහසුතාව අඩු වී ඇත. මෙවැනි කාලීන ආර්ථික වැඩ සටහන් ගවේශණයට අපේක්ෂකයින් පෙළඹවිය යුතුය.

(iii) වන අනු කොටසේ පහසුතාව 19% ක් වන අතර, එය අඩුම පහසුතාවක් පෙන්නුම් කළ අනු කොටස වේ. මෑත කාලයේදී සංචාරක කර්මාන්තය මුහුණ දෙන අභියෝග සහ විනිමය ඉපැයුම් පිළිබඳ කාලීන දත්ත පිළිබඳ අවබෝධය නොමැති වීම පහසුතාව අඩු වීමට හේතුවයි. ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ ප්‍රධාන ක්ෂේත්‍රයක් වන සංචාරක කර්මාන්තය වැනි අංශ පිළිබඳව අපේක්ෂකයින් කරුණු ගවේශණය කිරීමට යොමුවන ලෙස ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය යොමු විය යුතුය.

(iv) වන අනු කොටස මෙම ප්‍රශ්නයේ වැඩිම පහසුතාව සහිත කොටස වේ. එය 46% කි. මෙහි පහසුතාව වැඩි කර ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ දැනුම යාවත්කාලීන වන ලෙස නිපුණතා සංවර්ධනය කළ යුතුය.

2.2.3 II ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :

මෙම ඇගයීම් වාර්තාව සැකසීමේදී භාවිත කරන ලද තොරතුරු සංවිධානය කිරීමෙන්, II පත්‍රයේ එක් එක් ප්‍රශ්නයෙහි තෝරාගැනීමේ ප්‍රතිශත හා පහසුතාව දැක්වෙන පහත සඳහන් ප්‍රස්තාරය සහ වගුව ගොඩනැගිය හැකිය.



ප්‍රශ්න අංකය	1	2	3	4	5	6	7	8	9	10
තෝරා ගැනීමේ ප්‍රතිශතය	96	98	60	17	29	54	65	54	25	28
පහසුතාව %	58	51	50	38	46	37	35	35	7	31

ප්‍රශ්න අංක 01 සිට 05 තෙක් ප්‍රශ්න “අ”කොටසට ද අංක 6 සිට 10 තෙක් ප්‍රශ්න “ආ” කොටසට ද අයත් ය. අපේක්ෂකයන් විසින් “අ” කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් ද “ආ” කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් ද වන සේ ප්‍රශ්න තෝරා ගනිමින් ප්‍රශ්න පහකට පිළිතුරු සැපයිය යුතු විය.

“අ” කොටසේ ප්‍රශ්න පහ අතුරෙන් වැඩියෙන් ම තෝරාගැනීමට ලක්ව ඇත්තේ අංක 02 සහ 01 ප්‍රශ්න වන අතර, “ආ” කොටසේ ප්‍රශ්න පහ අතුරෙන් වැඩියෙන් ම තෝරා ගැනීමට ලක්ව ඇත්තේ අංක 06 සහ 05 ප්‍රශ්න වේ. ඒවා තෝරාගනු ලැබීමේ ප්‍රතිශත පිළිවෙළින් 98.37%, 96.38%, 64.98% සහ 53.89% වේ. ඊළඟට වැඩි ම තෝරාගනු ලැබීමට යොමුව ඇත්තේ 03 වන ප්‍රශ්නය යි. විකල්ප ප්‍රශ්න හයක් අතුරෙන් වැඩි ම තෝරාගනු ලැබීමට ලක්ව ඇති එම ප්‍රශ්නයට අපේක්ෂකයින්ගෙන් අඩකට වැඩි (59.91%) සංඛ්‍යාවක් පිළිතුරු සපයා ඇත. විෂය නිර්දේශයෙහි, මෙම ප්‍රශ්නවලට පාදක වූ තේමා සහ විෂය කරුණු, ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ වැඩි අවධානයට ලක් වූ හා සිසුන් අතර වඩාත් ජනප්‍රිය වූ ඒවා ය. එබැවින් එම ප්‍රශ්නවල පහසුතා මට්ටම් සාපේක්ෂ වශයෙන් ඉහළ අගයක් ගත යුතුය. ප්‍රශ්න තෝරා ගනු ලැබීමේ ප්‍රතිශතවල අවරෝහණ පටිපාටියෙහි මුලින් ම පිහිටන ප්‍රශ්න අනුපිළිවෙළින් අංක 09 සහ 10 වේ. එහෙත් පහසුතාවල එම පටිපාටියෙහි මුලින් ම පිහිටන ප්‍රශ්න අනුපිළිවෙළින් 07 සහ 08 වේ. අංක 07 සහ 08 ප්‍රශ්න වැඩියෙන් තෝරා ගනු ලැබ ඇති නමුදු, ඒවාට සපයන ලද පිළිතුරු එතරම් සතුටුදායක නො වන බවත් වැඩියෙන් ලකුණු උපයා ගැනීමට සමත් වී නොමැති බවත් මෙම තොරතුරුවලින් ගම්‍ය වේ. එබැවින් සිසුන්ගේ වැඩි අවධානයට ලක්වන මෙවැනි ප්‍රශ්නවලින් ඉහළ ලකුණු ලබාගැනීම සඳහා ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේදී සිසුනට මඟ පෙන්වීම වඩාත් සාර්ථක ප්‍රතිඵල ලැබීමට මහෝපකාරී වේ.

වැඩි ම තෝරාගැනීමක් කොට ඇති අංක 02 ප්‍රශ්නයෙහි වුව ද පහසුතාව 50%කට සීමා වී තිබීම ද ආර්ථික විද්‍යාව විෂයයෙහි ප්‍රගතිය අපේක්ෂා කරන්නන්ගේ අවධානයට ලක්විය යුතු කරුණකි. ස්ව අභිප්‍රේරණයෙන් යුතුව ප්‍රශ්නයකට පිළිතුරු සපයන්නෙකුට, සාමාන්‍ය වශයෙන් ප්‍රශ්නයට හිමි මුළු ලකුණුවලින් වැඩි ප්‍රතිශතයක් උපයා ගැනීමට හැකිවන ආකාරයට තම පිළිතුර නිවැරදි විෂය කරුණු ඇසුරෙන් සංවිධානය කර නිශ්චිතව ඉදිරිපත් කිරීමට ද මඟ පෙන්වනු ලැබිය යුතුය.

අඩුවෙන් ම තෝරා ගනු ලැබ ඇත්තේ අංක 09 ප්‍රශ්නය වන අතර එහි පහසුතාව ද 7%ක අවම අගයකට සීමා වී ඇත. ඊට පාදක වී ඇති විෂය කරුණු කෙරෙහි පන්ති කාමර ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ ප්‍රමාණවත් අවධානයක් යොමු වී නැති බව පෙනේ. 13 වන ශ්‍රේණියේ අවසාන වාරයේ දී සිසුන්ගේ පාසැලට පැමිණීම දුර්වල වීම වැනි හේතු මෙම තත්ත්වයකට ප්‍රධාන වශයෙන් හේතු වී තිබිය හැකිය.

II පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සැලකූ විට පහසුතම ප්‍රශ්නයේ පහසුතාව වුවද 50%කට සීමාවීමත් අංක 1සහ 2 හැර අනෙක් ප්‍රශ්න අටෙහිම පහසුතාව 65%ට වඩා අඩුවීමත් මෙම විෂයය හා සම්බන්ධ සියලු ම පාර්ශ්වකරුවන්ගේ අවධානයට ලක් විය යුතු කරුණකි. එමෙන් ම I ප්‍රශ්න පත්‍රයෙහි සමස්ත පහසුතාව ද 43%කට සීමා වී ඇත. මෙම තොරතුරු ඇසුරෙන් අවධාරණය කෙරෙන්නේ, ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය අනාවරණ පරීක්ෂණ කෙරෙහි යොමුවීමේත් ඉලක්ක ගත ප්‍රතිකාරක වැඩ සටහන් නොපමාව ක්‍රියාත්මක කරනු ලැබීමේත් වැදගත් අවශ්‍යතාවයි.

III කොටස

3.0 පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු හා යෝජනා :

3.1. පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු :

පොදු උපදෙස්

- ★ ප්‍රශ්න පත්‍රයේ ඇති මූලික උපදෙස් කියවා හොඳින් තේරුම් ගත යුතුය. එනම් එක් එක් කොටසින් කොපමණ ප්‍රශ්න සංඛ්‍යාවකට පිළිතුරු සැපයිය යුතු ද, කුමන ප්‍රශ්න අනිවාර්ය ද, කොපමණ කාලයක් ලැබේ ද යන කරුණු පිළිබඳ ව සැලකිලිමත් විය යුතු අතර ප්‍රශ්න හොඳින් කියවා නිරවුල් අවබෝධයක් ඇති කරගෙන ප්‍රශ්න තෝරා ගත යුතුය. එකම ප්‍රශ්නය කොටස් දෙකක් ලෙස එකට ලියැවී ඇති විට, කොටස් දෙකට ම පිළිතුරු සැපයීම කෙරේ අවධානය යොමු විය යුතුය.

- ★ I පත්‍රයේ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී වඩාත් නිවැරදි එක් පිළිතුරක් තෝරා ගත යුතුය. තව ද පැහැදිලිව එම වරණයේ අංකය පමණක් උත්තර පත්‍රයේ යෙදිය යුතුය.

- ★ II පත්‍රයේ (අ) හා (ආ) කොටස්වල ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී සෑම ප්‍රධාන ප්‍රශ්නයක් ම අලුත් පිටුවකින් ආරම්භ කළ යුතුය.

- ★ නිවැරදි හා පැහැදිලි අත් අකුරුවලින් පිළිතුරු ලිවිය යුතුය.

- ★ අයදුම්කරුගේ විභාග අංකය සෑම පිටුවක ම අදාළ ස්ථානයේ ලිවිය යුතුය.

- ★ ප්‍රශ්න අංක හා කොටස් අංක නිවැරදිව ලිවිය යුතුය.

- ★ නිශ්චිත කෙටි පිළිතුරු ලිවීමට අවශ්‍ය අවස්ථාවලදී දීර්ඝ විස්තර ඇතුළත් නො කිරීම මෙන් ම විස්තරාත්මක පිළිතුරු සැපයිය යුතු අවස්ථාවලදී කෙටි පිළිතුරු සැපයීම ද නො කළ යුතුය.

- ★ ප්‍රශ්නය අසා ඇති ආකාරය අනුව තර්කානුකූලව හා විශ්ලේෂණාත්මකව කරුණු ඉදිරිපත් කළ යුතුය.

- ★ පිළිතුරු ලිවීමේදී රතු සහ කොළ පාට පෑන් භාවිත කිරීමෙන් වැළකිය යුතුය.

- ★ ප්‍රශ්නයට අදාළ ලකුණු ප්‍රමාණය හා කාලය අතර පවතින සම්බන්ධය අනුව, කාලය කළමනාකරණය කරගත යුතුය.

- ★ ප්‍රස්තාර ඇඳීමේ දී අන්තඃඛණ්ඩ නිවැරදි ව දැක්විය යුතු අතර, අක්ෂ හා ප්‍රස්තාර රේඛා නම් කිරීම ද ඉතා වැදගත් ය.

- ★ සමීකරණ විසඳීමේ දී පිළිගත් ගණිත මූලධර්ම මත පියවරින් පියවර දැක්වීම වැදගත් ය.

- ★ ඊතල හා වෙනත් සංකේත මගින් අර්ථ නිරූපණය කිරීමේ දී ඒවා අර්ථ කථනය කිරීම ද වැදගත් ය.

විශේෂ උපදෙස් :

* ආර්ථික විද්‍යාව විෂයයේ භාවිත වන පාරිභාෂික යෙදුම් භාවිත කළ යුතුය.
  උදා : ස්වායත්ත පරිභෝජනය

* අවශ්‍ය තැන්හිදී සංඛ්‍යාත්මක වගු, ප්‍රස්තාර, සූත්‍ර හා සමීකරණ මගින් පිළිතුරු පැහැදිලි කළ යුතුය. ප්‍රස්තාර සටහන් ඇඳීමේදී නිවැරදි පරිමාණයකට ඇඳීමටත්, අක්ෂ නිවැරදිව නම් කිරීමටත් සැලකිලිමත් විය යුතුය.

* ගණනය කිරීම්වලදී එක් එක් පියවර පැහැදිලිව සඳහන් කළ යුතුය. අදාළ අවස්ථාවලදී නිවැරදි ව ඒකක සඳහන් කළ යුතුය.

* අවශ්‍ය තැන්හිදී නිවැරදි සංකේත භාවිත කළ යුතුය.

* අදාළ රූප සටහන් අඳින විට, රේඛා නිවැරදිව නම් කිරීම හා ප්‍රවාහවල දිශාව නිවැරදිව දැක්වීම කළ යුතුය.

* ශ්‍රී ලංකාවේ ආර්ථිකයට අදාළ ඉතා වැදගත් සංඛ්‍යා, මෑත කාලීන (පසුගිය වසර 2 ක) දත්ත මතක තබා ගැනීමෙන් පිළිතුරු සැපයීම පහසු කරවයි. ඒ සඳහා පහත දැක්වෙන ක්ෂේත්‍ර වෙත අවධානය යොමු කරන්න.

  - ආර්ථික වෘද්ධි අනුපාතිකය
  - ප්‍රතිශීර්ෂ ආදායම
  - උද්ධමන අනුපාතිකය
  - විරැකියා අනුපාතිකය
  - දරිද්‍රතා දර්ශකය
  - අයවැය හිඟය
  - ගෙවුම් ශේෂ හිඟය
  - රාජ්‍ය ණය අනුපාතය
  - රාජ්‍ය ආයෝජන අනුපාතය
  - රාජ්‍ය අයභාර අනුපාතය.
  - රාජ්‍ය වියදම් අනුපාතය.

* ව්‍යුහගත ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී තාර්කිකව පිළිතුරු සංවිධානය කරගෙන, අසා ඇති ප්‍රශ්නයට ගැලපෙන සේ පිළිතුරු පෙළ ගැස්වීමේ පරිචය ශිෂ්‍යයාට ලබා දීමට පන්ති කාමර ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගත යුතුය.

* ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තාවන්හි විශේෂ සටහන්, (උදා: කුටුම්බ ආදායම් - වියදම් සමීක්ෂණ වාර්තා, ශ්‍රම බලකා සමීක්ෂණ වාර්තා, දරිද්‍රතා තොරතුරු) ආදිය පරිශීලනයට සිසුන් යොමුකරවීම වැදගත් වේ.

ප්‍රස්තාර සඳහා පොදු උපදෙස් :


* දත්තවලට අනුව ප්‍රස්තාර ඇඳීමේදී ප්‍රස්තාර කඩදාසි යොදා ගැනීම ඉතා වැදගත් වේ. ප්‍රස්තාර කඩදාසි භාවිත නොකිරීම නිසා නිවැරදි ව ගණනය කිරීම් කළ නොහැකි වීමෙන් අයදුම්කරුවන්ට ලකුණු අහිමි වන බව උත්තර පත්‍ර පරීක්ෂා කිරීමේ දී පෙනී යයි.

* අක්ෂ නිවැරදිව නම් නොකිරීම හා ප්‍රස්තාර නම් නොකිරීම ලකුණු අඩු වීමට හේතුවකි.
උදා-: නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයේ අක්ෂ නම් කරන විට X හා Y ලෙස පමණක් නම් කර ඇත්නම් ලකුණු දිය නොහැක. එය X භාණ්ඩය හා Y භාණ්ඩය ලෙස සටහන් කළ යුතුය.

* නි.හැ. මායිම් වක්‍ර අඳිනු ලබන විට අක්ෂ දෙක ස්පර්ශ වන පරිදි ඇඳීම ඉතාමත් ම වැදගත් වේ. එසේ නොමැති විට එය නිෂ්පාදන හැකියා මායිමක් නොවේ.


* ප්‍රස්තාර ඇඳීමේ දී අන්තඃඛණ්ඩ නිවැරදිව නම් නොකිරීම ලකුණු අඩු වීමට හේතුවකි.
උදා-: රේඛීය සමීකරණයකට අදාළව සැපයුම් වක්‍ර ඇඳීමේ දී එය ඍණ අන්තඃඛණ්ඩයකින් ආරම්භ වේ නම්, එය ඒ පරිදි ප්‍රස්තාරයේ දැක්විය යුතුය.

උදා-:




සමාහාර වියදම් රේඛාවේ ද, ස්වාධීන වියදම් ප්‍රමාණය ප්‍රස්තාර සටහනේ නිවැරදිව දැක්විය යුතුය.

උදා-:




* සාර්ව ආර්ථික සමතුලිතය පෙන්වීමේ දී ආදායම් හා සමාහාර වියදම් නම් කරන විට අක්ෂ දෙකෙහිදීම දත්ත (ඉලක්කම්) යොදන පරිමාණය සමාන වන පරිදි ලකුණු කර, සම ආදායම් වියදම් රේඛාව ඇඳිය යුතුය. එසේම ස්වායක්ත විචල්‍යය වන ආදායම අනිවාර්යයෙන් ම තිරස් අක්ෂයේ සටහන් කළ යුතුය.

උදා-:



* සාර්ව ආර්ථික සමතුලිතය පෙන්වීමේ දී ගිලිහීම් දැක්වෙන වක්‍රය ඍණ අන්තඃඛණ්ඩයකින් ආරම්භ වේ නම්, එය නිවැරදිව දැක්විය යුතුය.

උදා-:



3.2. ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ අදහස් හා යෝජනා :

* සංකල්ප පිළිබඳ ව නිවැරදි හා නිශ්චිත දැනුම තිබිය යුතු අතර, සංකල්ප පිළිබඳ ප්‍රායෝගික භාවිත ප්‍රගුණ කළ යුතුය.

* ආර්ථික හා සමාජයීය කරුණුවල කාලීනව හටගන්නා වෙනස්වීම් හා ප්‍රවණතා පිළිබඳ ව සතුටුදායක අවබෝධයක් ලබා ගත යුතුය.

* මේ සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව, ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය වැනි ආයතනවලින් නිකුත් කෙරෙන වාර්තා හා ප්‍රකාශන පරිශීලනය කිරීමට හුරුවිය යුතුය. එමඟින් තම දැනුම යාවත්කාලීන කර ගත යුතුය.